**<u>2025.12.09 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේදී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025 දෙසැම්බර් මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>**

සහභාගිත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
11. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී
12. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
13. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
14. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
15. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
16. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
17. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
18. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
19. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
20. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
21. බී. සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
22. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

සහභාගී නොවූ :-

1. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් 21 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

<u>ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරු, ප්‍රාදේශීය සභා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**1.** <u>**පසුගිය සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම**</u> **:-**

1.1. 2025.11.18 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවට අදාළ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

<u>**සංශෝධන අංක 01 - ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන**</u>
2025.11.18 වන දින පැවති මාසික මහ සභා රැස්වීමේ පිටු අංක 56 හි 8.3 යටතට,
<u>**"ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා**</u>
පසුගිය දින ඉදුරුව පැවති ආයුර්වේද වෛද්‍ය සායනයට මම සහභාගී වුණා. ඉතාම හොඳ වැඩසටහනක්. එහි දී ප්‍රජා ආයුර්වේද වෛද්‍ය නිලධාරී විමුක්ති මහතා මුණ ගැහුණා. ඉතාම හොඳ වෛද්‍යවරයෙක්" යන්න ඇතුලත් කර සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>**සංශෝධන අංක 02 - ගරු මන්ත්‍රී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරන සංශෝධන**</u>
2025.11.18 වන දින පැවති මාසික මහ සභා රැස්වීමේ පිටු අංක 56 හි ගරු මන්ත්‍රී ඉන්දික සේරසිංහ මැතිතුමාගේ කථාවේ අවසානයට "යාත්‍රාමුල්ල කොට්ඨාසයේ ලයිට් දානකොට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරනවා" යන්න ඇතුලත් කර සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශන්ති මැතිතුමිය විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2025.11.18 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව සහා සම්මත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**2.** <u>**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන**</u> **:-**

2.1. මගේ අංක 4/05/01 හා 2025.12.03 දිනැති ලිපිය මඟින් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්තුමිය විසින් ලිඛිතව දන්වා තියෙනවා 2025.05.31 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනවල සඳහන් පළාත් පාලන ආයතනවල සභිකයින්ගේ ධූර කාලය 2025.02.17 දිනැති ගැසට් පත්‍රය අනුව 2025 ජූනි මස 02 වැනි දින සිට ආරම්භ වන බවටත්, 2025.06.02 දිනෙන් පසුව ගැසට් නිවේදනවල නම් සඳහන් පළාත් පාලන ආයතනවලට අදාළව, තෝරා එවන ලද සභිකයින්ගේ ධූර කාලය ආරම්භක දිනය අදාළ එක් එක් සභිකයා අදාළ පළාත් පාලන ආයතනයේ සභිකයෙකු ලෙස දිවුරුම් දුන් දිනය වන බවටත්.

2.2. මගේ අංක 4/05/06 හා 2025.11.27 දිනැති ලිපිය මඟින් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්තුමිය විසින් ලිඛිතව දන්වා තියෙනවා 2026.03.31 දින සිට වත්කම් හා බැරකම් ප්‍රකාශ සිදු කිරීමට නියමිත මධ්‍යගත ඉලෙක්ටොනික පද්ධතිය, ප්‍රකාශයන් සඳහා විවෘත වන බවත් ඉන් අනතුරුව අතින් වත්කම් බැරකම් ප්‍රකාශ සිදු කිරීම අවශ්‍ය නොවන බවටත්, 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 80(1) වගන්තිය ප්‍රකාරව, එහි සඳහන් පනත්වලින් හෝ විස්තරවලින් කවරකට හෝ අයත් වන සෑම තැනැත්තෙකුම සිය වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු බවටත් පනතේ 82(1) වගන්තිය ප්‍රකාරව පළමු පත්වීමේ ප්‍රකාශය, වාර්ෂික ප්‍රකාශය, ධූර කාලය අවසානයේ හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන

ප්‍රකාශය, පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය, තත්කාර්ය ප්‍රකාශය සහ මැතිවරණ ප්‍රකාශය ආදිය නියමිත දිනට නියමිත ආකෘතියෙන් සිදු කළ යුතු බවටත්.

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-**

3.1. මගේ අංක GDI/DEV5/05/2025 හා 2025.11.19 දිනැතිව ගාල්ල දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු විසින් "ඕඩක්කර ඇළ පවිත්‍ර කර ජල ගමනට ඇති වී ඇති බාධා ඉවත් කිරීම" මැයෙන් යුතුව එම ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණ කටයුතු බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු වන බවටත් එහි අධීක්ෂණ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බවටත් දන්වා තිබෙන ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

3.2. මගේ අංක 07/05/01 හා 2025.12.05 දිනැතිව දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් "දකුණු පළාතේ පළාත් පාලන ආයතන මඟින් ආපදා හානියට පත් දිස්ත්‍රික්කවල සහන සේවා සැපයීම හා ස්වකීය හානි පුනරුත්ථාපනය" මැයෙන් යුතුව බල ප්‍රදේශය තුළ හා ඉන් පිටත සිදු වූ හානි සඳහා සහන සේවා සැපයීම සඳහා එක් සභාවකට රු. මිලියනයක මුදලක් ලබා දෙන බවටත් ඒ සඳහා කරනු ලබන වියදම් අදාළ මුදල් රෙගුලාසි, පළාත් සභා මුදල් රීති උපදෙස් වලට අනුකූලව දැරිය යුතු බවටත්, එම වියදම් දරා ඇති ආකාරය පිළිබඳ සාරාංශයක් දෙසැම්බර් 15 දිනට පෙර ලබා දෙන ලෙසටත් දන්වා තිබෙන ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

3.3. 2025.11.21 දිනැතිව ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය විසින් "ඌරගහ ප්‍රාදේශීය සභා පෙර පාසලේ ගැටලු වාර්තා කිරීම" මැයෙන් යුතුව එහි පවතින ගැටලු සඳහන් කර ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

3.4. 2025.11.24 දිනැතිව ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය විසින් "ඌරගහ මහජන පුස්තකාලය පිළිබඳ වාර්තා කිරීම" මැයෙන් පුස්තකාලය පවත්වාගෙන යාමට ඇති ගැටලු සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-**

**4.1. ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න :-**

4.1.1. E - සභා ඇප් එක සක්‍රියව පවතී ද?
සක්‍රියව පවතී.

4.1.2. එසේ නම් ඒ සඳහා නිලධාරීන් කී දෙනෙක් අනුයුක්ත කර ඇත් ද?
එක් නිලධාරියෙක් අනුයුක්ත කර ඇත.

4.1.3. E - සභා ඇප් එක තව පුළුල් ලෙස ප්‍රචලිත කරමින් ජනතාවට සේවයක් ලබා දීමට බලාපොරොත්තු වන්නේ ද?
ඉදිරියේ දී මෙම සේවාව පුළුල් කිරීමට අදහස් කරමි.

**5. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u> :-**

**5.1. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-</u>**

5.1.1. 2026 වර්ෂයේ අයවැය සම්මත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

2026 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත ගියවර සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. පුරා මාසයක කාලයක් අයවැය සම්බන්ධ සංශෝධන, යෝජනා, වෙනස් කිරීම් තිබේ නම් ලබා දෙන ලෙස ඔබෙන් ඉල්ලීමක් සිදු කළා. නමුත් කිසිදු මන්ත්‍රීවරයෙක් යෝජනා හෝ සංශෝධන ලබා නොදුන් බැවින් කෙටුම්පතේ ආකාරයටම අයවැය ඉදිරිපත් කරනු ලැබුවා. මාස 06 ක වගේ කාලයක් තමයි අපි සභාවට පත්වෙලා දැනට. ඒ කාලය තුළ තිබුණේ කොමසාරිස්තුමියගේ පාලන කාලය තුළ සකස් කරන ලද අයවැයක්. මේ වන විට එහි බොහෝ කාරණා අවසන් කර තිබෙනවා. නමුත් අවසන් නොකළ කාරණා ද තිබෙනවා. අපි සකස් නොකළ අයවැයක් නිසා මම ඒ සම්බන්ධව අදහස් දක්වන්නේ නැ. 2026 අයවැය වාර්තාව සකස් කරනකොට මම උපදෙස් ලබා දුන්න ආකාරයට වගේම අදාළ විෂය නිලධාරිනිය මගෙන් ඉල්ලගත්ත කාරණා වගේම දීර්ඝ කාලයක් අයවැය සකස් කරලා ඒ ලැබු අත්දැකීම් සමඟ අපේ සභාවේ ඉතිහාසයේ සිට ලැබෙන ආදායම්, හිඟ ආදායම්, ඒ වගේම අපි ඉදිරියට කරන්න බලාපොරොත්තු වෙන වැඩසටහන් ඇතුළත් කළා. ශීර්ෂ 06 ක් යටතේ අපි වියදම් කරන ආකාරය පිළිබඳ අයවැය ඉදිරිපත් කරලා තියෙන්නේ. සාරාංශයක් විදියට ලක්ෂ 1,687 ක් තමයි සභාවේ සමස්ථ අපේක්ෂිත අය සඳහා දාලා තියෙන්නේ. රු. 2,987/- ක වගේ ඌනතාවයක් තමයි පෙන්නුම් කරන්නේ. අයවැය සකස් කිරීමේ දී මම උත්සහ කළා අවම ලැබීම් සංඛ්‍යාවක් මේකට ඇතුළත් කරන්න. අපිට ආදායමක් නිශ්චිතව පේන්නේ නැති මුදලක් දාලා ජනතාවට බලාපොරොත්තු දුන්නොත් පෙරලා ඒ මුදල නොලැබුණොත් ඔබ ප්‍රශ්න නඟන්න පුළුවන් මේ තරම් ආදායමක් උත්පාදනය කරනවා කිව්වා. නමුත් ඒවා උත්පාදනය වුණාද ඒ මුදල් ලැබුණ ද, ඒ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ග මොනවා ද ලෙස ප්‍රශ්න කරන්න පුළුවන්. සභාපතිවරයා විදියට මම විශ්වාස කරනවා ලබන අවුරුද්දේ යෝජනා කරන, මේ වන විට යෝජනා කරලා අනුමත කරවාගෙන තිබෙන, ඉදිරියේ දී යෝජනා කරලා අනුමත කරගන්නා වූ කාර්යයන් බොහොමයක් ආදායම් උත්පාදනය වෙනුවෙන් තමයි ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ. ලබන වර්ෂය අවසානයේ දී යෝජිත ලක්ෂ 1,687/- ක ආදායම අවම ලක්ෂ 2,000/- ක් බවට පත් කරගන්න හැකියාව තිබෙන බවට සභාපතිවරයා හැටියට මට විශ්වාසයක් තිබෙනවා. ආදාහනාගාරය අසල ඇති භූමියේ මෘත දේහ තැන්පත් කර තැබිය හැකි ස්ථානයක් (පාලර් එකක්) සකස් කරන්න බලාපොරොත්තු වෙනවා ඒ සඳහා වන වියදම් අපට ලැබුණොත්. මේ වන විට මම පළාත් පාලන ආයතන සඳහා ණය දෙන ආයතන සමඟ කතා කරලා තියෙනවා. ඒ වගේම පළාත් පාලන කොමසාරිස්තුමියට ලබන වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ලැබෙන ප්‍රතිපාදන සඳහා මම මේක බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පළමු යෝජනාව ලෙස සභාපතිවරයා ලෙස මේ වෙනකොට ලබලා දීලා තියෙනවා. කොහොම වුණත් පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ හෝ අපේ මුද්දර ගාස්තු, වරිපනම්වල වැඩිවීමක් තුළින් නිශ්චිත ආදායමට වඩා වැඩි ආදායමක් ලැබුණොත් ඒ මුදලින් කරනවා. එසේ නොහැකි වුණොත් අපි අවුරුද්ද අවසානයේ හෝ පළාත් පාලන ආයතන සඳහා ණය දෙන ආයතනත් එක්ක කතා කරලා මේ සඳහා ප්‍රතිපාදන අරගෙන ඒක ඉටු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් විශාල ආදායමක් උත්පාදනය කරගන්න ලැබෙයැයි මම විශ්වාස කරනවා. ඒ වගේම නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සිදුකළ සාකච්ඡාවන් වලට අනුව එම ආයතනය අපට පවරා දී ඇති බෙන්තොට පාලම් දෙක අතර

කොටසේ අපට අවසර ලබා දුන්නා අදාළ ඉදිකිරීම් තාවකාලික විදියට කඩ කාමර 03 ක් ලෙස මුලින් ආරම්භ කරලා ඒකේ ප්‍රගතිය අනුව ඉන් ඉදිරියට අවශ්‍ය ලියකියවිලි කටයුතු සිදු කරන්න කියලා. අපි බලාපොරොත්තු වෙන්නේ ඉදිකිරීම් සඳහා අඩු වියදමක් සිදු කර වර්ෂ අවසානය වන විට සභාවක් විදියට දීර්ඝ කාලීනව ආදායම් ලැබෙන වැඩසටහනක් විදියට එතන කඩ 03 ක් විදියට ක්‍රියාත්මක කරන්න. ඒ වගේම මේ ප්‍රදේශයේ ක්‍රිකට් වැනි ක්‍රීඩා තරඟ, උත්සව ආදිය පවත්වන්න බිම් කඩක් නෑ. අපේ පිට්ටනිය සංගීත සංදර්ශන සඳහා පමණයි බොහෝ විට භාවිත කරන්නේ. ඒ නිසා අපි ඒ පිට්ටනියේ ලබන ජනවාරී අවසන් වීමට පෙර ක්‍රිකට්, වොලිබෝල් ආදී ක්‍රීඩා කිරීමට හැකි වන ලෙස සකස් කරලා බදු දීමට බලාපොරොත්තු වෙනවා. මේ වගේ වැඩසටහන් ඉදිරියට කරන්න බලාපොරොත්තු වෙනවා වගේම අපේ ක්‍රීඩා පිටිය ඕනම ආකාරයක සංදර්ශන සඳහා ක්‍රීඩා තරඟ සඳහා බදු දෙන්න අපි බලාපොරත්තු වෙනවා. අපි විශ්වාස කරනවා ලබන වසරේ අයවැය හදනකොට අපට මේ හරහා හොඳ ආදායමක් අපිට ආදායම් ශීර්ෂයට එකතු කරන්න පුළුවන් වෙයි කියලා.ඒ වගේම ඊට අමතරව අපි බලාපොරොත්තු වෙනවා අපිට තට්ටු දෙකක ගොඩනැඟිල්ලක් තියෙනවා උඩ තට්ටුවේ ස්ලැබ් එකක් තියෙන්නේ. පහුගිය දවස්වල අපි එතන තියෙන කඩ කාමර ටෙන්ඩර් කරා. ලක්ෂ 20 ක පමණ මුදලක් අපි ඒ හරහා හොයා ගත්තා එක්වන් මුදල වශයෙන්. අපිට හැකියාව තියෙනවා පුස්තකාලයට උඩින් දෙවන තට්ටුව ලබන අවුරුද්දෙ නිර්මාණය කරලා අතිරේක පන්ති පවත්වන අයට හෝ ඕනෑම ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලබා දීලා ඒ තුළින් 2027 අයවැයට ප්‍රතිපාදන එකතු කරන්නත් මේ වෙලාවේ අපි උත්සහ කරනවා. මීට අමතරව තව තවත් බොහොමයක් ආදායම් උත්පාදන කළ හැකි යෝජනා ඉදිරිපත් කරලා ඒ හරහා ලබන වසරේ මීට වඩා හොඳ අයවැයක් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මීට අමතරව සමස්ථයක් විදියට මේ බල ප්‍රදේශයේ ජනතාවට වගේම පුස්තකාල, පෙර පාසල් වල සුබ විහරණය වෙනුවෙන් මාර්ග, විදුලිය ඇතුළු සියලු කටයුතු ඉටුකරන්නට අයවැයෙන් ඉදිරියට අපිට හැකිවෙයි කියන බලාපොරොත්තුව ඇතිව සභාපතිවරයා විදියට අයවැය කෙටියෙන් ඉදිරිපත් කරනු ලැබුවා. ඔබට අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාව තියෙනවා.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

මම මුලින්ම ප්‍රාර්ථනා කරනවා ඔබතුමාගේ ඉලක්කය ලබන වසරේ ලක්ෂ 2000 ක් අභිබවා යන්න අයවැයක් ඉදිරිපත් කරන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා. මේ අයවැය සම්බන්ධයෙන් මූලික කාරණා ටිකක් තියෙනවා ඉදිරිපත් කරන්න. මේ අයවැය දිහා බැලුවම අපි බලාපොරොත්තු වන පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන තේමා පාඨයට බෙන්තොට බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඒ ඉලක්කයට අරගෙන යන්න පුළුවන් ද කියන එක මට තේරෙන්නේ නෑ. මම විශ්වාස කරන්නේ නෑ. මේකේ සමස්ථ ආදායම ඔබතුමා විග්‍රහ කරා ලක්ෂ 1687 ක්. අපි විශ්වාස කරනවා මේක මීට වැඩිය එහා ගිය ආදායමක් උත්පාදනය කරන්න පුළුවන් සභාවක්. ඔබතුමා සඳහන් කළ විදියට අපි එක සීමාවක විතරයි තාම කටයුතු කරන්නේ. නමුත් බෙන්තර ගත්තට පස්සේ සංචාරක කර්මාන්තයේ ඉහළ ආදායම් ලබන කර්මාන්ත රැසක් මේකේ තියෙනවා. නමුත් මේ සභාවට කවදාවත් පහුගිය සභා වාරයේවත් නඩුව සම්බන්ධව. අපිට ආරංචි වුණා ඒකේ ප්‍රතිඵලය අපිට ඒ තරම් සතුටුදායක ප්‍රතිඵලයක් නොවන වග. ගරු සභාවට ඒකේ සත්‍ය කාරණා ඉදිරිපත් කරන්න ඕනේ. බලපිටිය ප්‍රාදේශීය සභාවට අයත් හෝටල් මේ වන විට එම නඩුවෙන් ඉවත් වෙලා එම ලැබිය යුතු මුදල ගෙවන්න මේ වන විට එකඟ වෙලා තියෙනවා. දැවැන්ත ආදායම් උත්පාදනය කරන වැඩසටහන් වලට ඒ සභාව ගිහිල්ලා තියෙනවා. දැන් අපි එතනට යන්න සමත් ද? මේකේ සංඛ්‍යා ටික බැලුවට පස්සේ විෂය නිලධාරීතුමියගේ දක්ෂතාවයෙන් මේක යන්තන් බැලන්ස් කරගෙන කාලා බීලා ඉන්න පුළුවන් විදියට වැඩේ ගොඩදාලා තියෙනවා. මධ්‍යම රජයේ ප්‍රාග්ධන ආදායම ආවේ නැත්තන් අපේ සභාවට යන තත්ත්වය මොකක් ද? මේ රට සංවර්ධනය කරා රැගෙන යනකොට අපි බලාපොරොත්තු වන ලස්සන ජීවිතය මිනිස්සුන්ට ලබා දෙන්න නම්. ඔබතුමාලගේ යම් කැපකිරීමක් තියෙනවා. ඒක අපි දැක්කා ආපදා තත්ත්වය හමුවේ ඔබතුමා ඇතුළු කණ්ඩායමක් ගිහිල්ලා හිටියා. අපේ

කණ්ඩායමක් තවමත් එහි වැඩ කරනවා. අද රාත්‍රියේ නැවත තව කණ්ඩායමක් පිටත් වීමට නියමිතයි බෙන්තරින්. එතුමාගේ ඒ සමාජය වෙනුවෙන් කැපවෙන්න තියෙන ඒ උවමනාව අපි එහි දී දැක්කා. බොහොම ස්තූතිවන්ත වෙනවා ඒ කරපු දේ වෙනුවෙන්. නමුත් මේකෙ දී තවත් අපි වැඩ කටයුතු කරන්න ඕනේ. ඔබතුමා ගිය සභා වාරයේ සඳහන් කරා 20%ක් වැටුප් සභාවෙන් ගෙවන්න වෙනවා කියන එක. ඒක අපිට විතරක් අදාළ දෙයක් නෙවෙයි. අවසානයේ ලබන වසරේ මිලියන 36 ක් අපි ආදායම උපයන්න ඕනේ වැටුප් සඳහා. මේක කරන්න වැඩපිළිවෙළක් අවශ්‍යයි. ඒ වගේම අපි යෝජනා කරලා තියෙනවා කසල කියන්නේ සභාවේ සම්පතක්. නමුත් හෝටල්වල කසල බැහැර කරනවා වෙනත් පෞද්ගලික ආයතනවලට. ඔබතුමාගේ බලය පාවිච්චි කරලා නැවත ඒවා සභාවට ලබා ගන්න. එවිට ලක්ෂ 2000 ට එහා ගිය ආදායමක් ලබා ගන්න අපිට හැකිවෙයි. මම මේ යෝජනාව සඳහා හෙදීමක් ඉල්ලා සිටිනවා. මොකද මේ හරහා සභාවේ අනාගතය ගොඩදාන්න බැහැ. යන්තම් ශේප් එකේ යන්න පුළුවන් පමණයි. මංමාවත් පිළිසකර කරන්න ඕනේ. මේවා සංවර්ධනය කරා අරගෙන යන්න ඕනේ. ඒ සඳහා වන වැඩපිළිවෙළක් මේකේ ඇතුළේ නෑ කියන එකයි මගේ අදහස. ඒ නිසා තව දුරටත් මේකේ විග්‍රහයක් රංජිත් ප්‍රනාන්දු මැතිතුමා ඉදිරිපත් කරාවි. මේක මීට වඩා එහා ගිය සංවර්ධනාත්මක අයවැයක් ඉදිරිපත් කරන්න තිබුණු අවස්ථාවක්. මොකද රජයට බොරු කරන්නත් බෑ. සභාපතිතුමා ගිය සභා වාරයේ කිව්වා 20%ක් වැටුප් ගෙවන්න සිදු වෙනවා කියලා. මතක් කරලා බලන්න ඔබතුමාලා ප්‍රවෘත්ති සාකච්ඡාවක් කළා ඡන්දය අවසන් වෙච්ච ගමන්. ඔබතුමන්ලගේ නායකයෙක් ප්‍රසිද්ධ මාධ්‍යයේ ප්‍රකාශ කළා මේක අති දැවැන්ත ආදායමක් ලබනවා. මම දන්නවා මම මේකේ හිටපු සභාපතිවරයෙක් විදියට. කෝටි 10 ක ආදායමක් ලබනවා මේක. රජයේ නිසිම සහයෝගයක් නැතිව කරගෙන යන්න පුළුවන් කියලා. නමුත් අපි විශ්වාස කරනවා මේ 80% නැති වුණත් මේකේ තියෙන ආදායම උත්පාදනය කර ගත්තොත් අපි වැඩ කටයුතු කරෝතින් සහයෝගයෙන් මීට එහා ගිය දැවැන්ත සංවර්ධනයක් කරා මේක රැගෙන යන්න පුළුවන් කියන විශ්වාසය සහ බලාපොරොත්තුව අපට තියෙනවා. ඔබතුමාගේ කථාවෙ දී සංචාරක බල මණ්ඩලය ගැන වචනයක්වත් සඳහන් වුණේ නෑ. බලපිටිය ප්‍රාදේශීය සභාව ගලිවලින් විතරක් මාසෙට ලක්ෂ 20 ක් උපයනවා. ගිය මාසේ ඒ මුදල ඉපැයුවා. අපිටත් ඒ කරා යන්න පුළුවන්. ඒ නිසා එවැනි අවස්ථා තියෙද්දි ඇයි මේ අපි පොඩි පොඩි දේවල්වලින් ආදායම උත්පාදනය කරන්න උත්සහ කරන්නේ. මම මේකට බෙදීමක් අපේක්ෂා කරනවා.

<u>ගරු මන්ත්‍රිනි, ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>

මේ සභාවේ 2026 අයවැය සම්බන්ධයෙන් යම් අදහසක් දැක්වුවානම් මම ඇත්තටම දකින්නේ මේ වෙලාවේ එක් කුහක අදහස් ප්‍රකාශ කිරීමක්. හේතුව මොකද මේක මෙතුමන්ලගේ විදියට මේ අයවැය සම්බන්ධව සතුටු විය නොහැකියි කිව්වට පොදුවේ සමස්ථ විදියට බැලුවොත් ඇත්තටම දීර්ඝ කාලයක් වශයෙන් පෙර පාසල්, පරිසරය සෑම දේකටම පොදුවේ ගත්තොත් ඒ මුදල් සභාපතිතුමා වෙන් කරලා තියෙනවා සංවර්ධන කටයුතු කිරීම සඳහා වගේම ප්‍රදේශයේ ජනතාවට සහනයක් ලබා දීමට අපේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය පහුගිය ආපදා තත්ත්වය ගැන බැලුවොත් ගංවතුර ගලපු ප්‍රදේශවලට සත්කාරක කටයුතු සඳහා පිටත් වෙන්න පෙර මේ ප්‍රදේශයේ ඇතිවෙච්ච බෙන්තර ඉඳුරුව පහලගම්භය ප්‍රදේශයේ සියලුම ආපදා කටයුතුවල දී සභාවක් හැටියට පාන්දර 4, 5 වගේ ඉඳගෙන සභාපතිතුමා ඇතුළු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයම සහ විශේෂයෙන්ම කාර්ය මණ්ඩලය සහ සේවක මහතුන් දැවැන්ත සේවයක යෙදී සිටියා. ජනතාව වෙනුවෙන් ඒ මංමාවත් පිරිසිදු කරන්න ඒ වගේම විශේෂයෙන් සඳහන් කරන්න ඕනේ ගරු තාරක මන්ත්‍රීතුමා. එතුමා පෞද්ගලිකව සභාවේ පහසුකම් නැතුව බැකෝ යන්ත්‍ර නැතිව සමහර යන්ත්‍ර උපකරණ නැතුව ඒ වෙලාවේ සභාපතිතුමාගේ දැනුම් දීමට සියලු දෙනා එකා ලෙස එකතු වෙලා ඒ දැවැන්ත දේවල් කරා බෙන්තර ප්‍රාදේශීය සභාව හැටියට. ඒ වගේම අපි දැක්කා මේකේ පෙර පාසල් නඩත්තු කටයුතු පරිසරය ආදී වෙනත් සෑම දේවල්වලට ඒ මුදල් වෙන් කරලා ඒ ලැබෙන ආදායම ගැන බැලුවොත් මෙතුමා කිව්වා සංචාරක කර්මාන්තයේ හෝටල්වලින් එන ආදායම ගැන ඔබතුමා මේකේ සඳහන් කරලා නැහැයි කියලා හැබැයි මම නම් දකිනවා මීට සභා වාර දෙකකට ඉස්සෙල්ලා ගරු සභාපතිතුමා සභාවේ යෝජනාවක්

ඉදිරිපත් කළා මේකේ අපේ නඩුව දිගටම යනවා. හැබැයි මේ නඩුව දිගින් දිගටම ගියොත් අපිට මේකේ දිනුම් වාරයක් නෑ. අපි මේක සාකච්ඡා කරලා සැමගේ එකඟතාවයකට ඇවිල්ලා අපි බදු ප්‍රමාණය අඩු කිරීමක් කරලා අපි එකඟතාවයකට යමුයි කියලා. ඒ වෙලාවේ ඔබතුමාලා තමයි මේ සභාවේ යෝජනාවක් කළේ මෙහෙම යන්න එපා. වැරදි පූර්වාදර්ශයක් වේවි. අපි මේ නඩුවට යමු. එහෙම යන්න එපා සමස්ථයක් විදිහට. ඒ වෙලාවේ බෙදීමකටත් යන්න ලෑස්ති වුණා. පසුව එකඟතාවයකට ආවා. සාකච්ඡා කරලා විසඳගමු කියලා. එතකොට මම හිතන්නේ ගරු සභාපතිතුමාගේ ඒක ගැන සැලැස්මක් නෑ කියන එක මම තරයේ ප්‍රතික්ෂේප කරනවා. මොකද අපි දන්නවා එතුමා දන්නවා මේ නඩුවලින් නඩු වාර 8 කින් 6 ක්ම අපි පරාදයි කියන එක. එතකොට එතුමා මේ වෙනකොට මම හිතන්නේ ඔය සංචාරක හෝටල් සංගමය සමඟ කතා කරලා තියෙනවා මේකෙදී අපිට යන්න පුළුවන් එකඟතාවය කුමක් ද ඒක සභාවක් හැටියට අපිට ගන්න පුළුවන් ප්‍රතිඵල මොනවද කියන එතුමා ඒකට මේ සියලු සාකච්ඡා මට්ටමින් අරගෙන ගිහිල්ලා ගොනු කරලා තමයි මේ ඉතා වටිනා කියන හොඳ අයවැයක් 2026 වර්ෂයට ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒ හින්දා මොන අදහස් ප්‍රකාශ කළත් ඔබතුමා ඔබතුමාගේ උත්සහය මත අරන් ගිහින් තියෙන මේ 2026 සමස්ථ අයවැයේ වැඩකටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කරන්න ගරු සභාපතිතුමාට සමස්ථ අපේ මන්ත්‍රී මණ්ඩලයේ පූර්ණ සහයෝගය සහ දැවැන්ත ශක්තියක් ලබා දෙනවා. මේ 2026 අයවැය සාක්ෂාත් කර ගන්න ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා මං ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු මන්ත්‍රී, රංජිත් ප්‍රනාන්දු මැතිතුමා</u>

මේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් දුන්න ෆෝම්. ඉලක්කම් දාලා පුරවන්න තියෙන. අයවැය කියන්නේ මෙහෙම නෙවෙයි. තාර්කික වෙන්න ඕනේ. ආදායම් උත්පාදිත මාර්ග පිළිබඳ සැලකිලිමත් වෙන් ඕනේ. ඒවට අවශ්‍ය උපාය මාර්ග පිළිබඳ සාකච්ඡා කරන්න ඕනේ. මිලියන 36 ක් සභාවේ වැටුප් සඳහා වැය වෙනවා. මේ මුදල උත්පාදනය කර ගන්න ක්‍රමයක් අවශ්‍යයි. ඒකට අවශ්‍ය උපාය හා උපාය මාර්ග අනුගමනය කරන්න අනිත් අයගේ සහයෝගයත් අවශ්‍ය වෙනවා.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

2026 වර්ෂය මුල් කරගෙන ප්‍රාදේශීය සභාවේ ඔබතුමාගේ නායකත්වයෙන් යුතුව ඉදිරිපත් කරනු ලබන අයවැය මං හිත්තනෝ විවිධාකාරයේ විවේචන වගේම අදහස් ලබා දුන්නා. ඇත්ත වශයෙන්ම ඉතාමත් අපි මේ අයවැය ගත්තාම සාධාරණව බැලන්ස් කරපු අයවැයක් අපිට දකින්න පුළුවන්. ඇත්තටම මේකෙ දී රංජිත් ප්‍රනාන්දු මැතිතුමා බොහෝ විවේචන ඉදිරිපත් කළා ඔබතුමා ඒවට පිළිතුරු ලබා දුන්නා. ඇත්තෙන්ම මම කියන්න කැමතියි අපේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඇත්තටම විවේචකයාට අවස්ථාව තියෙනවා මොකක් හරි දේක කොහේහරි අඩුපාඩුවක් වුණා නම් අර සභාපතිතුමා කිව්වා වගේ කෙටුම්පත ලබා දීලා මාසයකටත් වැඩි කාලයක් වෙනවා. නමුත් කිසිම යෝජනාවක් මේකේ සංශෝධනයක් සම්බන්ධව ලබා දුන්නේ නෑ. ඒ වගේම තමයි මේ සභාවේ මන්ත්‍රීවරු 23 දෙනාම හැමදාම කතා කරනවා වගේ එකට ඉන්න එක මන්ත්‍රීවරු. පක්ෂ විපක්ෂ භේදයක් නෑ කියලා. ඉතිං මම දකිනවා පහුගිය මාස කිහිපය පුරාවටම අද විවේචනය කරන මන්ත්‍රීවරු කිසිම කෙනෙක් මේ සභාවේ ආදායම් උත්පාදනය වෙනුවෙන් කිසිම ආකාරයක දායකත්වයක් දැක්වුවේ නෑ. ඉතිං ඒ වගේම තමයි මෙතුමා කිව්වා හරියටම අය ලබා දෙන්න කියලා. ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි ඔබතුමත් මූල්‍ය ක්ෂේත්‍රයේ සේවය කරපු කෙනෙක්. ඉතිං ඇත්තටම ඔබතුමා දන්නවා අපි දෙයක් අයකර ගැනීමක දී ඒක අඩමානව තියනවා. අපිට කිසිම වෙලාවක වාර්ෂික අයවැයක හරිම මුදල මෙන්න මෙච්චරයි කියලා කියන්න බෑ ඒක අපිට ටාගට් කරන්න විතරයි පුළුවන්. අපිට කියන්න බෑ මේ අවුරුද්දේ මේ මුදල නිශ්චිතවම ලැබෙනවා කියලා. දැන් ඔබතුමාම හිතලා බලන්න අපි පහුගිය කාලේ ඔබතුමන්ලා අපි හැමෝම ගිහිල්ලා ගම්පොළ හිටියා. ගම්පොළ නගර සභාවේ ආදායම පසුගිය වසරේ අයවැයෙන් මෙන්න මේච්චරයි කියලා අද වෙද්දි කොහොමද බලන්නේ. එහෙම කරන්න බෑ. නිවැරදිව මේ අයවැය ලබා ගන්න බෑ. ඉතිං ඒ වගේ ප්‍රශ්න වෙන්න පුළුවන්. මේ අයවැය සභාපතිතුමා

ඉදිරිපත් කරලා තියෙන්නේ මෙන්න මේ වර්ෂය සඳහා අපිට ලැබිය යුතු ආදායමක් ලබා ගන්න බලාපොරෙත්තු වෙනවා. අපි ඒ අදායම ලබා ගෙන අපි එතනින් එහාට කරන්නේ මොකක් ද කියන එක මේ අයවැය හරහා ඉදිරිපත් කරලා තියෙනවා. ඒ වගේම තමයි විශේෂයෙන්ම අපි මේ වසර පුරාවටම අපිට අහිමි වෙච්ච මුදල් අපේ කොඩිතුවක්කු මන්ත්‍රීතුමා කතා කළා වගේම හෝටල් සංගම් සමඟ කීප වතාවක්ම අපි සාකච්ඡා කළා. ඔබතුමාලා බෙදීමක් බලාපොරොත්තු වුණා. කොයි වෙලාවෙත් අපි බැලුවේ කණ්ඩායමක් විදියට රැස් වුණත් සභාව විදියට රැස් වුණත් අපිට අහිමි මුද ලබා ගන්න. ඒකට නීත්‍යානුකූල පසුබිම සභාපතිතුමා බොහෝ වෙලාවට පළාත් පාලන කොමසාරිස්තුමියගෙන් පළාතේ විගණන අධිකාරීගෙන් ඒ හැම දෙනාගෙන්ම නීතිමය ප්‍රශ්න ඒ සියල්ල සාකච්ඡා කළා. ඇත්තටම අපේ මේ ප්‍රාදේශීය සභාව තුළ කොඩිතුවක්කු මන්ත්‍රීතුමා කිව්වා වගේ විශාල මුදල් සම්භාරයක් එකතු කරන්න පුළුවන් කියලා අපිට පේනවා. ඒ නමුත් පසුගිය නීතිමය කාරණා සමඟ සමහර ගැටලු තියෙනවා. ඒවා විසඳගෙන අපි යන්න හදන තැනට යන්න පුළුවන් වුණොත් අපි බලාපොරොත්තු වන අයට වඩා විශාල අයක් ලබා ගන්න පුළුවන්. අපි හැමෝම මේ බෙන්තර මිනිස්සු. බෙන්තර ගොඩනඟන්න අපි කැපවෙලා ඉන්නේ. ඉතිං අපි 23 දෙනාම එකතු වෙලා මේ සභාවට මින් ඉදිරියටත් ඔබතුමාලා බෙදීමක් ඉදිරිපත් කරලා තියෙනවා. බෙදීඹ එසේ තිබියදී මේ ඉදිරි වර්ෂය පුරාවටම මේ අයවැය සාර්ථක කර ගන්නවා සේම මීටත් වඩා ප්‍රාග්ධන වියදමට වඩා අපිට ඉතුරු වෙන්නේ ලක්ෂ 54 ක වගේ ප්‍රමාණයක්. ඇත්තටම අපි බලාපොරොත්තු වෙන්නේ මේ ලක්ෂ 54 න් ඡන්දෙ ඉල්ලන්න නෙවෙයි. අපිට ඕනේ අවම වශයෙන් මේක මිලියන 15 කට යන්න. මිලියන 20 කට යන්න. ඔබතුමා දත්ත විදියට ඉදිරිපත් කරන එක හරි. එනත ප්‍රායෝගික ගැටලුවකුත් තියෙනවා. මේ භූමියේ ගැටලුවක් තියෙනවා. නීතිමය කාරණා බලපාලා තියෙනවා මේ සභාවේ ආදායමට. අපිට තියෙන විශාලම ආදායම ඉස්සෙල්ලා කොඩිතුවක්කු මන්ත්‍රීතුමා කිව්වා වගේ හෝටල්වලින් ලැබෙන ආදායම. ඒ ආදායම ලබා ගන්න බෑ නීතිමය කාරණා බලපාලා තියෙනවා. එම මුදල් ලබා ගන්න ක්‍රම සහ විධි අපි පුළුවන් තරම් අනුගමනය කරනවා. ඉතිං එහෙම තියෙද්දි අපි හැමෝම එකතු වෙලා ඒවා විසඳගෙන බෙන්තර ඉඳුරුව පහල ගම් හය ජනතාවට සේවය කරන්න අපි වැඩ කරන්න ඕනේ. එහෙම නැතුව අපි බෙදීමක් කරගෙන අපි අපි අතර සර්ෂණ තියාගෙන අනේ අපේ ආණ්ඩුවක් එනකන් අපි මේක කරන්නේ නෑ අපේ සභාවක් එනකන් අපි මේක කරන්නේ නෑ කියල තැන ඉඳගෙන වැඩ කරොත් අවුරුදු 5න් 5ට බෙන්තර පස්සට යයි. ඔබතුමා කිව්වා වගේ හෝටල්වල මිනිස්සු පෝසත් වෙයි. බෙන්තර මිනිස්සුන්ට ලැබෙන්න ඕන මුදල් නොලැබී යාවි. එතනදි සභාවක් විදියට අපි සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ මුදල් අපි ලබාගෙන මේ බෙන්තර මිනිස්සුන්ට අපි වැඩ කරමු. ඒ විතරක් නෙවෙයි අපේ අවශ්‍යතාවය බෙන්තර ගොඩනගන එක. ඉතිං ඒකට ඔබ සියලු දෙනාගේ සහයෝගය නැවත බලාපොරොත්තු වෙමින් සභාපතිතුමාට ඉදිරි වර්ෂයේ මේ අයවැය ප්‍රකාරව තව තවත් වැඩියෙන් බෙන්තරට සේවයක් කරන්න අවස්ථාව ලැබේවා කියන ප්‍රාර්ථනාව කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා</u>

අද දිනය ඉතා ප්‍රීතිමත් දිනයක්. අප සියලු දෙනාම බලා සිටි දිනයක්. මේ තීරණාත්මක අයවැය අප සියලු දෙනාම එකතු වෙලා හොඳ යෝජනා ඉදිරිපත් කරලා මේ මුදල අපි සොයා ගත්තොතින් බෙන්තර ප්‍රාදේශීය සභාවට බෙන්තර ජනතාවට සේවය කරන්න පුළුවන්. ඒ වගේම බෙන්තර ප්‍රාදේශීය සභාව සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය සේවක මහතුන් ගම්පොළ ප්‍රදේශයට ගොස් කළ සේවය අපි අගය කළ යුතුයි. අපේ තාරක මන්ත්‍රීතුමා කළ විශිෂ්ඨ සේවාව මං මතක් කරන්න ඕනේ. ඒ වගේම කිසිම විදියකින් යාමට නොහැකිව තිබූ ගම්පොළ මාර්ගයේ තිබූ ගල් හා පස් කඳු ඉවත් කර තිබූ තත්ත්වයට පත් කිරීමට අප සියලු දෙනාට හැකි වුණා. ඒ වගේම එයින් ප්‍රාදේශීය සභාවක් කළ යුතු මෙහෙවර ප්‍රදේශයට සීමා නොකර රටටම කිරීමට අපිට ශක්තිය ලැබුණා. එළඹෙන 2026 වර්ෂයේ මෙවැනි ව්‍යසන සිදු නොවේවා යැයි ප්‍රාර්ථනා කරමින් සුභම සුභ අලුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මන්ත්‍රී ,ඉන්දික සේරසිංහ මැතිතුමා**

මං හිතන්නේ මේක ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නෑ. මේක ඉදිරිපත් කරාම අපි ඒ ගැන තතු කියනවා. මේක සමබර කර ගන්න. අපිත් ඔබතුමාට සහයෝගය දෙනවා. තර්කයක් නැත්තම් එතන වැඩකුත් නෑ. අපි මේක ගැන හොයලා බලලා අඩුපාඩු පෙන්වා දෙනවා. නිලධාරීන් සමඟ තියෙන ගැටලුවකට නෙවෙයි. පහුගිය දිනවල කුණාටුවෙන් බෙන්තරට නම් ලොකු හානියක් වුණේ නෑ. මේ දිනවල අනෙකුත් ප්‍රදේශවලට සහන සැලසීමේ කටයුතු අපි ක්‍රියාත්මක කරමින් පවතිනවා. සුහදත්වයෙන් කතා කරලා අපි අඩුපාඩු පෙන්වනවා. අපිත් කැමති මේක හදාගෙන යන්න. අපි ආවේ බෙන්තර දියුණු කරන්න. ඒකෙදි අපි අඩුපාඩුකම් පෙන්වනවා. ඒවා හදාගෙන ඉදිරියට යමු.

**ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා**

මං හිතන්නේ 2025 වර්ෂයේ අවසාන සභා වාරයේ 2026 අපේ ආරම්භක සභාවට ඉදිරිපත් වන අයවැය. අයවැය කියන්නේ ඇත්තටම මුදල් උත්පාදනය කිරීමත් වියදම් කිරීමත් පිළිබඳ ඉදිරිපත් කරන සංක්ෂිප්ත ලැයිස්තුවක්. ආදායම් ටික හැම ක්ෂේත්‍රෙයම ගත්තත් පැහැදිලි කිරීමක් දෙන්න පුළුවන් වියදම් ටික අපිට නිශ්චිතව කියන්න පුළුවන්. නමුත් ආදායම් උපයා ගන්න තියෙන්නේ මහ ජනතාවගෙන් හෝ බදු මුල් ඔස්සේ. ඒ නිසා ඒවා උපයා ගැනීමේ දී අපි කාලෝචිතව වැඩ කරලා ඒ වගේම අනිවාර්යෙන්ම අපි උපායශීලි වෙන්න ඕනේ. හැබැයි මම දකින දෙයක් තියෙනවා මේ අයවැය ඉදිරිපත් කිරීමේ දී කෙටුම්පතක් අපි ගිය සභාවට ඉදිරිපත් කළා. මේක බෙන්තර ඉන්න සියලු ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරපු කෙටුම්පතක්. එතකොට ඒකේ අඩුපාඩුවක් තියෙනවා නන් කාලයක් කාලයක් දීලා තිබුණා. ගැටලුවක් තියෙනවා නම් විසඳගන්න. නමුත් ඉදිරිපත් කළේ නෑ. මං හිතන්නේ නෑ විශ්මිත පුද්ගලයෝ ඉදීවි කියලා එක පාට්ටම ලස්සන රටක් පොහොසත් ජීවිතයක් කියන තැනට යන්න පුළුවන්. අලුත් රජයක් පත්වෙලා තියෙනවා. අපි දකිනවා වෙනස්කම් වෙනවා. හැබැයි ඔය කියන පෝසත් රටක් ලස්සන ජීවිතයක් කියන එක නම් තාම හම්බෙලා නෑ කියලා මට හිතෙනවා. ඒක ලැබෙනවා නම් පොදු මහ ජනතාවගේ පැත්තෙන් මම කැමතියි. අපි කැමතියි මේ රට ඒ තත්ත්වයට පත් වෙනවට. හැබැයි ඉතිං ප්‍රශංසා සහ විවේචන තියෙනවා. බෙන්තර ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න අපිට මහජන වරප්‍රසාදයක් ලැබිලා තියෙනවා. මහ ජනතාවගේ පැත්තෙන් කැමැත්තක් ඇතිවෙලා තියෙනවා. ඒ කැමැත්ත තුළ අපි බලාපොරොත්තු වෙනවා බෙන්තර ජනතාවගේ ඉදිරි වර්ෂයේ සුභ සාධනය. එහෙම නැතුව අපි වෙනත් පක්ෂයක් නියෝජනය කරනවා කියලා බෙදීමකට යන්නේ නෑ. යෝජනාවක් ඉදිරිපත් කරාම ඒක සාර්ථක කර ගන්න අදහසක් නිශ්චිතව ලබා නොදී සාම්ප්‍රදායික දේශපාලනයක් තුළ විපක්ෂය විසින් කරනු ලබන දෙයක් මේක. නදීෂාන් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි කණ්ඩායමක් විදියට එකතු වෙලා කතා වුණේ 2025 වර්ෂයේ අඩුපාඩු හඳුනාගෙන ඉදිරි 2026 වර්ෂයේ දී ඒ අඩුපාඩු තුළින් කණ්ඩායමක් විදියට 23 දෙනා එකා වගේ එක් වෙලා ගරු සභාපතිතුමාට සහයෝගය ලබා දෙයි කියන විශ්වාසය. අපි නිතරම කතා වුණේ අපි ආදර්ශයක් දෙමු රටටම කියලා. විපක්ෂයේ ඉන්නවා නම් අයවැයට විරුද්ධයි. අනිත් පැත්තට අත්පුඩිය එනවා. එසේ නොවී කටයුතු කරමු. බෙන්තර ප්‍රාදේශීය සභාව කියන්නේ ආදායම් උත්පාදනය කළ හැකි සභාවක් කියලා කොඩිතුවක්කු මන්ත්‍රීතුමා කිව්වා. අපිත් දන්නවා. ඒ උත්පාදනය කරන්න යන මුදල ගැන අදහසක් තමයි මෙහි තිබෙන්නේ. ගිය පාර අයවැයේ මුදල්, ප්‍රතිපූර්ණය කරන මුදල්, ඒ වගේම ප්‍රාග්ධන මුදල් ආදිය මෙහි තිබෙනවා. ස්ථිර සේවකයින්ගේ වැටුප්වලින් 20% ක් ප්‍රාදේශීය සභාවල්වලින් අයකර ගන්න කොට කවුරුවත් කල්පනා කළේ නෑ ඒ අයවැය සඳහා යන 20% වෙන ක්‍රමයකින් ගේන්න. පළාත් පාලන නීති යටතේ තිබෙන ඒවා අපිට වෙනස් කරන්න යන්න බෑ. ඕනම රජයක් තීරණ ගන්න ඕනේ ඒ අයට පාර්ලිමේන්තුවේ වැඩි බලයක් තියෙනවා නම් ඒ නීති වෙනස් කරලා බදු මුල් වැඩි කරන්න. අපි සභාවක් විදියට 100% ක් පඩි ගෙවන්න පුළුවන් වෙන විදියට අපේ ආදායම හදා ගන්න ඕනේ. හැබැයි ඉතිං ඒක එකපාර නිර්මාණය කරන්න බෑනේ. දැන් මේ පත්වුණු රජය වුණත් කියන්නේ කාලයක් ගමු කියලා. අපි තාම පලනය කරන්න අරන් මාස 06 ක් වගේ. 20% ක් අපෙන් අය කර ගන්න කලින් බැලුවේ නෑ ඒක අයකර ගන්න සභාව තුළ මුදල් තියෙනවද

කියලා. ඒ නිසා අපි විශ්වාස කරනවා මධ්‍යම රජය යටතේ හො දෙයක් ලැබෙනවා නම් අපිට ඒවා ලැබෙයි කියලා විශ්වාසයක් තියෙනවා. හැබැයි නොලැබුණා කියලා මේ සභාව කඩා වැටෙන්නෙ නැති තැනට පත් කරන්න මන්ත්‍රී මණ්ඩලය සහ සභපතිතුමා වග කියනවා කියලා අපි කියනවා. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව අපේ මූලික ආදායම ලැබෙන බවට අපේ හැඟීම තියෙනවා. සංචාරක හෝටල්වලින් බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව අපි කතා කරමු. අපි සභාවක් විදියට කුණු ටික, අපද්‍රව්‍ය ටිකවතුර අවශ්‍ය නම් ඒ ටික අපි සම්පාදනය කරනවා කියලා මං විශ්වාස කරනවා. මොකද නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා එකතු වෙලා සභාපතිතුමා විශේෂයෙන් ඒ ගැන අවධානය යොමු කරනවා. හැබැයි අපි එක දෙයක් දැක්කා. බදු මුදල් එකතු කරගන්න කතා කරනකොට අපි සියයට 0.25% ට හරි යමු කිව්වම ඒවට විරුද්ධ උනා. සභාවේ කුහකත්වය අත ඇරලා ලස්සන රටක් පොහොසත් ජීවිතයක් කරා යාව් කියලා මම විශ්වාස කළේ. නමුත් බෙදීමක් ඉල්ලලා තියෙනවා. බෙදීමකට ලැස්ති වෙන්න වෙනවා. අපි බෙදීම ජයගන්න උත්සහ කරනවා. ජයගන්නවා විශ්වාසයෙන් යුතුව. සංචාරක මණ්ඩලයේ ගැටලු ගැන කතා කරොත් තවම ඒවා විසඳිලා නෑ, ලයිට් ටික තාම දාලා නෑ නේද? ඒ වගේම අපි පහුගිය කාලේ කඩබදු දීලා ආදායම් උත්පාදනය කරන ක්‍රම අලුත් කර ගත්තා ඒ වගේම අවන්හලක් ඉදිකරන්න නියමිතයි.

<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>

2026 ට ඉදිරිපත් කරන මේ අයවැය සම්බන්ධව කිව්වොත් අපි කවදාවත් ආණ්ඩු පක්ෂෙ හිටියත් විපක්ෂේ හිටියත් මේ අයවැයට විරුද්ධ වෙන්නේ නෑ. මොකද මේ බෙන්තර, ඉඳුරුව, පහළගම්හය කියන ග්‍රාම සේවා වසම් 52 ක ජනතාවට සේවය කරන්න ඕනේ. අපි සභාපතිතුමාව දන්නවා. එතුමා කීප වතාවක්ම සභාව නියෝජනය කරලා තියෙනවා. එතුමා කිව්වොත් කිව්ව දේ කරනවා. එතුමාට ශක්තිය තියෙනවා. ඒ නිසා අපි 23 දෙනාගේ සහයෝගය මේ අයවැයට ලබා දෙන්න කියලා කියනවා. ආදායම් උපයා ගන්න අපි ක්‍රම විධි යොදාගෙන තියෙනවා. කඩ කාමර බදු දෙනවා අපි. සංචාරක හෝටල් සංගමය සමඟ අපි සාකච්ඡා කළා. අපිට පුළුවන් ඒ බදු මුදල් ඉදිරියේ දී ලබා ගන්න. ඔබතුමාලා අපිටත් කලින් ගිහින් හෝටල් සමඟ සාකච්ඡා කරලා තියෙනවා. බදු මුදලට සහනයක් ලබා දෙන්න. අපි ගිහින් සාකච්ඡා කරලා කරන්න හදනකොට විරුද්ධ වෙනවා.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>

මම මේ අයවැයේ අංක ගණිතය ගැන කතා කරන්නේ නෑ. හැබැයි කතා කරන්න ඕනා අපි ආදායම හොයන විදියත්වියදම් කරන විදියත් ගැන. අපි මෙතන සභාවක් විදියට මං මන්ත්‍රීවරු දොළොස් දෙනෙක් ගැන විතරක් කතා කරන්නේ නෑ. හැබැයි කතා කරන්න වෙලා තියෙන අවස්ථාත් තියෙනවා සැහෙන්න. අපේ සභාවේ ආදායම් වැඩි කර ගන්නත් වියදම අඩු කර ගන්නත් කටයුතු කරන්න තමයි අපි හිතුවේ. අපේ කොඩිතුවක්කු මන්ත්‍රීතුමාගේ කථාවේ දී මතක් කරා බලපිටිය ප්‍රාදේශීය සභාවේ ගලි බවුසරයෙන් ලක්ෂ විස්සක් උපයනවා කියලා. මං හිතන්නේ නෑ අපේ සභාවේ ලක්ෂ විස්සක් තියා ලක්ෂ පහක්වත් හොයන්න පුළුවන් ගලි බවුසරයක් තියෙනවා කියලා. අපි මේ සභාවට පත්වුණා කියලා අපි ගෙදරින් ගලි බවුසර් කවුරුවත් අරන් ආවේ නෑ. ඔය 76 සාපෙන් තමයි බලපිටියේ සභාවට ගලි බවුසරයක් ලැබිලා තියෙන්නේ. ලක්ෂ විස්සක් හොයන්න. නැතුව මේ අනුර කුමාර ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් බලපිටිය සභාවට ගලි බවුසරයක් දීලා නෑ. ඕගොල්ලෝ ඕගොල්ලොන්ගේ සභාව ගැන කතා කරාට. අපේ බැකෝ එක අපි එන්න කලින් හදන්න දාලා තියෙන්නේ අපි දාපු එකක් නෙවෙයි තියෙන්නේ. එතකොට ආදායම් උපදවන ක්‍රම ගැන කතා කරා. අපි කීප වතාවක්ම කතා කරා හෝටල්වල බදු ආදායම එකතු කරගන් විදිය ගැන. මේකේ ඉන්න කට්ටිය මොකස කිව්වේ? එපා කිව්වා බෙදීමක් ඉල්ලුවා. අයවැය පැත්තකින් තියන්න රටක් විදියට ජාතියක් පණ අදින වෙලාවක් මේක. බෙන්තර ප්‍රාදේශීය සභාව විදියට මන්ත්‍රීවරු ඔක්කොටම එක මේසයකට එන්න බැරි වුණා. අපි දොළොස්දෙනා එක මේසයකට ආවා. ඕගොල්ලෝ එක මේසයකට ආවද මේකට මොකද කරන්නේ කියල අහන්න. කවුරුවත් ආවෙ නෑ. උදැල්ලක්, සවලක් අරගෙන ගිහිල්ලා තව

අවුරුදු දහයක්වත් මේවා සුද්ධ කරලා ඉවර කරන්න බෑ. යනවා නම් යන්න ඕන සංවිධානය වෙලා බෙන්තර තියෙන සම්පත් ටික එකතු කරගෙන. බෙන්තර හොඳට වැඩ කරන්න පුළුවන් මිනිස්සු ඉන්නවා. අනුග්‍රහය ආධාර දෙන්න පුළුවන් මිනිස්සු ඉන්නවා. සභාවක දී වුණත් එහෙමයි හැට පන්දාහක් උන බෙන්තර මිනිස්සුනේ අපිව පත් කළේ. බෙන්තර මිනිස්සුන්ගේ සල්ලි මේවා. අයවැය කියන එකේ දී ඕගොල්ලොත් අදහස් ගෙනත් දෙන්න ඕනා මෙහෙමු කරමු මෙහෙම කරමු කියලා. අපිට ලයිට් එක දාලා දුන්නේ නෑ. වතුර එක ගිහින් දුන්නේ නෑ කියන එක නෙවෙයි. අදහස් ටික දෙන්න ඕන. සභාපතිතුමා අපි මේ විදියට මේක කරමු. එහෙම කියන්න ඕන මං ඒක තරයේ මතක් කරනවා අවුරුදු හතරකට වැටෙන්න දෙන්නේ නෑ මේ සභාව. හොරවල තොටුපොල පාලම්පාරුව ගත්තොත් වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය මොකක් ද? පාලම්පාරුව. හොරවල තොටුපල පාලම්පාරුව. එතකොට එක පැත්තකින් විතරක් කරන්න බෑ. අපේ පැත්තෙනුත් අදින්න ඕනා. මාසෙකට ලක්ෂ හයක් උපයනවා ඒ අය. අපි විසි තුන්දෙනාම එකට එකතු වෙලා කතා කරමු බලන්න ඕක මාස 06 ක් අපි අදිමු. ලක්ෂ තිහක් එනවනේ. ලක්ෂ එකසිය පනහෙන් තිහක් එනවා තව ලක්ෂ එකසිය විස්සනේ හොයන්න තියෙන්නේ ඒ වගේ අදහස් දෙන්න ඕනේ. මම අයවැයට කතාවක් කරන්න බලාගෙන ආව කෙනෙක් නෙවෙයි. ඇත්ත කතාව කියන්න ඕනා. මේ සභාව පිහිටුවලා තාම මාස හයයි. ඔන්න 2027 අයවැය ගැන කතා කරන්න ඕන මේකෙ කතා කරන්න දෙයක් නෑ. 2026 ගැන කතා කරන එක ඇත්තටම කුහක කමක්. මම මේක සාධාරණීකරණය කරන්නේ නෑ. මේ වෙලාවෙ ගරු සභාපතිතුමාට ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මේ අයවැයට පූර්ණ සහයෝගය දක්වනවා. ඒ වගේම මේ සභාව මේ ඉදිරි අවුරුද්දට කරන්න ඕන වැඩකටයුතුවලට එහා දෙයක් කරන්න බලාපොරොත්තුවක් තියෙනවා. අනිවාර්යයෙන් ඒ වැඩ ටික අපි කරනවා. ඒ සඳහා සභාපතිතුමාට මන්ත්‍රී මණ්ඩලයේ උපරිම සහයෝගය ලබා දෙන්න කියලා මතක් කරමින් මගේ කතාව අවසන් කරනවා. ස්තූතියි.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

බෙන්තර ප්‍රාදේශීය සභාවේ අයෝමය ශක්තිය ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මන්ත්‍රීතුමාට පස්සේ මට කතා කරන්න ලැබීමත් සතුටක්. මේ අයවැය ගැන ඇත්තටම තාරක මන්ත්‍රීතුමයි මායි කතා කරන්න ඕනේ නෑ. අපි දෙන්නා හිතුවා විසිතුන් දෙනාම එක මතයකට ඇවිල්ලා මේ අයවැයට සහයෝගය දක්වයි කියලා. මේ රට මගේ රට මා ඉපදුන රට හැදෙන වැඩෙන රට අපේම මව් රට එහෙම හිතලා වැඩ කරයි කියලා බලාපොරොත්තුවෙන් මන්ත්‍රීතුමත් මමත් කතා කලේ බයවෙන්න එපා. මොකද අපි ගම්පොළ ගෙලිඔය මාර්ගයේ කිලෝමීටර් හයක් ගමනාගමනයට පහසු කරමින් ගම්පොළම විශ්මයට පත් කරමින් විශාල මෙහෙවරක් ඉටු කරලා තමයි අද මෙතනට ඇවිල්ල ඉන්නේ. ඒ නිසා බෙන්තරට ඒ ජනතාවගේ ආශිර්වාදය ලැබුණා. ඒ හින්දා කිසිසේත්ම බයවෙන්න එපා මේ ජනතා ආශිර්වාදයෙන් අපට මේ අවශ්‍ය ආදායම හොයාගන්න පුළුවන්. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබෙනවා අපේ බදු ආදායමෙන් ලැබෙනවා. තවත් අවස්ථාවල් තියෙනවා. විපක්ෂ කණ්ඩායම අපෙත් එක්ක එකතු වෙලා මේ හෝටල් වලින් ලැබෙන්න තියෙන ආදායම ගමු. අපි එකතුවෙලා මේක කරගෙන යමු. එතකොට අපිට මේකේ මම නෙවෙයි කියන්නේ ගම්පොළ මිනිස්සු කියන්නේ ලංකාවේ ඉන්න හොඳම සභාපතිවරයා කියලා මිනිස්සු. දකින්න ඇති වීඩියෝස් යනවා. ලංකාවේ ඉන්නවද මේ වගේ සභාපතිවරු කියලා තමයි ගම්පොළ මිනිස්සු කිව්වේ. ඉතින් එහෙම සභාපතිවරයෙක් ඉදිරිපත් කරපු අයවැයක් තමයි මේ අපි අරගෙන යන්නේ මොනාද නොකළේ ගම්පොල ගිහිල්ලා ළිං සුද්ධ කළා. ගෙවල් හේදුවා පාරවල් හැදුවා නගරයම කුණු ගොඩක්. කුණු ගොඩම සුද්ද කළා. අවුරුදු අටේ දහයේ දරුවන්ගේ ඉඳන් අවුරුදු හැත්තෑව අසූව මිනිසුන් ඇවිල්ලා අපිට වඳින්න හැදුවා. සභාපතිතුමා මම තාරක මන්ත්‍රීතුමා දිව්වා අපිට වඩා වැඩිමල් අයගෙන් වැඳුම් ලබන්න බැරි නිසා ඒ මිනිස්සුන්ගේ ඒ තරම් ගෞරවයට පත් වෙච්ච සභාවක් මේක. ඒ ගෞරවය තියෙන්නේ මේ සභාපතිතුමාටවත් මටවත් තාරක මන්ත්‍රීතුමාටවත් අපේ කණ්ඩායමේ 12 දෙනාටවත් නෙවෙයි. මේ සමස්ත බෙන්තර ප්‍රාදේශීය සභාවට ඒ මිනිස්සු ඇහුවේ විපක්ෂයට මේ තරම් හයියක් කොහෙන්ද එක්ස්කැවේටර්

පහක් ලොරි පහක් බස් රථයක් වතුර මෝටර් හතරක් ජෙනරේටර් හතරක් මෙහෙම අරගෙන ගිහිල්ලා වැඩ කරන්න හයියක් තියෙනවද ඒකාබද්ධ විපක්ෂයට මිනිස්සු කල්පනා කරන්න ඇත්තේ එහෙම. මිනිස්සු හිතුවේ මේක ඒකාබද්ධ විපක්ෂයේ සභාවක් නෙවෙයි මාලිමාවේ විපක්ෂයක් නැත්නම් මෙහෙම කරයිද? අපි තීරණය කරා වැඩිම හානිය වෙලා තියෙන්නේ කොහෙටද ගම්පොළට. එහෙනම් අපි යමු ගම්පොළට කියලා. රට වෙනුවෙන් ආණ්ඩුව වෙනුවෙන් අපි යුතුකම් කළා. අයවැය ගැන කතා කරොත් අපේ වියදම් කියන්න පුළුවන් මෙච්චරයි මෙච්චරයි මෙච්චරයි කියලා. නමුත් ආදායම එහෙම බෑ අපි හැමෝම එකතුවෙලා ආදායම උත්පාදනය කරගමු. මේ ඉදිරිපත් කරලා තියෙන අයවැය ඉතාම කාලෝචිතයි මේක බල ප්‍රදේශයේ ජනතාවට පොහොසත් රටක් ලස්සන ජීවිතයක් හදන්න පුළුවන් තරමට මේ අයවැය ඉදිරිපත් කරලා තියෙනවා සෞම්‍ය මන්ත්‍රීතුමා කිව්වා වගේ මධ්‍යම රජයේ අයවැයේ එහෙම එකක් නෑ. ලස්සන රටක් පෝසත් ජීවිතයක් ඒ අයවැයේ නෑ. විකුණනවා බදු ගහනවා. එහෙම නැතුව මේ අයවැය ඉතාම කාලෝචිතයි මේ අයවැයෙන් පුළුවන් අපිට මිනිස්සුන්ට ප්‍රශස්ත විදිහට කරගෙන යන්න ඒ සඳහා විපක්ෂ කණ්ඩායමේ තමුන්නාන්සේලාත් සහයෝගය ලබා දෙන්න  සහාය දීලා බෙන්තර ඉඳුරුව පහළගම්හය මිනිස්සු වෙනුවෙන් සහයෝගය ලබාදෙන්න. මිනිස්සු වෙනුවෙන් එකතු වෙන්න එහෙම නැතුව ප්‍රේමකුමාර සභාපතිතුමා වෙනුවෙන් නෙවෙයි. මිනිස්සුන්ට වැඩ කරන සභාපති කෙනෙක් බෙන්තරට විතරක් නෙවෙයි රටටම වැඩ කරන සභාපතිවරයෙක් කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

__ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා__

2026 වර්ෂයට මාස හතරක පහක කාලය ඇතුළත මේ වගේ අයවැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ප්‍රථමයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා මේ අයවැයට මගේ ඡන්දය ලබා දෙනවා කියන එක ප්‍රථමයෙන්ම මම කියනවා මොකද අපි හැමෝම පෝසත් රටක් ලස්සන ජීවිතයක් කියලා තේමා මුල්කරගෙන තමයි මේ රටේ පවතින ආණ්ඩුවත් එක්ක මේ සභාව මේ විදිහට සංවිධානය කරගත්තේ ඉතින් එතනදි පසුගිය ව්‍යසනයේදී ඉක්මනින්ම අපිට සභාවක් වශයෙන් යන්න ලැබුණා නුවරට අපිව ආණ්ඩුවෙන්ම තමයි පත්කරලා තිබුණෙ දිස්ත්‍රික්කවලට අපි ඉන් ඔබ්බට ගිහිල්ලා වෙනත් දිස්ත්‍රික්ක කරන්න ගියේ නෑ හැබැයි ආණ්ඩුවෙන් පත් කරපු පැත්තට ගිහිල්ලා හොඳ වැඩසටහනක් කරලා කණ්ඩායමක් හැටියට ලස්සනට කරලා සභාපතිතුමා, උපසභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලය කාර්ය මණ්ඩලය තමන්ගේ අවි ආයුධ සේරම දේවල් අරගෙන ගිහිල්ලා ඒ මෙහෙයුම ලස්සනට සාර්ථකව සිදු කරා. නමුත් ඒ ගරුත්වය පෙරළා අපිට නෙවෙයි. බෙන්තරට තමයි ඒ ගරුත්වය ලැබෙන්න ඕනේ. ඉතින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති එක්ක තමයි අපේ ගමන ගියේ. විශේෂයෙන් ඒක මතක් කරනවා. මේ මමාස පහ හය ඇතුළත අපිට පුළුවන් වුණා මේ වගේ ලස්සන අයවැයක් හදන්න. සමහර වෙලාවට උත්පාදනය තව එහාට යන්න පුළුවන් උත්පාදනය 2028 දී තව ගොඩාක් එහාට යන්න පුළුවන් හොඳ වැඩසටහන් සංවිධානය වෙනවා.අපි පක්ෂ පාට පිල් බෙදිලා මේ වැඩකටයුත්ත කරනවට මගේ විරුද්ධත්වය තියෙනවා.විශේෂයෙන් අපි බෙන්තරින් හොඳ පණිවිඩයක් ගෙනිහිල්ලා තියෙනවා මේ වෙනකොට ලංකාව පුරාවටම. අපි ඒ පණිවිඩය තව සාර්ථක කර ගන්න ඕන කියන එක තමයි අපේ විශ්වාසය. ඉතින් අපි කියනවා ඒකට 2027 සභාවේ අයවැය මේ විදියට සභාවට දානකොට ඒකට හැමෝම එකතුවෙයි කියලා අපි විශ්වාස කරනවා හැබැයි මාස පහක් හයක් වගේ කෙටි කාලයක් ඇතුළත ඉදිරිපත් කරපු මේ අයවැයට තමයි අපේ පූර්ණ ශක්තිය අපි ලබාදෙන්නෙ. එහෙමනම් අපි පෙන්නන්න ඕනේ පොදුවේ 65000ක් පමණ වන ජනතාවට බෙන්තර විතරක් නෙවෙයි රටේ අනෙක් සියලුම අයට ඊටත් එහා ගිහිල්ලා දෙස් විදෙස් රටවල් වලටත් දැක ගන්න හොඳ අයවැයක් දැම්මා. අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඡන්දය දීලා සම්මත කරගන්නවා. ඉතින් එතනටයි අපි යන්න ඕනෙ

__ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය__

ඇත්තටම මේ 2026 වර්ෂයේ අයවැය සම්බන්ධව කතාවක් කරන්න මම සූදානම් වෙලා ආවේ නෑ. කතා නොකර බැරි හින්දම තමයි මේ කතා කරන්නේ ඇත්තම කියනවා නම් පහුගිය ආපදා තත්ත්වය ගැන කතා

කරනවානම් අප සභාවේ වගකිවයුත්තෝ විදියට අපේ කණ්ඩායමට ශක්තියක් වෙන්න තමයි කාන්තා නියෝජිතවරු දෙන්නා විදියට අපි එතැනට ගියේ. මම කියන්නේ බෙන්තර සුරපුරය කරන්න නම් අපි දොළොස්දෙනාට විතරක් බෑ මේක කරන්න. අපි විසින් සභාවට ආදායම් උප්පාදනය කරන්න දේවල් හොයාගෙන අපි ඉදිරියට යමු. අපේ තාරක මන්ත්‍රීතුමා කියන්නේ ඇත්තටම රන් තරුවක් අපිට. සභාවේ බැකෝ එකෙන් වැඩ කරනවා බැකෝ එකේ වැඩ කරන රියදුරන්ට මහන්සි නම් එයා එතනට ගිහින් ඒ වැඩ කරනවා කැත්තද උදැල්ල ද ඕනම දෙයක් එයාට පුළුවන් මම කියනවා සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ට කිසිම බෙදීමක් නැතුව අයවැයට පක්ෂව ඡන්දය ලබා දෙන්න කියලා. ස්තුතියි

**<u>ගරු මන්ත්‍රී, සමිත පුංචිහේවා මැතිතුමා</u>**

මම මුලින්ම සන්තෝෂ වෙනවා මේ වෙලාවේ ජීවිතයේ පළමු වතාවට බොහෝ පිරිසක් සමාජ සේවා කටයුතුවලට යොමු කරන්න පුළුවන් වෙලා එය ප්‍රධාන මාතෘකාව විදියට කතා කරන මන්ත්‍රීවරුන් පිරිසක් බිහි කරන්න අපේ ජනාධිපතිතුමාගේ පෝසත් රටක් කියන තේමාවට පුළුවන් වෙනවා මම පුද්ගලිකව සංතෝෂ වෙනවා ඒ සම්බන්ධයෙන්. අපි නිතරම මතක් කරන දෙයක් තමයි මේ ආපදා සහන සම්බන්ධයෙන් අපිට කාගෙවත් පැසසුම්වත් කවුද වැඩ කරන්නේ කවුද නොකරන්නේ කියන එක නෙවෙයි. 2004 දී සුනාමිය වෙලාවේ සාමාජිකයෝ ලක්ෂ දෙකක්වත් නැති වෙලාවේ ආණ්ඩුවට කරන්න බැරි වැඩ කරපු පක්ෂයක් නියෝජනය කරපු ඒ අයට ඒ වෙලාවෙත් පුද්ගලිකව සහයෝගය දුන්නා. ඒවා මහා විප්ලව කියලා හිතන්න එපා. ආපදාවලදී අපි උදව් කරන්න ඕන. ඒ සඳහා අවශ්‍ය සම්පත් සභාවල තියෙනවා ඒ සම්පත් පාවිච්චිකරලා ඒවා කරන්න නායකත්වය දුන්න එකට මංහිතන්නේ ජීවිතය පළමුවරට මේ වගේ අත්දැකීමක් ලබන මන්ත්‍රීවරුන්ට නායකත්වය ලබාදීම සම්බන්ධයෙන් මම සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම තාරක මන්ත්‍රීතුමා කිව්වා අපේ ගලි බවුසරයෙන් ලක්ෂ පහක්වත් උපයන්න බෑ කියලා. ගලි බවුසරය හදාගන්න බැරි මට්ටමට බැකෝ එක හදාගන්න බැරි මට්ටමට සභාව පත්කරලා තියෙන්නේ හිටපු සභාපතිවරු ඇතුළු සියලු දෙනාම. එතකොට ඒ හිටපු සභාපතිවරු මාධ්‍ය සාකච්ඡා තියලා කිව්වා අපිට කවුරුවත් ඕන නෑ මේ සභාව කරන්න කියලා. ඒ නිසා තමයි අයවැය සඳහා යෝජනා ඉදිරිපත් කරන්නවත් අපිට අවශ්‍ය නොවුණේ. හේතුව තමයි අපි හිතුවා ඒගොල්ලෝ කෝටිපතියෝ නිසා හිටපු අයගෙන් සල්ලි ටිකක් අරගෙන මේක හදලා දෙයි කියලා. ඒ නැතත් අපි බෙන්තර ජනතාව අපහසුතාවයට පත්කරන්නේ නෑ. අපිට ආණ්ඩුවක් තියෙනවා ඒ ආණ්ඩුව සමඟ එකතුවෙලා අපි බෙන්තර ජනතාවට සේවය කරනවා. බෙන්තර ජනතාවගේ බහුතර ඡන්දයෙන් තේරී පත්වුණු මන්ත්‍රීවරු දහයක් මෙතන ඉන්නවා ඒ වගේම තවත් මන්ත්‍රීවරයෙක් අපිට ඉන්නවා නැතුව ඡන්ද දෙක තුන අරගෙන සභාවට ආපු අය නෙවෙයි අපි. ඒ නිසා බෙන්තර ජනතාවට අපි වගකියනවා මේ අයවැය කියන එක අපිට ප්‍රශ්නයක් නෑ. ඔබගේ ඉදිරි කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරනවා

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**

මම ප්‍රථමයෙන්ම සුබ පතනවා මේ සභාවේ අපි පත්වෙලා ඇවිල්ලා මංගල අයවැය හැටියට ඉදිරිපත් කරපු මේ අවස්ථාවේදී සුබ පතනවා සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ඔබ සියලු දෙනාටත්. මේකේ ඇත්තටම ගොඩක් ප්‍රශ්නය තියෙන්නේ මේ මුදල ලැබෙයිදෝ නොලැබෙයිදෝ කියන ගැටලුව තමයි මම හිතන්නේ. නමුත් මේ අයවැය කියන එකේ මේ ලැබෙන්න අපේක්ෂිත ඒවා. ඒක ලැබෙන්නත් පුළුවන් සමහරවිට නොලැබෙන්නත් පුළුවන් ඒ වියදම කෙරෙන්නත් පුළුවන් නොකෙරෙන්නත් පුළුවන්. අපි ඒ මානසිකත්වයෙන් කල්පනා කළොත් මේ ආදායම් ලබාගන්න අපි විසිතුන්දෙනාම එකතු වෙලා වැඩ කරමු. මේ සභාවත් එක්ක විසිතුන් දෙනාටම බැඳීමක් තියෙනවා. අපි ඇවිල්ලා තියෙන්නේ මොන පක්ෂයෙන් ආවත් පක්ෂ ගණනාවක් තියෙනවා. ඒක හොඳයි.පක්ෂ ගණනාවක පළපුරුද්ද මේකට ආයෝජනය කරන්න පුළුවන් අපි තනි පක්ෂයක් හැටියට යනවා කියන එකේ ලොකු වැදගත්කමක් නෑ. බහුතර බලයක් හිමිවෙච්ච නිසා තමයි බහුතරයක් එකතුවෙලා මේක පිහිටෙව්වේ. මේකෙදි අපි සියලු දෙනාටම වගකීමක් තියෙනවා මේ අයවැය ලබාගන්න විශේෂයෙන්ම විසි තුන්දෙනාටම ප්‍රථමයෙන්ම ඕනේ මේ සඳහන් වන ආදායම්වලින් බහුතරයක් ප්‍රාදේශීය සභාවට ලබා ගන්න. මේක අත් නොහැරිය යුතු වගකීමක් මොකද හේතුව ප්‍රාදේශීය සභා පනත හා මැතිවරණ පනත් අනුව පත්වීම් ලබලා මහජන ඡන්දයෙන් අපි ආවෙ. අපි

ඉන්න කාලෙ ඔක්කොම එකතුවෙලා මිනිස්සුන්ට දැනෙන සේවයක් නොකරොත් ඒකට විසිතුන් දෙනාම වග කියන්න ඕනේ. මේකේ හිටපු ප්‍රබල සභාපතිවරු පැරදුණා. මන්ත්‍රීවරු පැරදුණා. මේ සඳහා සියලු දෙනා කැපවෙමු කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒවට උදව් කරන්න. අපිට ගන්න පුළුවන් ගොඩක් අභිමිවෙලා තියෙනවා. අපි අපේක්ෂිත ආදායම වැඩි කරගත්තොත් ලබන වසරේ මීට වඩා සංවර්ධනයක් කරන්න පුළුවන් අනිත් කාරණය මධ්‍යම රජයේ සහයෝගය නැතුව කිසිම පළාතක් දියුණු කරන්න බෑ. අපේ සහයෝගය අනිවාර්යෙන් දෙනවා අයවැය සඳහා ඒ වගේම ගම්පොළ යන්න බැරිවුණාට කණගාටුව ප්‍රකාශ කරනවා ඒ වගේම අයවැයේ සියලුම යෝජනා මුදල් ලැබිලා කටයුතු සිද්ධ වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා

**<u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>**

2026 ඇස්තමේන්තුවක් හැටියට ඉදිරිපත් කරලා තියෙන අයවැය සම්බන්ධයෙන් මම වැඩිදුර අදහස් දක්වන්න යන්නේ නෑ. මේ අයවැය 100% ක් ප්‍රායෝගික නෑ. අපේ විෂය පථය තුළ මහජනතාවට සේවය කරන්න වෙන්වෙලා තියෙන්නේ 30% ක වගේ ප්‍රතිශතයක් දැනට සභාවේ උත්පාදන ප්‍රතිශතය 6% යි. ඒක අවම වශයෙන් 20% දක්වා වර්ධනය කරගත යුතුයි. උත්පාදනය හා වියදම සිදුකෙරෙන ආකාරය පිළිබඳව අපි පෞද්ගලිකව හොයලා බලනවා. පසුගිය ආපදා කාලයේ කණ්ඩායම් වශයෙන් ගොස් ඒ ප්‍රදේශවල සිදු කළ කටයුතු වෙනුවෙන් ස්තූතිවන්ත වෙනවා.

**<u>ගරු මන්ත්‍රී, තිලක් උපුල් වමින්ද මැතිතුමා</u>**

2026 වර්ෂයේ අයවැයට මම සුබ පතනවා. ඒ වගේම ඡන්ද දෙක තුන ලබාගත් මන්ත්‍රීවරු කියලා අපිට කිව්වා. නමුත් අපේ ඒකාබද්ධ විපක්ෂය 68% ක ප්‍රතිශතයක් අපේ මන්ත්‍රීවරු අරගෙන තියෙනවා. සභාපතිතුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කරා ගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා

මෙම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටි බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මහත්මිය එක් එක් සභිකයාගේ නම් ප්‍රකාශ කරමින් ඡන්දය විමසා සටහන් කර ගන්නා ලදී.

- ඒ අනුව 2026 වර්ෂයේ අයවැය යෝජනාව සඳහා පක්ෂව ගරු සභාපති ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා, ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දුශාන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. තිලක් උපුල් වමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය, ගරු මන්ත්‍රී බී. සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා, ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා ඡන්ද ප්‍රකාශ කළ අතර,

- එම යෝජනාවට විපක්ෂව ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා, ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා, ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා ඡන්දය ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2026 වර්ෂයට අදාළ අයවැය සභා සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවට පක්ෂව ඡන්ද 12 ක් ද, විපක්ෂව ඡන්ද 10 ක් ද ලැබුණු අතර, ඒ අනුව එම යෝජනාව වැඩි ඡන්ද 02 කින් සභා සම්මත විය.

5.1.2. 2025 වර්ෂයේ දෙසැම්බර් මස පරිපූරක අයවැය සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

පරිපූරක අයවැයක් තියෙනවා පළාත් පාලන ප්‍රතිපාදන වලින් ලැබිච්ච මුදල් සඳහා. මේ සඳහාත් බෙදීමක් අවශ්‍ය නම් කියන්න.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

මේ සඳහාත් බෙදීමක් අවශ්‍යයි.

මෙම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටි බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මහත්මිය එක් එක් සභිකයාගේ නම් ප්‍රකාශ කරමින් ඡන්දය විමසා සටහන් කර ගන්නා ලදී.

- ඒ අනුව 2026 වර්ෂයේ අයවැය යෝජනාව සඳහා පක්ෂව ගරු සභාපති ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා, ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූශාන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. තිලක් උපුල් වමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය, ගරු මන්ත්‍රී බී. සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා, ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා ඡන්ද ප්‍රකාශ කළ අතර,

- එම යෝජනාවට විපක්ෂව ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා, ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා, ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා ඡන්දය ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2025 වර්ෂයේ පරිපූරක අයවැය සභා සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවට පක්ෂව ඡන්ද 12 ක් ද, විපක්ෂව ඡන්ද 10 ක් ද ලැබුණු අතර, ඒ අනුව එම යෝජනාව වැඩි ඡන්ද 02 කින් සභා සම්මත විය.

5.1.3. 2025.12.31 දිනට නියමිත භාණ්ඩ සමීක්ෂණයට අදාළව පහත සාමාජිකයින්ගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු මන්ත්‍රීරුන් 02 දෙනෙක්
- පළාත් පාලන දෙපාර්තමේන්තු නිලධාරියෙක්
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- තාක්ෂණ සේවා නිලධාරියෙක්
- සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී 08 දෙනෙක්

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මේ සඳහා අප සභාවේ පහත නිලධාරීන් මා යෝජනා කර සිටිනවා.

* ඒ. පී. ආර්. එන්. මෙන්ඩිස් මිය - විමර්ශන නිලධාරී
* ඒ. සී. චන්ද්‍රානි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
* එන්. පී. ද සිල්වා මිය - සංවර්ධන නිලධාරී
* ශෂිකලා දර්ශනී මිය - සංවර්ධන නිලධාරී
* නිශානි මධූකා ජයවීර මිය - සංවර්ධන නිලධාරී
* ලක්මාලි කෞෂල්‍යා මිය - සංවර්ධන නිලධාරී
* කේ. එල්. සී. සෙව්වන්දි මිය - කළමනාකරණ සේවා නිලධාරී
* චතුරිකා වීරසේකර මිය - කළමනාකරණ සේවා නිලධාරී
* සතාරා නදීශානී මිය - තාක්ෂණ සේවා නිලධාරී

මීට අමතරව මන්ත්‍රීවරුන් නම් කරන්න ඔබට අවස්ථාව තියෙනවා.

මේ අවස්ථාවේ දී ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ නම සහ ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමාගේ නම ඉහත කමිටුව සඳහා යෝජනා කරන ලදී.

<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>

2025.12.31 දිනට නියමිත භාණ්ඩ සමීක්ෂණයට අදාළව පහත සාමාජිකයින්ගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා
- ඒ. පී. ආර්. එන්. මෙන්ඩිස් මිය - විමර්ශන නිලධාරී
- ඒ. සී. චන්ද්‍රානි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
- සතාරා නදීශානී මිය - තාක්ෂණ සේවා නිලධාරී
- එන්. පී. ද සිල්වා මිය - සංවර්ධන නිලධාරී
- ශෂිකලා දර්ශනී මිය - සංවර්ධන නිලධාරී
- නිශානි මධූකා ජයවීර මිය - සංවර්ධන නිලධාරී

- ලක්මාලි කෞෂල්‍යා මිය - සංවර්ධන නිලධාරී
- කේ. එල්. සී. සෙව්වන්දි මිය - කළමනාකරණ සේවා නිලධාරී
- චතුරිකා වීරසේකර මිය - කළමනාකරණ සේවා නිලධාරී

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.4. 2025.12.31 දිනට නියමිත ඉඩම් හා ගොඩනැඟිලි සමීක්ෂණයට අදාළව පහත සාමාජිකයින්ගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු මන්ත්‍රීවරුන් 03 දෙනෙක්
- තාක්ෂණ සේවා නිලධාරී 03
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී 04

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
මේ සඳහා ඉහත මා සඳහන් කළ නිලධාරීන්ට අමතරව පහත නිලධාරීන් මා යෝජනා කර සිටිනවා.

* එම්. ඒ. එස්. ජයසිංහ මහතා - තාක්ෂණ සේවා නිලධාරී
* සතාරා නදීශානි මිය - තාක්ෂණ සේවා නිලධාරී
* ආර්. ජේ. එස්. මාදුවාගොඩ මයා - තාක්ෂණ සේවා නිලධාරී
* වසන්තා ප්‍රියදර්ශනී මිය - කාර්යභාර නිලධාරී (හබුරුගල)
* ඒ. පී. ජේ. සී. අබේසූරිය මිය - කාර්යභාර නිලධාරී (ඉඳුරුව)
* හෂාන් චමිල කුමාර මයා - සංවර්ධන නිලධාරී

මේ අවස්ථාවේ දී ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් තාරක විජේකෝන් මැතිතුමාගේ නම ද, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ගරු මන්ත්‍රී ජයරත්න ඉඳුරුවගේ මැතිතුමාගේ නම ද, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමාගේ නම ද ඉහත කමිටුව සඳහා යෝජනා කරන ලදී.

<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>
2025.12.31 දිනට නියමිත ඉඩම් හා ගොඩනැඟිලි සමීක්ෂණයට අදාළව පහත සාමාජිකයින්ගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා
- ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
- එම්. ඒ. එස්. ජයසිංහ මයා - තාක්ෂණ සේවා නිලධාරී

- සතාරා නදීශානි මිය - තාක්ෂණ සේවා නිලධාරී
- ආර්. ජේ. එස්. මාදුවාගොඩ මයා - තාක්ෂණ සේවා නිලධාරී
- වසන්තා ප්‍රියදර්ශනී මිය - කාර්යභාර නිලධාරී (හබුරුගල)
- ඒ. පී. ජේ. සී. අබේසූරිය මිය - කාර්යභාර නිලධාරී (ඉඳුරුව)
- හෂාන් චමිල කුමාර මයා - සංවර්ධන නිලධාරී

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.5. 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභා පෙර පාසල් සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත දරු දැරියන් 138 දෙනෙකු සඳහා නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දීම සුදුසු බවටත්, ඒ සඳහා වන රු. 496,800/- ක මුදලක් සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.6. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය - නව වැඩ යටතේ අනුමත කොම්පෝස්ට් අංගනය සඳහා යන්ත්‍ර සහ උපකරණ මිල දී ගැනීමට අදාළව අනුමත රු. මිලියන 2.5 ක මුදල පහත සංශෝධිත වැඩ යෝජනාව පරිදි ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| සංශෝධිත වැඩ යෝජනාව | අනුමත ප්‍රතිපාදන මුදල (රු. මි.) |
|---|---|
| කොම්පෝස්ට් අංගනය සඳහා යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මිල දී ගැනීම | 1.65 |
| නොදිරන අපද්‍රව්‍ය රැස් කිරීම හා කළමනාකරණය සිදු කරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන් කිරීම | 0.85 |

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2025 න් කොම්පෝස්ට් අංගනය සඳහා යන්ත්‍ර සහ උපකරණ මිල දී ගැනීමට අපිට රු.මි. 2.50 ක් අනුමත වුණා. ඒකෙන් අපි සභාවට ට්‍රැක්ටර් ටේලර් 02 ක් ගන්න මිල ගණන් කැඳවලා යාන්ත්‍රික ඉංජිනේරු තෝරා ගන්නා ලද ආයතනයෙන් මේ වන විටත් ඒ රථ දෙක ඇණවුම් කරලා තියෙන්නේ. ඒකට අපිට දළ වශයෙන් රු. මි. 1.65 ක් වගේ වැය වෙන්නේ. පස්සේ ඉතිරි මුදලට නොදිරන අපද්‍රව්‍ය එකතු කරලා බෙදා වෙන් කරලා ගබඩා කරන ගොඩනැගිල්ල කොටස් වලට බෙදන්න ඉතිරි මුදල දෙන්න කියලා අපි ඉල්ලීමක් ඉදිරිපත් කළා කොමසාරිස්තුමියට. ඒකට අදාළව දැන් අපිට රු. මි. 0.85 ක ප්‍රතිපාදන අනුමත වෙලා තියෙනවා. තාක්ෂණ සේවා නිලධාරී හදපු ඇස්තමේන්තුව රු. 1,132,086.01 ක්

අනුමත ප්‍රතිපාදනයට වැඩිපුර යන මුදල සභා අරමුදලින් දරලා කඩිනමින් මේ අවුරුද්ද අවසානයට පෙර නොදිරන අපද්‍රව්‍ය රැස් කිරීම හා කළමනාකරණය සිදු කරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන් කිරීම සිදු කරන්න ඕනේ. යෝජනාව මේ විදියට සංශෝධනය වෙන්න ඕනේ.

__සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම__

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය - නව වැඩ යටතේ අනුමත රු. මි. 0.85 ක මුදල යටතේ නොදිරන අපද්‍රව්‍ය රැස් කිරීම හා කළමනාකරණය සිදු කරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 1,132,086.01 ක ඇස්තමේන්තුව අනුව සිදු කිරීමටත් වැඩිපුර යන මුදල සභා අරමුදලින් ගෙවීම් කිරීමත් සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.7. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - සංශෝධන යටතේ රු. මිලියන 0.80 ක මුදලට අනුමත වී ඇති කනහෙන්තොට ගම්සභා පාර පවත්නා ජල ටැංකියේ සිට ගම්වාසීන්ට ජලය ලබා දීම සඳහා නළ එළීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

__5.2. ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-__

5.2.1. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පහත මන්ත්‍රීවරුන්ගේ නම් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යෝජනා කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා
- ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා

- ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා
- ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා

එම සඳහන් කළ නම් ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන ලදී.

- ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා
- ගරු මන්ත්‍රී රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා

එම සඳහන් කළ නම් ගරු මන්ත්‍රී දිනේෂ් සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා පහත නම් සඳහන් මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර තේමින්ද වලල්ලාවිට මැතිතුමා
- ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා
- ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා
- ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා
- ගරු මන්ත්‍රී රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.2. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පහත මන්ත්‍රීවරුන්ගේ නම් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට යෝජනා කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා

- ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන ලදී.

- ගරු මන්ත්‍රී පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා
- ගරු මන්ත්‍රී නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා
- ගරු මන්ත්‍රී රසිත නන්දන තුෂාර මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා පහත නම් සඳහන් මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා
- ගරු මන්ත්‍රී නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා
- ගරු මන්ත්‍රී රසිත නන්දන තුෂාර මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.3. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ කර්මික සේවා කාරක සභාව සඳහා මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පහත මන්ත්‍රීවරුන්ගේ නම් කාර්මික සේවා කාරක සභාවට යෝජනා කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා
- ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා
- ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා
- ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන ලදී.

- ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා
- ගරු මන්ත්‍රී මර්වින් ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම**</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ කර්මික සේවා කාරක සභාව සඳහා පහත නම් සඳහන් මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා
- ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා
- ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා
- ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා
- ගරු මන්ත්‍රී මර්වින් ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.4. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පරිසර සහ පහසුකම් කාරක සභාව සඳහා මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පහත මන්ත්‍රීවරුන්ගේ නම් පරිසර හා පහසුකම් කාරක සභාවට යෝජනා කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා පරිසර හා පහසුකම් කාරක සභාව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන ලදී.

- ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා
- ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය හා 12(2) වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පරිසර සහ පහසුකම් කාරක සභාව සඳහා පහත නම් සඳහන් මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය
- ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා
- ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.5. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 අනුව 2026 වර්ෂයේ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර්/ ප්‍රසම්පාදන කමිටුව සඳහා මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පහත මන්ත්‍රීවරුන්ගේ නම් ටෙන්ඩර්/ ප්‍රසම්පාදන කමිටුව සඳහා යෝජනා කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය
- ගරු මන්ත්‍රී මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා
- ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා
- ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා ටෙන්ඩර්/ ප්‍රසම්පාදන කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන ලදී.

- ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා
- ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම**</u>

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 අනුව 2026 වර්ෂයේ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර්/ ප්‍රසම්පාදන කමිටුව සඳහා පහත නම් සඳහන් මහජන නියෝජිතවරු පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා
- ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය
- ගරු මන්ත්‍රී මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා
- ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා
- ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා
- ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා
- ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.6. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2026 වර්ෂය සඳහා පත් කරනු ලබන පහත බලතල හිමි මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට රු. 1,500,000/- ක් දක්වා ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

*වියදම් අනුමත කිරීම (සභා අරමුදලින් කරනු ලබන රු. 1,500,000/- ක් දක්වා සියලුම වියදම් අනුමත කිරීම)

*නව ආදායම් ප්‍රභවයන් හඳුනා ගැනීම.

*හිඟ ආදායම් අයකර ගැනීමේ ක්‍රමවේදයන් සභාවට හඳුන්වා දීම.

*අයවැය සඳහා නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම.

*ව්‍යාපෘති වාර්තා අනුමත කිරීම.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.7. 2026 වර්ෂය සඳහා මහජන නියෝජිතයන් හා ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පහත නම් පුස්තකාල උපදේශන කමිටුව සඳහා යෝජනා කරන ලදී.

- ශ්‍රී ධර්මාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය පරේගම චන්ද්‍රාලෝක නා හිමි.
- ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය
- ගරු මන්ත්‍රී ලෙනිකා දුශාන්ති මැතිතුමිය
- විශ්‍රාමලත් පාසල් ආචාර්ය වජිර වලල්ලාවිට මහතා
- විශ්‍රාමලත් ග්‍රාම නිලධාරී ආර්. කේ. ලැනරෝල් මහතා

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා පුස්තකාල උපදේශන කමිටුව සඳහා පහත මන්ත්‍රීවරුන්ගේ නම් යෝජනා කරන ලදී.

- ගරු මන්ත්‍රී මර්වින් ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී සමිත පුංචිහේවා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>**

2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් මහජන නියෝජිතයන් හා ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- ශ්‍රී ධර්මාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය පරේගම චන්ද්‍රාලෝක නා හිමි.
- ගරු මන්ත්‍රී ඉදුරුවගේ ජයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා
- ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය
- ගරු මන්ත්‍රී ලෙනිකා දූශාන්ති මැතිතුමිය
- විශ්‍රාමලත් පාසල් ආචාර්ය වජිර වලල්ලාවිට මහතා
- විශ්‍රාමලත් ග්‍රාම නිලධාරී ආර්. කේ. ලැනරෝල් මහතා
- ගරු මන්ත්‍රී මර්වින් ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා
- ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.8. 2026 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.9. අප සභාවේ කාර්යාල කාර්ය සහයක තනතුරේ රාජකාරී ආවරණ කටයුතු කරනු ලබන එම්. ඩබ්. කසුන් උදාර ගුණසේකර හා එම්. ඩබ්. අජිත් කුමාර මහවිතාන යන දෙදෙනාට සුදුසු නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.10. බෙන්තොට ප්‍රාදේශීය සභා නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සව කටයුතු වෙනුවෙන් හා ඊට සමගාමීව 2025.12.23 වන දින පවත්වනු ලබන රාත්‍රී පිරිත් පිංකම හා 2025.12.24 වන දින පවත්වනු ලබන

දහවල් දානමය කටයුතු වෙනුවෙන් රු. 408,000/- ක ඇස්තමේන්තුගත මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.11. අප සභාවේ අවුරුදු 05 කට ආසන්න කාලයක් ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරේ රාජකාරී ආවරණය කරනු ලබන වැඩ ක්ෂේත්‍ර කම්කරු යූ. කේ. ජනිතා චාමරී මහත්මිය ඉහත තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති බැවින් ද, එම තනතුරේ පුරප්පාඩුවක් පවතින බැවින් ද, එම මහත්මිය ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරට පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.12. බෙන්තොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ යෝජනා පරිදි සහා සම්මුතියක් මත මහ ඌරගහ ප්‍රදේශයේ ගැබිනි මවුවරුන්ගේ හා කුඩා දරුවන්ගේ සුභ සාධනය සලකා මාතෘ සායන ගොඩනැගිල්ල සභා අරමුදලින් අලුත්වැඩියා කරන ලදී. ඒ සඳහා ගිවිසුම්ගත කොන්ත්‍රාත් සමිතියට  බිල්පත් මුදලින් ගිවිසුම්ගත මුදල වන රු. 500,000/- ක මුදල ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේත් අනුමැතිය ලැබුණා. පළාත් පාලන කොමසාරිස්තුමියත් ඇහුවා ඇයි මේ තරම් පරක්කු වුණේ කියලා මේක ගෙවන්න. අපේ නිලධාරීන්ගේ යම් ගැටලුවක් තිබුණා. ඔවුන් හිතුවේ මේක නීත්‍යානුකූල නැතිවෙයි කියලා. නමුත් මේක ගෙවීම් කිරීමට පුලුවන්.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.13. කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරන ලද හොරවල තොටුපළ මාර්ගය දෙපස පස් දමා සංවර්ධනය කිරීම ඍජු ශ්‍රමික පදනම මත සභා අරමුදලින් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.12 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

මෙහි දී තාක්ෂණ සේවා නිලධාරී ආර්. ජේ. එස්. මාදුවාගොඩ මහතා විසින් හොරවල තොටුපළ මාර්ගය දෙපස සංවර්ධනය කිරීම සිදු කරන ආකාරය පිළිබඳ පැහැදිලි කරන ලදී.

- ගරු උප සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට කළ යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.14 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

5.2.14. පසුගිය දා ඇති වූ ආපදා සඳහා සහන සැලසීම වනුවෙන් රු. 732,000/- ක සංශෝධිත දළ වියදම් ඇස්තමේන්තුව පරිදි සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිරක රන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.15. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025.12.08 දිනට පවතින පහත පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම් සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

01. කාර්යාල කාර්ය සහයක - 01
02. මුරකරු - 01
03. සෞඛ්‍ය කම්කරු - 01
04. වැඩ ක්ෂේත්‍ර කම්කරු - 01
05. ඖෂධ සංයෝජක - 01
06. යන්ත්‍ර ක්‍රියාකරු - 01

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
පළාත් පාලන කොමසාරිස්තුමියගේ අනුමැතියට යටත්ව ඉහත තනතුරුවලට අදාළ බඳවාගැනීම් සිදු කිරීම සුදුසුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.16. දැනට අප සභාව තුළ සිටින ස්ථිර කම්කරුවන් ගණන ඉදිරි උත්සව සමය සමඟ දෛනික වැඩ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවන බැවින් දකුණු පළාත් අනුමත මිල ගණන් අනුව නුපුහුණු කම්කරුවකු සඳහා දිනකට රු. 2,900/- ක් වන මිල ගණන යටතේ කම්කරුවන් 08 දෙනෙකු බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.17. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/8/ප්‍රජා ජල හා 2025.12.09 දිනැතිව "දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - සංශෝධන" මැයෙන් යුතුව ඉදිරිපත් කර ඇති රුපියල් මිලියන 2 ක මුදලට අනුමත වී ඇති සිල්වර් ගාර්ඩ්න් ඉඩමෙහි පානීය ජල ව්‍යාපෘතිය කඩිනමින් සිදු කිරීම සුදුසු බවටත් ඒ සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. මිලියන 2 ක ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.18. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025/ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය යටතේ ප්‍රතිපාදන අනුමතව මේ වන විටත් වැඩ ආරම්භ කොට ඇති කොම්පෝසට් අංගනය සෑදීම (ගොඩනැගිල්ල/ ආරක්ෂිත වැට/ ගේබියන් බැම්ම) ව්‍යාපෘතිය සඳහා වන රු. 6,198,274.60 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව පිළිගැනීම හා ඒ අනුව නැවත ගිවිසුම්ගත කොන්ත්‍රාත් ආයතනය සමඟ සංශෝධිත ඇස්තමේන්තුවට අනුව ගිවිසුම් ගත වීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

බලි වල කසල කළමනාකරණය කරන ඉඩමේ බලි ඇලට මායිමට අපි මේ වෙන කොට ගේබියන් බැම්මක් බඳිනවා. ඒක දකුණු පළාත් ප්‍රධාන ඉංජිනේරුතුමා අධීක්ෂණය කරන්නේ. එතුමා දීපු උපදෙස් එක්ක ඇස්තමේන්තුවේ වෙනසක් වෙලා තියෙනවා. ඒ ඇස්තමේන්තුව පිළිගෙන ඒකට අනුව මේ වෙන කොට අපි ගිවිසුම්ගත වෙලා වැඩ කරගෙන යන එච්. එස්. කේ. බිල්ඩර්ස් ආයතනය සමඟ නැවත සංශෝධිත ගිවිසුමක් ඇති කරගෙන ඉදිරි කටයුතු කඩිනමින් කරගෙන යන එක සුදුසුයි කියලා ගරු සභාවට මම යෝජනා කරනවා. මොකද මේක අපි කරන්නේ අකුණු පළාත් සංවර්ධන සැලැස්මෙන් අපිට අනුමත වෙලා තියෙන ප්‍රතිපාදන වලින්. ඒ බිල්පත් මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් පුළුවන් ඉක්මනට ඉදිරිපත් කරන්න වෙනවා මුදල් ප්‍රතිපූර්ණය කරගන්න.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.19. කොම්පෝස්ට් අංගනය සෑදීම (ගොඩනැගිල්ල/ ආරක්ෂිත වැට/ ගේබියන් බැම්ම) ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය 2025.12.25 දින දක්වා දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

බලිවල ඉඩමේ ගේබියන් බැම්ම බඳින කොන්ත්‍රාත් ආයතනය වන එච්.එස්.කේ. බිල්ඩර්ස් ආයතනය ලියුමක් එවලා තියෙනවා ප්‍රදේශයේ පවතින අයහපත් කාලගුණ තත්ත්වය නිසා ගිවිසුම්ගත කාලය තුළ දී කර්මාන්තයේ වැඩ අවසන් කර ගන්න නොහැකී කියලා ගිවිසුම් කාලය දීර්ඝ කරලා දෙන්න කියලා. විශේෂයෙන් ම අපි දන්නවා පහුගිය නොවැම්බර් වල මුළු ලංකාවටම දිත්වා සුළි කුණාටුව හින්දා විශාල බලපෑමක් උනා. අපේ බල ප්‍රදේශෙට නායයෑම්, ලොකු ගංවතුර ඇවිල්ලා ජීවිත හානි උන් නැති උනාට අධික වර්ෂාවත් එක්ක සුළං තිබ්බා. ඒක නිසා බලි ඇලේ වතුර ප්‍රමාණේ වැඩිවෙලා තියෙනවා. වැස්සත් එක්ක ගස් කඩාගෙන වැටිලා ලයිට් කණු කඩාගෙන වැටිලා පාරවල් බ්ලොක් උනා. විශේෂෙන්ම අපේ සභාවේ කම්කරු මහත්තුරු ඒ පැවතිච්ච තත්ත්වෙ යථා තත්ත්වෙට ගේන්න ලොකු මහන්සියක් ගත්තා. ඒක මම මේ වෙලෙත් ඉතා කෘතවේදීව සිහිපත් කරනවා.

මේ ප්‍රොජෙක්ට් එක භාරව ඉන්න තාක්ෂණ සේවා නිලධාරිනිය කරුණු දක්වලා තියෙනවා ව්‍යාපෘතියේ කාලේ 2025.12.25 වෙනකන් දීර්ඝ කරන එක සුදුසුයි කියලා. මේ වැඩය සම්පූර්ණ කරනවා නම් කාලය දීර්ඝ කිරීම අවශ්‍යයි. පහුගිය කාලයේ කාලගුණය සමඟ වැඩ කිරීමට බැරි වූ නිසා.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>5.3. ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී නොමැති යෝජනා :-</u>**

5.3.1. ජනතාව විසින් සභාවට දැනුම් දෙන ප්‍රදේශයේ පවතින අනතුරුදායක තත්ත්වයේ ගස් පිළිබඳව සහ අනතුරුදායක වෙනත් තත්ත්ව/ දේපළ පිළිබඳ වහාම පියවර ගත යුතු බවට හා අනතුරුදායක ගස් පිළිබඳ සමීක්ෂණ මණ්ඩලයක් මඟින් සමීක්ෂණය කර ඒවා ඉවත් කිරීමට පියවර ගත යුතු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**

මේක ඇත්තටම ප්‍රබල ප්‍රශ්නයක්. අපි හැමදාම කරන්නේ ආපදාවක් වුණාම ඒකෙන් පස්සේ ගිහින් ගස් කපන එක. නමුත් අපි උනන්දු වෙලා නෑ ආපදාවට පෙර එම අනතුර ඉවත් කරන්න. ප්‍රදේශයේ පවතින අනතුරුදායක ගස් පිළිබඳව හා වෙනත් අනතුරුදායක දේපළ. මද්දෙවෙල ප්‍රදේශයේ තියෙනවා තාප්පයක්. කඩාගෙන වැටෙන්න පුළුවන්. ඒවා කඩන් වැටුණම අපි හැමදාම විස්සෝප වෙනවා. සභාවට බලය තියෙනවා ඕන දෙයක් කරන්න. ඒ ගස් කපන්නේ නැත්තම් අපිට පුළුවන් ගිහිල්ලා කපන්න. ඒ නිසා වහාම පියවර ගත යුතුයි මේකට. කාලයක් තිස්සේ ලියුම් ලිය ලිය හිටිය කියලා නෙවෙයි. මේ සම්බන්ධ සමීක්ෂණ මණ්ඩලයක් පත් කරන්න ඕනේ. ප්‍රාදේශීය සභා පනතේ 107(1)(2)(1) වගන්තියේ සඳහන් වෙනවා ඒ සම්බන්ධයෙන්. සභාවට බලතල තියෙනවා. අපි අපේ අනතුරුදායක ගස් ඉවත් කිරීමට ක්ෂණික

ක්‍රියාමාර්ගයක් කලින්ම අරගත්ත නම් කොට් ගානක් මෙතන පුළුං ගහ වැටිච්ච එක. සභාවත් වග කියන්න ඕන.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
ඇයි සභාව වග කියන්න ඕනෙ?

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
සභාවට ලියුමක් දීලා තිබුණා ගිය අවුරුද්දේ.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
ගිය අවුරුද්දේ ඒවා අපි දන්නේ නෑ.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
ගිය අවුරුද්දෙත් සභාව තිබුණනේ. ලියුමක් දීලා තිබුණා ඩික්සන් මහතා. මෙම ගහ අනතුරුදායකයි ඉවත් කරන්න කියලා. අපි සභාවෙන් ලියුමක් ගහලා තිබුණා සමුපකාරෙට මේ ගහ කපන්න කියලා. සමුපකාරෙට ඒකෙ අයිතිය නෑ.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
කාටද ඒ ගහ අයිති?

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
කාටවත් අයිති නෑ.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරක්න මැතිතුමා</u>
කාටවත් අයිති නැති වෙන්නේ නෑ. ඕක අයිති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මම කියන්නේ අපි ලියුම ගහලා නිකං ඉන්න එක නෙවෙයි. ඒක අපේ නෙවෙයි නම් වෙනත් ආයතනය මොකක් ද කියලා අපි මැදිහත් වෙන්න ඕනෙ. එහෙනම් අද කෝටි ගාණක් ඉතුරුයි. ලයිට් වයර් එකක්වත් කැඩෙන්නේ නෑ. ඒ වගේ ගස් ගොඩක් තියෙනවා බෙන්තර.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.2. ටෙලිකොම් රැහැන් හා විදුලි රැහැන් ආශ්‍රිත අනතුරුදායක ගස් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස එම ආයතනවලට දැනුම් දිය යුතු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා**

වෙනදා විදුලි බල මණ්ඩලේ ඒ අනතුරුදායක ගස් ඉවත් කිරීම සිදු කරා දැන් ඒක කරන්නේ නෑ. ඒ කටයුතු කරන ලෙස බලලා අපි සමීක්ෂණයක් කරලා ඒ ආයතනවලට ලිපියකින් දැනුම් දෙමු ඒවා ඉවත් කරන්න කියලා. ඉස්සර නම් විදුලි බල මණ්ඩලය රතෙන් ගහනවා කතිරයක්. දැන් ඒ මුකුත් නෑ.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.3. සභාවේ මන්ත්‍රීවරුන් හා සේවක පිරිස පසුගිය අයහපත් කාලගුණයෙන් විපතට පත් නුවර/ ගම්පොළ ප්‍රදේශයේ සිදුකළ සුවිසල් මෙහෙවර බෙහෙවින් අගය කර ඔවුනට ප්‍රණාමය පුද කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා**

මේ සඳහා මන්ත්‍රීවරු සේවකයෝ ගොඩක් මහන්සි වුණා. සේවකයෝ බෙහෙවින් මහන්සි වුණා. ඒ අයට මගේ ප්‍රණාමයත් සභාවේ ප්‍රණාමයත් මේ වෙලාවේ පුදකර සිටිනවා.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

මන්ත්‍රීතුමාගේ යෝජනාවට තව කොටසක් එකතු කරනවා. ඒ සඳහා සහභාගී වෙච්ච සියලුම සේවකයින්ගේ පුද්ගලික ලිපි ගොනුවට ප්‍රශංසා සහතිකය බැගින් ලබා දීමටත්, ඒ වගේම ඔවුන් වැඩ කළේ ඇත්තටම ඉරිදා සහ පෝය දිනවල. ඒ සඳහා රාජකාරී මට්ටමින් හා නීත්‍යානුකූල මට්ටමින් ඒ සඳහා අතිකාල දීමනා ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය**

ඉඳුරුවගේ මන්ත්‍රීතුමාගේ යෝජනාවට මං තව අදහසක් ඉදිරිපත් කරනවා. මීට සභාවාර දෙකකට තුනකට පෙර යෝජනාවක් දුන්නා මේ සභාවට අංගාගොඩ පෙර පාසලේ තියෙන බුළු ගහක් සම්බන්ධයෙන්. ඒක ළමයින්ගේ නිල ඇඳුම් ප්‍රදානයට ගිය වෙලාවේ අපි හැමෝම දැක්කා ඔබතුමත් සහභාගී වුණා. ඒකේ අතු දිරාපත් වෙලා තියෙනවා. මං හිතන්නේ වැසි කාලය පටන් ගන්න පෙර තමයි අපි යෝජනා කරේ මෙහෙම තියෙනවා. හරි අවධානම් මොකද පෙර පාසල් දරුවන්ගේ ක්‍රීඩා භූමිය තියෙන්නෙත් ඒ අසල නිසා. නමුත් මං හිතන්නේ ඊයේ පෙරේදා දිනයක මම සභාවේ ඉන්නකොටම ප්‍රභා මිස්ට ප්‍ර දේශවාසීන් විසින් නැවතත් ලියුමක් ගෙනල්ලා දුන්නා. බුළු ගහ අනාරක්ෂිතයි. මොක ද එතන වැඩිහිටි සමිතියත් පවත්වනවා. ගොඩක් ජනතාව ගැවසෙන තැනක්. මේ වන තුරුත් ඒ බුළු ගසේ අතු ඉවත් කර නෑ. මම ගරු ලේකම්තුමයගෙන් ඉල්ලා සිටිනවා මොකද පෙර පාසල් සම්බන්ධ ගැටලුවක් හින්දා. ඔබතුමයගේ අවධානය යොමු කරන්න. ව්‍යසනයක් වෙනකන් ඉන්න එපා ඒ ගසේ අනාරක්ෂිත අතු ඉවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

## 5.4. ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී නොමැති යෝජනා :-

5.4.1. සූරියගම ග්‍රාම නිලධාරී වසමේ සූරියගම ග්‍රාම නිලධාරී කාර්යාලයේ සිට සූරියගම රවුම් පාර කඳු බෑවුම් සහිත ස්ථාන 02 ක් හදිසි ආපදා තත්ත්වයේ ඇති වූ වර්ෂාව නිසා සේදී ගොස් තාර තට්ටුව ගැල වී ඇති අතර

එම මාර්ගයේ ගමන් කිරීම ඉතාම අපහසු තත්ත්වයක ඇත. එම මාර්ගයේ එම ස්ථාන 02 හැකි ඉක්මනින් පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
පහුගිය ආපදාවත් එක්ක හබුරුගල සූරියගම වසමේ සූරියගම වට රවුම් පාරේ කොටසක තාර තට්ටුවම ගැලවී ගිහින් තියෙනවා. එතනින් ගමන් බිමන් යන්න ඉතාම අපහසු තත්ත්වයක් තියෙන්නේ. මේක අපේ සේවකයෝ යොදලා හරි කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කරන්න.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>5.5. ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී නොමැති යෝජනා:-</u>**

5.5.1. 40 ඩී ඉහළ මාලවල ග්‍රාම නිලධාරී වසමේ නුගේඋඩුමුල්ල මංසංධියේ සිට කජුගස්දූව දෙසට ඇති මාර්ගයෙහි දැල්කඩ ප්‍රදේශයේ ස්ථානයක් වර්ෂාව ඇති වී දින කීපයක් යනතුරු පා ගමනින්වත් යා නොහැකි ලෙස ජලයෙන් යට වී පවතී. එම නිසා ABC ගල් කියුබ් කීපයක් එම ස්ථානයට දමා සභාවේ කම්කරු මහත්වරුන් කීප දෙනෙකු යොදවා පැති කාණුව පිළිසකර කරන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සමිත පුංචිහේවා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-</u>**

6.1. 2025.11.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව.

## <u>2025.11.07 දින පෙ.ව.9.00ට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි</u>.

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
4. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
5. ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

**ගෙවීම් නිර්දේශ කිරීම.**

පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 08 | දකුණු පළාත් සර්වේයර් ජනරාල්, ආදායම් රැස් කිරීමේ ගිණුම. | කොම්පෝස්ට් අංගනය සෑදීම ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිත බලිවල ඉඩම් මැනීම් කිරීමට අදාල ගාස්තු ගෙවීම. | 63,324.93 |
| 02 | 09 | එම්.එස්.ඩී.චන්දිම ප්‍රියංකර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 5,006.25 |
| 03 | 10 | කේ.අජිත් ජයරත්න | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 28,899.99 |
| 04 | 11 | ගාමිණී සමරවීරහෙට්ටි | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 19,250.00 |
| 05 | 12 | එච්.ඒ.සුනිල් | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 19,271.87 |
| 06 | 13 | මුදිත ධර්ම ගුණසේකර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 18,660.00 |
| 07 | 14 | ගාමිණී අබේවික්‍රම | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 15,337.49 |
| 08 | 15 | එම්.කේ.දර්ශන ප්‍රදීප් | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 10,333.33 |
| 09 | 16 | එම්.ඒ.අමල් | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 3,064.66 |
| 10 | 17 | ඩී.කේ.ඕ.කේ. රුවන් ප්‍රසන්න | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 9,958.33 |
| 11 | 18 | ඩී.එම්.පී.කේ.නානායක්කාර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 9,618.85 |
| 12 | 19 | චමින්ද අබේවික්‍රම | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 8,000.00 |
| 13 | 20 | එච්.එල්.වජිර රංජිත් | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 12,361.92 |
| 14 | 21 | කේ.දම්මික් | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 12,166.66 |
| 15 | 22 | එම්.ඩබ්.අජිත් කුමාර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 19,932.29 |
| 16 | 23 | කසුන් උදාර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 16,250.00 |
| 17 | 24 | එස්.කේ.ජානක | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 13,333.33 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | 25 | එල්.එච්.ලලිත් | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 4,566.74 |
| 19 | 26 | එම්.එස්.ගුණසේකර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 18,309.89 |
| 20 | 27 | කේ.ඒ.සනත් සුසන්ත | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 12,941.24 |
| 21 | 28 | යූ.කේ.නදීශා ආරියරත්න | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 7,231.24 |
| 22 | 29 | එම්.කේ.අමිල රුවන් කුමාර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 8,523.60 |
| 23 | 30 | එම්.නිලංක | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 13,416.66 |
| 24 | 31 | කේ.ඩී.කේ.රවී | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 4,626.41 |
| 25 | 32 | කේ.යූ.සාගර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 12,418.93 |
| 26 | 33 | කේ.ඒ.කෝසල | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 15,323.33 |
| 27 | 34 | කේ.දිමුතු ලසන්ත | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 7,248.00 |
| 28 | 35 | පී.ඩී.රුවන් කුමාර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 14,740.62 |
| 29 | 36 | ඩී.රාහුල ගුණරත්න | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 13,483.33 |
| 30 | 37 | කේ.දුමින්ද විජේරත්න | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 7,654.68 |
| 31 | 38 | බී.ජනක ජීවවර්ණ | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 14,260.00 |
| 32 | 39 | ඩී.පී.අයි.ප්‍රියංකර | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 4,723.62 |
| 33 | 40 | බී.නුවන් ධනුෂ්ක | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 1,008.00 |
| 34 | 41 | ගාමිණී සමරවීරහෙට්ටි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 2,100.00 |
| 35 | 42 | ඒ.පී.ජේ.සී.අබේසූරිය | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 සැප්තැම්බර් | 1,629.60 |
| 36 | 43 | කේ.අජිත් ජයරත්න | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 4,400.00 |

| | | | | |
|---|---|---|---|---|
| 37 | 44 | පී.ඩී.දීපා ප්‍රියංගනී | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 804.00 |
| 38 | 45 | බී.ජනක | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 1,550.00 |
| 39 | 46 | කසුන් උදාර | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 2,814.00 |
| 40 | 47 | එම්.එස්.ඩී.චන්දිම ප්‍රියංකර | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 840.00 |
| 41 | 48 | බී.නුවන් ධනුෂ්ක | පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 5,200.00 |
| 42 | 49 | කේ.ඩී.කේ.රවී | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 සැප්තැම්බර් | 4,939.99 |
| 43 | 50 | එම්.ඒ.සංජය ජයසිංහ | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 9,000.00 |
| 44 | 51 | කේ.ඩී.කේ.රවී | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 අගෝස්තු | 5,200.00 |
| 45 | 52 | කේ.ඩී.කේ.රවී | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 5,200.00 |
| 46 | 53 | මුදල් භාරකරු<br>කේ.ඩී.කේ.රවී | සභාව සතු තණකොළ කපන යන්ත්‍ර සැකසීම සඳහා අවශ්‍ය කොටස් මිලදී ගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම. | 4,800.00 |
| 47 | 54 | මුදල් භාරකරු<br>කසුන් උදාර | අවමඟුල් උත්සව සඳහා ප්‍රදර්ශනය කරන බැනරය දිරාපත් වී ඇති බැවින් නව බැනරයක් සකස් කිරීම සඳහා අතින් වියදම් වූ මුදල ලබාදීම. | 3,800.00 |
| 48 | 55 | මුදල් භාරකරු<br>ආර්.ජේ.එස්.මාදුවාගොඩ | නිවාඩු දින වැටුප් ගෙවීම. 2025/10/11, 2025/10/12, 2025/10/18, 2025/10/25, 2025/10/26 | 12,443.33 |
| 49 | 56 | මුදල් භාරකරු<br>කේ.ඩී.කේ.රවී | සභාවට අයත් තණකොළ කපන යන්ත්‍ර 03ක් අත්පිට මුදලින් අලුත්වැඩියා කරගැනීම වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම. | 3,500.00 |
| 50 | 57 | මුදල් භාරකරු<br>කේ.ඩබ්.ඩී.නෙරංජි මහේෂිකා | පෙර පාසල් දරුවන්ට අවශ්‍ය වන්නා වූ ඉගෙනුම් ආධාරක A3 ප්‍රමාණයට වර්ණ සහිතව මුද්‍රණය කර ලැමිනේට්න් කර නිම කිරීම සඳහා වැය වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 4,900.00 |
| 51 | 58 | මුදල් භාරකරු<br>කාර්යභාර නිලධාරි, ඉඳුරුව | ඉඳුරුව උප කාර්යාලයේ සුළු මුදල් අත්තිකාරම ප්‍රතිපූර්ණය කිරීම. | 6,430.00 |

| | | | | |
|---|---|---|---|---|
| 52 | 59 | මුදල් භාරකරු<br>කේ.යූ.සාගර | ප්‍රධාන කාර්යාල ජල ටැංකිය පළුදු වී ජලය කාන්දු වීම ෆයිඩර් කර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරිම. | 3,000.00 |
| 53 | 60 | මුදල් භාරකරු<br>පී.එච්.ටී.කේ. හේමචන්ද්‍ර | සාහිත්‍ය තරඟාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවය වෙනුවෙන් වියදම් දැරීම සඳහා 2025/10/30 දින වවුචර් අංක 162න් ලබාගත් අත්තිකාරම පියවීම. | 2,350.00<br>(70,000.00) |
| 54 | 61 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | පිට පළාත් මුද්දර ගාස්තුවලට අදාලව දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින්, 2023 වර්ෂයට අදාලව ලැබී ඇති මුදලින් 3% දීමනාව අදාල නිලධාරීන් හට ගෙවීම. | 108,870.00 |
| 55 | 62 | මුදල් භාරකරු<br>ප්‍රියන්ත ගුණතිලක | වැඩිපුර අය කරගෙන ඇති ණය වාරික ආපසු ගෙවීම. | 6,825.32 |
| 56 | 63 | මුදල් භාරකරු<br>කේ. උපුල් සාගර | වැඩිපුර අය කරගෙන ඇති ණය වාරික ආපසු ගෙවීම. | 2,064.68 |
| 57 | 64 | මුදල් භාරකරු<br>ඩී.වී.තරංගි | ජාතික කියවීමේ මාසය ත්‍යාග ප්‍රදානෝත්සවයේ සංග්‍රහ ඇතුළු සංවිධාන කටයුතු වෙනුවෙන් 2025/10/30 දින වවුචර් අංක 163න් ලබාගත් අත්තිකාරම පියවීම. | 325.00<br>(83,000.00) |
| 58 | 65 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | කසල වෙන් කිරීමේ කටයුතු සිදු කිරීම වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 66,000.00 |
| 59 | 69 | මහජන බැංකුවේ ඩී.වී.කසුනි ගයාත්‍රි ගි.අ. 084200110042 | 2025 ඔක්තෝම්බර් මස දීමනාව ගෙවීම. | 20,911.90 |
| 60 | 70 | ලංකා බැංකුවේ එම්.ඩී.පැතුම් තරංග අබේරත්න ගි.අ. 78441739 | 2025 ඔක්තෝම්බර් මස දීමනාව ගෙවීම. | 25,039.05 |
| 61 | 71 | ලංකා බැංකුවේ ඩබ්.කේ.අවිනි තරුෂිකා ගි.අ. 87113036 | 2025 ඔක්තෝම්බර් මස දීමනාව ගෙවීම. | 26,000.00 |
| 62 | 72 | සී/ස රෙසි ඊගල්ස් ආරක්ෂක සේවා (පුද්) සමාගම | 2025 ඔක්තෝම්බර් මස ආරක්ෂක සේවා ගාස්තු ගෙවීම. | 162,689.55 |
| 63 | 74 | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ඉඳුරුව උප කාර්යාලයේ ජල බිල්පත පියවීම. 2025.09.28 – 2025.10.28 | 3,034.99 |
| 64 | 75 | ලංකා විදුලි බල මණ්ඩලය | හබුරුගල උප කාර්යාලයේ විදුලි බිල්පත පියවීම. 2025.09.25 – 2025.10.26 | 3,333.33 |
| 65 | 77 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | අජිත් ජයරත්න, ආර්.වී.පී.දිනුෂා,ප්‍රභා මධුෂානි,ආර්.එස්. ගාල්ලෙආරච්චි යන නිලධාරීන් ලබාගත් නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සඳහා ගිය වියදම පියවීම. | 33,900.00 |

| | | | | |
|---|---|---|---|---|
| 66 | 78 | රාජිකා ක්‍රිශාන්ති විජේවර්ධන | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි මියගේ දීමනා ගෙවීම. 2025 ජූලි,අගෝස්තු,සැප්තැම්බර්,ඔක්තෝම්බර් | 54,258.00 |
| 67 | 81 | කග්ගොඩආරච්චි මෝටර්ස් | LL 7293 ජල බවුසරයේ වයිපර් ආම් 02හා වයිපර් බ්ලේඩ් 02 යොදා දොර සරනේරු 04 යොදා දොර ඇතුළත හැඩල්, දොර ලොක් සවි කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 64,200.00 |
| 68 | 82 | හැටන් නැෂනල් බැංකුවේ එස්.කේ.එන්. සේනාරත්න ගි.අ. 109010011010 | හැඩලය සහිත වීදුරු මග් 12 මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 5,760.00 |
| 69 | 83 | ලංකා බැංකුවේ ඩබ්.ජී.එල්. නිවන්තිකා ගි.අ. 84396196 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ප්‍රදාන ගෙවීම. | 66,070.12 |
| 70 | 85 | ජයසේකරගේ කරුණාදාස | බෙන්තොට මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5 kg ගෑස් සිලින්ඩර 05 ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම. | 82,960.00 |
| 71 | 86 | මුදල් භාරකරු<br>සී.අයි.ඩී.ඒ.වීරසේකර | 2025.10.21 දින පැවති මාසික මහ සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු සඳහා 2025.10.16 දින වවුචර් අංක 93 න් ලබාගත් අත්තිකාරම පියවීම. | (15,000.00) |
| 72 | 87 | මුදල් භාරකරු<br>මාලනී ගුණරත්න | 2025 වර්ෂයේ ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවති සාහිත්‍ය උත්සවයේ සංවිධාන කටයුතු සඳහා 2025.10.11 දින වවුචර් අංක 65 න් ලබාගත් අත්තිකාරම පියවීම. | (35,000.00) |
| 73 | 88 | මුදල් භාරකරු<br>ගෝවින්ද රාජ් ප්‍රකාශ් | ගෝනගල කඩකාමර අංක 02 සඳහා තැන්පත් කරන ලද මුදල කඩකාමර කුලිය සඳහා හිලව් කිරීම. | (20,000.00) |
| 74 | 89 | මුදල් භාරකරු<br>සී.අයි.ඩී.ඒ. වීරසේකර | 2025.11.18 දින පැවැත්වීමට නියමිත මාසික මහ සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් ලබා ගැනීම. | 15,000.00 |
| 75 | 90 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා 2025 ඔක්තෝම්බර් මස ඉන්ධන දීමනා ගෙවීම. | 54,000.00 |
| 76 | 91 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා 2025 ඔක්තෝම්බර් මස මන්ත්‍රී දීමනා ගෙවීම. | 198,700.00 |
| 77 | 92 | LC Printers & Advertising Private Limited | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩාංගනයට හා කසල අංගනයට පිවිසෙන ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම සඳහා 4’ X 3’ ප්‍රමාණයේ Flex බැනර | 3,900.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | 02ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | |
| 78 | 93 | LC Printers & Advertising Private Limited | 2025 වර්ෂයේ සාහිත්‍ය තරඟාවලියේ ජයග්‍රාහකයන් සඳහා මුද්‍රණය කරන ලද A4 ප්‍රමාණයේ සහතික පත්‍ර වෙනුවෙන් ගෙවීම් කිරීම. | 15,000.00 |
| 79 | 94 | LC Printers & Advertising Private Limited | 2025 වර්ෂයේ සාහිත්‍ය උත්සවයේ ආරාධිත අමුත්තන් සඳහා යැවීමට ආරාධනා පත්‍ර 120ක් හා සුදු පැහැති ලියුම් කවර 120ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 6960.00 |
| 80 | 95 | Welux Enterprises | Thumber Switch 10 A 200ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 40,600.00 |
| 81 | 96 | F.H. Tools Center | තණකොළ කපන මැෂින් සඳහා කැපුම් තල හා තංගුස් නූල් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 40,000.00 |
| 82 | 97 | Bank of Ceylon on Account of M.T.S.Buddika A/C 73624613 | 2025/10/31 දින පැවති සාහිත්‍ය උත්සවයේ ශබ්ද විකාශන යන්ත්‍ර කුලී පදනම මත ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 24,000.00 |
| 83 | 98 | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | 20W IP 65 (Dimo) බල්බ 500ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 675,000.00 |
| 84 | 99 | Athukorala Electricals (PVT) Ltd | 15L Mega Electricals බොයිලේරුවක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 29,000.00 |
| 85 | 100 | චාමර බුක්ෂොප් | ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පවත්වන ලද තරඟාවලියේ ත්‍යාග ලබාදීම සඳහා පිටු 120 CR පොත් 1100ක් මිලදීගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 170,500.00 |
| 86 | 101 | සී/ස විවිධ සේවා සමූපකාර සමිතිය,බේරුවල | ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.10.15 – 2025.10.28<br>(see vehicle table below) | 143,129.75 |

| වාහන අංකය | මුදල රු. |
|---|---|
| LD 8614 | 44,320.00 |
| PF 7388 | 37,395.00 |
| 252-6569 | 16,066.00 |
| JR 7724 | 2,413.75 |
| RD 6208 | 13,850.00 |
| RD 4484 | 9,695.00 |
| RE 9232 | 19,390.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | එකතුව 143,129.75 | |
| 87 | 102 | Orel Corporation (PVT) Ltd | 1/1.13mm Orange (100m) වයර් කොයිල් 25ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 125,924.75 |
| 88 | 103 | Orel Corporation (PVT) Ltd | 1/1.13mm Orange (100m) වයර් කොයිල් 25ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 125,924.75 |
| 89 | 104 | මහජන බැංකුවේ ඩබ්.කේ.වැලිකල ගි.අ. 19720033000 – 0087 | 2026 වර්ෂයේ බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමේ නිවේදන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ඉංග්‍රීසි හා දෙමළ භාෂාවෙන් පරිවර්තනය කර පරිගණකගත කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 30,277.50 |
| 90 | 105 | ගයාන් මල්ලියාවඩු | සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්වලින් 1% නොගෙවීම හේතුවෙන් පැවරූ නඩුවලින් නිශ්ප්‍රභ කරන නඩුවල පිටපත් වාර්තා ලබා ගැනීමට වැයවූ මුදල ගෙවීම. | 11,100.00 |
| 91 | 106 | ලංකා බැංකුවේ සම්පත් සිදත් ශ්‍රී කණහැරආරච්චි ගි.අ. 87743598 | LL 7293 ජල බවුසරයේ විදුලි පද්ධතියෙහි බල්බ්, ෆියුස්, රිලේ අළුතින් දැමීම හා පරිපථ නිසියාකාරව සැකසීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 12,000.00 |
| 92 | 107 | Infotec Office Automation | ආදායම් අංශය සඳහා LQ 310 Epson Ribbon ටෝනර් 01ක් මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 1,500.00 |
| 93 | 109 | ලංකා බැංකුවේ ජී.ඊ.කෞශල්‍යා ගි.අ. 91612625 | බෙන්තොට ප්‍රාදේශීය සභා මල්මඩුවාකන්ද පෙර පාසලේ දරු දැරියන් වෙනුවෙන් සැප්තැම්බර් මස දින 07ක් ආහාර ලබාදීම සඳහා දරන ලද මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 8,252.00 |
| 94 | L01 | ලංකා බැංකුවේ ටී.ජී.ජී.ලක්මාලි ගි.අ. 78339782 | ආපදා ණය ලබාදීම. | 255,705.00 |
| 95 | L02 | ලංකා බැංකුවේ එම්.කේ.ඒ.ආර්.කුමාර ගි.අ. 2831621 | ආපදා ණය ලබාදීම | 88,645.00 |

1. පිටු අංක 97 සිට 103 දක්වා වූ අංක 01 සිට 95 දක්වා වන වවුචර් පරීක්ෂා කොට අනුමැතිය සඳහා නිර්දේශ කරමු.

2. 2025/11/04 දිනැතිව "LD 8614 රථයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාවට අයත් LD 8614 රථයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා කොග්ගල ඩිපෝ ඉංජිනේරුවා ලබාදුන් 2025.09.15 වාර්තාව අනුව සභාවේ ලියාපදිංචි සසිඳු මෝටර්ස් ආයතනයෙන් රු.85,800.00ක අලුත්වැඩියා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර

ඇති අතර අදාළ ඇස්තමේන්තුවේ සඳහන් මිල ගණන් සාධාරණ බව ඩිපෝ ඉංජිනේරුවරයා දක්වා ඇති බැවින් අදාළ මිල ගණන් යටතේ රථය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව LD 8614 රථය රු.85,800.00ක මිල ගණන් යටතේ සසිඳු මෝටර්ස් ආයතනයෙන් අලුත්වැඩියා කරගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

3. 2025.11.07 දිනැතිව ගි/07 විෂය භාර නිලධාරි විසින් ගබඩාව සඳහා පහත ද්‍රව්‍ය ලබාදෙන ලෙස කර ඇති ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.
    - ආම්ශෙඩ් කට්ටල - 100
    - ගම් ටේප් - 50
    - ත්‍රෙඩ් හෝල්ඩර් - 500
    - වයර් කොයිල් - 75

4. 2025.11.06 දිනැතිව "අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සම්බන්ධවයි" යන මැයෙන් යුතුව අභ්‍යන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති 2025 වැය ලේඛනය හා අගෝස්තු වවුචර් ගොනුවට අදාළ අභ්‍යන්තර විගණන වාර්තාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

5. 2025.11.06 දිනැතිව "අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සම්බන්ධවයි" යන මැයෙන් යුතුව අභ්‍යන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති 2025 වර්ෂයට අදාළ සාමාන්‍ය අත්තිකාරම් ලේඛනය, වැය ලේඛනය, මුදල් පොත, හා අත්තිකාරම් ලබාගැනීම හා පියවීමට අදාළ වවුචර්පත් හා රිසිට්පත් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

6. 2025.11.07 දිනැතිව "සභාවට අයත් JR 7724 ත්‍රීරෝද රථයේ නියමිත වාර සේවාව හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව JR 7724 රථයේ නියමිත වාර සේවාව එළඹී ඇති බවත් රියදුරු විසින් දන්වා ඇති පරිදි එම ත්‍රීරෝද රථයේ අළුත්වැඩියා කටයුතු කිහිපයක් සිදු කිරීමට අවශ්‍ය වී ඇති බැවින් එම කටයුතු සභාවට ආසන්නයේ ඇති ගල්තුඩුව රෝහණ මෝටර්ස් මඟින් සිදු කරගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව උක්ත සඳහන් JR 7724 ත්‍රීරෝද රථයේ වාර සේවාව හා අළුත්වැඩියා කටයුතු ගල්තුඩුව රෝහණ මෝටර්ස් ආයතනයෙන් සිදු කරගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

7. 2025.10.24 හා 2025.10.30 දිනැතිව "2026 වර්ෂයට පාපැදි බලපත්‍ර සඳහා තහඩු ලබාගැනීම" යන මැයෙන් යුතුව ආදා/01, හබුරුගල කාර්යභාර නිලධාරි හා ඉඳුරුව කාර්යභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිවලට අනුව 2026 වර්ෂය සඳහා පාපැදි බලපත්‍ර තහඩු, පාපැදි නොවන ට්‍රයිසිකල් හා කරත්ත තහඩු ලබාදෙන ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව පාපැදි බලපත්‍ර තහඩු 100, පාපැදි නොවන ට්‍රයිසිකල් තහඩු 40 හා කරත්ත තහඩු 15ක් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

8. 2025.10.23 දිනැතිව "වීදි ලාම්පු නඩත්තු උපකරණ ලබා ගැනීම" යන මැයෙන් යුතුව විදුලි කාර්මික යූ.කේ.එන්.අයි.ආරියරත්න මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභා බල ප්‍රදේශයේ වීදි පහන් නඩත්තු කටයුතු සඳහා පහත සඳහන් උපකරණ ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත.
    - ආරක්ෂිත බඳ පටි - 02
    - පොදු අඩු(1100 -5000) - 03
    - බයින්ඩින් කම්බි - 50kg
    - 2.5mm/ දෙපට වයර් - 200m
    - 32 MCB - 12

- ❖ 2 Pole MCB Box - 12
- ❖ ඩිජිටල් ඇම්පියර් මීටර් - 01

ඒ අනුව ඉහත සඳහන් විදුලි උපාංග ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

9. 2025.10.23 දිනැතිව "කාර්යාලයේ රාජකාරි කටයුතු සඳහා පාපැදියක් ලබාගැනීම" යන මැයෙන් යුතුව ඉඳුරුව උප කාර්යාලයේ සේවය කරන ගාමිණී සමරවීරහෙට්ටි මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඉඳුරුව උප කාර්යාලයේ රාජකාරි කටයුතු සඳහා යොදා ගන්නා කාර්යාලයේ පාපැදිය පැද යා නොහැකි ලෙසින් දිරාපත් වී ඇති බැවින් නව පාපැදියක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ඉඳුරුව උප කාර්යාලයේ රාජකාරි කටයුතු කරගෙන යාම සඳහා නව පාපැදියක් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

10. 2025.11.06 දිනැතිව "ට්‍රැක්ටර් ටේලර් මිලදී ගැනීම" යන මැයෙන් යුතුව ගි/05 විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව බෙන්තොට ප්‍රාදේශීය සභාව සඳහා ට්‍රැක්ටර් ටේලර් රථ 02ක් මිලදීගැනීම සඳහා වන ලංසු ඇඟයීම් වාර්තාව දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා 2025.11.06 දින සභාව වෙත යොමුකර ඇති අතර අදාල වාර්තාව ප්‍රකාරව එක් ට්‍රේලරයක් රු.695,000.00 + VAT මුදලකට විමල් ඇග්‍රෝ ආයතනය වෙතින් මිලට ගැනීමට නිර්දේශ කර ඇති බැවින් ට්‍රේලර් රථ 02ක් මිලදීගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව උක්ත සඳහන් මිල ගණන් යටතේ විමල් ඇග්‍රෝ ආයතනය වෙතින් ට්‍රැක්ටර් ටේලර් රථ 02ක් මිලදීගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

11. 2025.11.07 දිනැතිව සං/02 විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව PF 7388 කැබ් රථයේ නියමිත වාර සේවාව එළඹී ඇති බව එහි රියදුරු විසින් දන්වා ඇති බවත් මෙම කැබ් රථයේ පූර්ණ සේවාව අවසන්වරට සිදුකර ඇත්තේ 2024.06.28 දින වන අතර මෙම කැබ් රථයේ පූර්ණ සේවාව සිදුකර 40,000km ඉක්මවා ධාවනය කර ඇති බැවින් වාර සේවාව හා පූර්ණ සේවාව බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි බේරුවල A.M. එන්ටර්ප්‍රයිසස් ආයතනය මඟින් සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව PF 7388 කැබ් රථයේ වාර සේවාව හා පූර්ණ සේවාව සභාවේ ලියාපදිංචි බේරුවල A.M. එන්ටර්ප්‍රයිසස් ආයතනය මඟින් සිදු කරගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

| | | |
|---|---|---|
| 1) ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා | - | ගරු සභාපති |
| 2) මිගාර වලල්ලාවිට මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 3) රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 4) නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 5) ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

2025.11.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.2. 2025.11.10 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව.

<u>2025/11/10 දින පෙ.ව. 9.00ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපතිතුමා
2. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ලෙනිකා දූශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. කේ.ඩී.මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

**1) <u>ආදායම් අංශය සඳහා අවශ්‍ය විනිග්‍රහ බලපත්‍රය මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/21 – 2025/11/10
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අවශ්‍ය ද්‍රව්‍ය අයිතමය පිළිබඳ විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | මුද්‍රණ මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | **Nimra Media House Aluthgama** | **Sri Vijaya Printers Aluthgama** | **LC printers & Adv pvt ltd Beruwala** |
| **හිඟ අදායම් රැස් කිරීම සඳහා විනිගග්‍ර බලපත්‍ර** | **05** | රු. 950/= | රු. 960/= | රු. 1700/= |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම ආයතන විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සලකා බැලූ කමිටුව අදාල මුද්‍රණ කටයුතු වෙනුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ අළුත්ගම,චමින්ද ගොඩනැගිල්ල, නො.212/B 2 Nimra Media House වෙතින් එක් පොතක් රු.950/= බැගින් පොත් 05ක් රු. 4750/= මිලකට මුද්‍රණය කරවා ගැනීමට ඒකමතිකව තීරණය කරන ලදි.

**2) <u>කාර්යාලය සඳහා අවශ්‍ය ටෝනර් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/21 – 2025/11/10
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **Infotec Office Automation No 68, Alubomulla Panadura** | **Jhon Keells Office Automation No 90 Union Place Colombo** | **Metro Stationery Dam Street, Colombo 12** | **Suncom Networks (pvt) ltd No 28 Dampitiya road Padukka** | **ANS Technolgies Pimburaththewa, polonnaruwa** | **E – NET office Automation Pvt (ltd) Wackwella road, Galle** |
| **151 A HP toner** | **05** | 16,000/-<br>Copy Yield – 3500<br>Delivery Free | - | 21,500 + VAT<br>Copy Yield – 3050<br>Delivery Free | 23,500/-<br>Copy Yield – 3050<br>Delivery Free | HP – 16500/-<br>Copy Yield 3500<br>Delivery Free<br>Starink – 9500<br>Copy Yield - 3500<br>Delivery Free | - |
| **T2323P Toshiba Toner** | **03** | 24,000/-<br>Copy Yield – 17,500<br>Delivery Free | 24,190/-<br>Copy Yield 17,500<br>Delivery Free | 17,000 + VAT<br>Copy Yield 17,500<br>Delivery Free | 14,500/-<br>Copy Yield 17,500<br>Delivery Free | 23,000/-<br>Copy Yield – 18,000<br>Delivery Free | 19,450+ VAT<br>Copy Yield – 17,500 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | Starink – 12000/- Copy Yield - 18000 Delivery Free | |

සභාවේ ලියාපදිංචි ආයතන 06ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. මිල ගණන් සලකා බැලූ කමිටුව 151 A HP toner සඳහා නියමිත පිරිවිතරයන්ට අනුකූලව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ පානදුර, අළුබෝමුල්ල පිහිටි Infotec office Automation ආයතනයෙන් එක් ටෝනරයක් රු.16,000/=ක මුදලකට ටෝනර 05ක් මිලදී ගැනීමටත්, T2323P Toshiba ටෝනරයක් සඳහා නියමිත පිරිවිතරයන්ට අනුකූලව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ පාදුක්ක,දම්පිටිය පාර,නො.28 Suncom Networks (PVT) Ltd ආයතනයෙන් ටෝනරයක් රු.14,500/=ක මුදලකට ටෝනර 03ක් මිලදීගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**3) <u>ඉඳුරුව උප කාර්යාලය සඳහා නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/21 – 2025/11/10

ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අවශ්‍ය අයිතම විස්තරය හා අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | |
|---|---|---|
| | **E net Office Automation (pvt), No 257c, Wackwella road, Galle** | **Sell - X Computers(pvt) ltd, 87/6, Hettigewatta, Kithulampitiya,Galle** |
| **ඇඟිලි සලකුණු යන්ත්‍ර 01** | ZKT ecoMB 640<br>84, 900+ vat<br>3 year Warranty<br>Delivery & Installation free | HK Vison DS- K1A802AMF<br>Unit price – 39,000/-<br>Installation charge – 5000/-<br>1 year Warranty |

සභාවේ ලියාපදිංචි ආයතන 02ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සලකා බැලූ කමිටුව අදාල මිල ගණන් අතරින් අවම මිල ඉදිරිපත් කර තිබූ ගාල්ල, කිතුලම්පිටිය, හෙට්ටිගෙවත්ත, නො. 87/6 Sell -x computers (PVT) Ltd ආයතනය වෙතින් වසරක වගකීමක් ලබාදී ඇති Hikvision DS – K1A802AMF වර්ගයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයක් රු.39,000/=ක මුදලකටත්, රු.5,000/=ක මුදලකට සවිකිරීමේ ගාස්තුවකට යටත්ව මිලදී ගැනීමටත් එම යන්ත්‍රය ප්‍රධාන කාර්යාලයට සවිකර දැනට ප්‍රධාන කාර්යාලයේ ඇති පැරණි යන්ත්‍රය ඉඳුරුව උප කාර්යාලයට සවිකිරීම සඳහා සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**4) <u>ගබඩාව සඳහා අවශ්‍ය අත් සේදුම් ද්‍රාවණ (Hand wash) මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/24 – 2025/11/10

ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|---|
| | | **Keson NO 183, Main Street, Ambalangoda** | **STC – Matara Station Road, Matara** | **Epic International (pvt)ltd Hadigama,Piliyandala** |

| | | | | |
|---|---|---|---|---|
| අත් පා සේදුම් ද්‍රාවන Hand Wash | 30L | 4L – 1350/-<br>30L – 10,125/-<br>(Ameera) | 4L – 2426.27<br>30L – 18,198/25<br>(Britol) | 4L – 2096+vat<br>30L - 15,720+vat<br>(Britol) |
| | | | | 4L – 1,180+vat<br>30L – 8,850+vat<br>(Arrow) |

සභාවේ ලියාපදිංචි ආයතන සහ ආසන්නයේ පිහිටි ආයතන 03ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සලකා බැලූ කමිටුව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ නො.183,මහ වීදිය,අම්බලන්ගොඩ ලිපිනයේ පිහිටි Keson ආයතනයේ Ammera වර්ගයේ,අත් සේදුම් ද්‍රාවණ 30L රු.10,125/= මිලදීගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**5) <u>ලිපිද්‍රව්‍ය මුද්‍රණ කටයුතු සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/24 – 2025/11/10
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අනු අංකය | ද්‍රව්‍ය හෝ භාණ්ඩ විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක් සඳහා මුද්‍රණ මිල ගණන් (රු.) | | | |
|---|---|---|---|---|---|---|
| | | | **Pulathisi Industries & Press Galle** | **Nimra Media House Aluthgama** | **Sri Vijaya Printers Aluthgama** | **LCprinters& Advertising Beruwal** |
| **1** | ලිපි ශිර්ෂ A4 ප්‍රමාණයේ (වර්ණ) | **5000** | 9.65 | 25/- | 6.25 | 7.2 |
| **2** | ලිපි ශිර්ෂ A4 ප්‍රමාණයේ (කලු සුදු) | **5000** | 5.79 | 8/- | 3.79 | 4.8 |
| **3** | ලිපි ශිර්ෂ A5 ප්‍රමාණයේ (කලු සුදු) | **1000** | 7.28 | 5/- | 4.75 | 6/- |
| **4** | ඖෂධ වට්ටෝරු පත්‍ර (A4 ප්‍රමාණයේ ඩුප්ලෝ කොලයේ තනි පැත්ත මුද්‍රිත) | **3500** | 3.85 | 5/- | 3.75 | 7/- |

සභාවේ ලියාපදිංචි ආයතන හා ආසන්නයේ පිහිටි ආයතන 04ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සලකා බැලූ කමිටුව අදාල මුද්‍රණ කටයුතු සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ අළුත්ගම,දුම්රියපොළ පාර Sri Vijaya Printers වෙතින් A4 වර්ණ ලිපි ශීර්ෂයක් රු.6.25 බැගින් 5000ක්, කළු සුදු ලිපි ශීර්ෂයක් රු.3.79 බැගින් 5000ක්, කළු සුදු A5 ලිපි ශීර්ෂයක් රු.4.75 බැගින් 1000ක් හා ඖෂධ වට්ටෝරු පත්‍රයක් රු.3.75 බැගින් කොළ 3500ක් මුද්‍රණය කරවා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**6) <u>ලියන මේස සහ ලිපිකරු පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/13 – 2025/11/10
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අවශ්‍ය ද්‍රව්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|---|
| | | **Keson Furniture Main street Ambalangoda** | **Dhmro Gallre Road,Aluthgama** | **Sri Lanka State Trading Coporation ltd Matara** |

| | | | | |
|---|---|---|---|---|
| දිග අඩි 5 පළල අඩි 2 අඟල් 6 ප්‍රමාණයේ ලාච්චු 2 සහිත ලියන මේස | 01 | Table - PKWT – 10 (167.5cm × 80cm ×76.5 cm) Piyestra<br><br>22,800.00<br><br>One year Warrenty<br>Delivery Free<br><br>Movable Pedestal Cupbourd PKM 01 (48cm×47.5cm×64cm) Piyestra<br><br>24,500.00<br>One year Warrenty<br>Delivery Free | Table – kwt022mo2 (152.4cm × 75cm ×75.3 cm) Piyestra<br><br>41,111.25<br><br>03 year Warrenty<br>Delivery Free | Table - PKWT – 10 (120cm × 60cm ×76.5 cm) Piyestra<br><br>18,445.00<br><br>One year Warrenty<br>Delivery Free |
| ඇඳි සහිත කැරකෙන පුටු **(low Back chair)** | 01 | ECL 01 (51cm×57cm×94cm lowest/105 cm Highest) Piyestra<br><br>20,575.00<br><br>One year Warrenty<br>Delivery Free | OCT009FBL Fabric Black (80kg)<br><br>18,216.25<br><br>02 year Warrenty<br>Delivery Free | ECL 02 (55cm×57cm×91cm lowest/102 cm Highest) Piyestra<br><br>18,445.00<br><br>One year Warrenty |

සභාවේ ලියාපදිංචි ආයතන හා ආසන්නයේ පිහිටි ආයතන 03ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඉදිරිපත් කර තිබූ පිරිවිතරයන්ට අනුකූලව (නියමිත පරිදි දිග පළල සහිත) මිල ගණන් ඉදිරිපත් කර තිබූ අම්බලන්ගොඩ,මහ වීදිය Keson Furniture වෙතින් වසරක වගකීමක් සහිතව Piyestra නිෂ්පාදිත මාදිලියේ PKWT 10 කේතයෙන් යුත් ලියන මේසයක් රු.22,800/=ක මුදලකටත්, ඒ සඳහා PKM 01 කේතය යුත් වසරක වගකීමක් සහිත Piyestra වර්ගයේ ලාච්චු සහිත කබඩ් 01 රු. 24,500/= ක මුදලකටත්, ECL01 කේතයෙන් යුත් වසරක වගකීමක් සහිත Piyestra වර්ගයේ ඇඳි සහිත කැරකෙන පුටුවක් රු.20,575/=ක මුදලකට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**7) <u>සභාව සතු කැනපේ හට් අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/09/10 – 2025/09/30
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අවශ්‍ය අයිතමය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|
| | රනහාරා එනටප්‍රයිස් 323/1,වෙලගහවත්ත, අළුබෝමුල්ල, පානදුර. | දේදුනු කුෂන් වර්ක්ස්, ගාලුපාර,කටුකුරුන්ද, කළුතර | ලියනගමගේ කුෂන් වර්ක්ස් මඩකුඹුරවත්ත, මහ ඌරගහ |

| | | | |
|---|---|---|---|
| **10'×10' ප්‍රමාණයේ කැනපි 08ක් සඳහා කැනපි රෙදි මසා නිමකොට ලබා ගැනීම** | 20,500/-<br>රෙදි වර්ගය - 1000/D<br>ප්‍රවාහන පහසුකම් සපයයි( ටැපටා පුල් කල වියනක් සමඟ) | 35,000/-<br>රෙදි වර්ගය - Oxford (no 7 qulity)<br>ප්‍රවාහන පහසුකම් සපයයි | 30,000/-<br>රෙදි වර්ගය - Oxford (no 1 qulity)<br>ප්‍රවාහන පහසුකම් සපයයි |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ලිපි සමඟ රෙදි සාම්පල ඉදිරිපත් කර තිබුනි. කමිටුව විසින් අදාල රෙදි සාම්පල පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒවායේ ගුණාත්මකභාවය අනුව පානදුර,අළුබෝමුල්ල,වෙලගහවත්ත,නො.323/1 රනහාරා එන්ට්‍රප්‍රයිස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති 1000/D වර්ගයේ රෙදි සාම්පලයේ ඉහල ගුණාත්මක භාවයක් ඇති බව නිරක්ෂණය විය. ඒ අනුව අදාල ආයතනය විසින් එක් කැනපියක් සඳහා ඉදිරිපත් කර ඇති රු.20,500/=ක මුදලකට කැනපි 06ක් මසා නිම කර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**8)** <u>ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/24 – 2025/11/10
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අනු අංකය | අවශ්‍ය ද්‍රව්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | Epic International pvt ltd Hadigama Piliyandada | | | STC, Railway St. road,Matara | | | Sunshine Stationers Dam Street Colombo 12 | | | Narah Computers Forms Galle Road Colombo 03 | | |
| | | | වර්ගය | ඒකක මිල රු. | මුළු වටිනාකම රු. | වර්ගය | ඒකක මිල රු. | මුළු වටිනාකම රු. | වර්ගය | ඒකක මිල රු. | මුළු වටිනාකම රු. | වර්ගය | ඒකක මිල රු. | මුළු වටිනාකම රු. |
| 1 | නිල් පෑන් | 450 | Atlas T | 17.00 | 7650.00 | Atlas T | 28.21 | 12694.50 | Atlas T | 16.20 | 7290.00 | - | 13.50 | 6075.00 |
| 2 | කලු පෑන් | 250 | Atlas T | 17.00 | 4250.00 | Atlas T | 20.17 | 5042.50 | Atlas T | 16.20 | 4050.00 | - | 13.50 | 3375.00 |
| 3 | පර්මනන්ට් මාර්කර් කලු | 10 | Gxin | 67.00 | 670.00 | Atlas | 106.65 | 1066.50 | Gxin | 67.00 | 670.00 | - | 76.00 | 760.00 |
| 4 | පර්මනන්ට් මාර්කර් නිල් | 10 | Gxin | 67.00 | 670.00 | Atlas | 106.65 | 1066.50 | Gxin | 67.00 | 670.00 | - | 76.00 | 760.00 |
| 5 | පැන්සල් | 30 | imported | 15.00 | 450.00 | Atlas | 34.12 | 1023.77 | Atlas | 29.00 | 870.00 | - | 20.00 | 600.00 |
| 6 | ස්ටිකිනෝට් කුඩා (5 colour) | 60 | MBM | 86.00 | 5160.00 | - | 170.00 | 10200.00 | Strips | 72.00 | 4,320.00 | - | 62.00 | 3720.00 |
| 7 | ස්ටිකිනෝට් ලොකු | 30 | MBM | 55.00 | 1650.00 | - | 95.00 | 2850.00 | 3”×3” | 59.00 | 1,770.00 | - | 45.00 | 1350.00 |
| 8 | හයිලයිට් කහ | 15 | Speed | 67.00 | 1005.00 | Atlas | 153.57 | 2303.55 | Firefly | 64.00 | 960.00 | - | 67.00 | 1005.00 |
| 9 | හයිලයිට් කොළ | 15 | Speed | 67.00 | 1005.00 | Atlas | 153.57 | 2303.55 | Firefly | 64.00 | 960.00 | - | 67.00 | 1005.00 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **10** | හයිලයිට් රෝස | **15** | Speed | 67.00 | 1005.00 | Atlas | 153.57 | 2303.55 | Firefly | 64.00 | 960.00 | - | 67.00 | 1005.00 |
| **11** | මකන | **30** | XDD | 12.00 | 360.00 | Atlas | 21.24 | 637.20 | Atlas | 18.00 | 540.00 | - | 10.00 | 300.00 |
| **12** | ෆීල්ඩ් නෝට් බුක්(රූල් රහිත) පිටු120 | **25** | Aloka | 114.00 | 2850.00 | Panther | 140.00 | 3500.00 | Prince | 87.00 | 2175.00 | - | 54.00 | 1350.00 |
| **13** | **Ink Bottel** | **8** | MBM | 79.00 | 632.00 | Panther | 105.02 | 840.16 | Horse | 85.00 | 680.00 | - | 90.00 | 720.00 |
| **14** | **A3** කොළ | **2000** | Eco | 3.90 | 7800.00 | JK | 5.50 | 11000.00 | N.k. | 4.50 | 9000.00 | - | 3.84 | 7680.00 |
| **15** | ලීගල් කොළ | **1500** | Eco | 2.70 | 4050.00 | Avalon | 5.50 | 8250.00 | N.K. | 3.00 | 4,500.00 | - | 2.62 | 3930.00 |
| **16** | ස්ටෙප්ලර් කටු පැකට් **(No:365)** | **30** | Gret way | 39.00 | 1170.00 | Atlas | 81.05 | 2431.50 | Kangaro | 72.00 | 2,160.00 | - | 32.00 | 960.00 |
| **17** | **Calculator(Casio-Mj 120D)** | **5** | Casio | 2395.00 | 11975.00 | Casio | 3985.00 | 19925.00 | Casio | 1960.00 | 9,800.00 | - | 2150.00 | 10750.00 |
| **18** | ලිපි ගොනු නූල් | **3500** | Valona | 2.80 | 9800.00 | Valona | 6.42 | 22470.00 | Vellona | 4.30 | 15,050.00 | - | 2.20 | 7700.00 |
| **19** | කාර්යාලයීය ගම් **500ml** | **5** | Sun | 160.00 | 800.00 | Jennifix | 224.00 | 1120.00 | Mariss | 165.00 | 825.00 | - | 145.00 | 725.00 |
| **20** | **9*4** ලියුම් කවර | **5000** | imported | 2.70 | 13500.00 | Manila | 3.75 | 18750.00 | Yellow | 2.29 | 11,450.00 | - | 2.55 | 12750.00 |
| **21** | බුල්ඩෝ ක්ලිප් | **20** | imported | 33.00 | 660.00 | - | - | - | Silver | 64.00 | 1,280.00 | - | - | - |

සභාවේ ලියාපදිංචි ආයතන 04ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් අතරින් සියළු අයිතමයන් සඳහා (අයිතම අංක 21 සඳහා මිල ගණන් ඉදිරිපත් කර නැත.) අවම මිල ගණන් කොළඹ, ගාලු පාර Narah Computers forms ආයතනයෙන් ඉදිරිපත් කර තිබූ නමුත් එම ආයතනය ඉදිරිපත් කරන ලද මිල ගණන්හි නිශ්පාදිත නාමයන් සඳහන් නොකර තිබීම හේතුවෙන් ඒවායේ ගුණාත්මකභාවය පැහැදිලිව හඳුනා ගැනීමට නොහැකි නිසා එම මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට කමිටුව තීරණය කරන ලදි. මීළඟට අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ කොළඹ 12,Dam Street "Sunshine Stationers" ආයතනය සියලු අයිතමයන් සඳහා පැහැදිලිව නිශ්පාදන නාමයන් සඳහන් කර තිබූ බැවින් සහ අයිතම 21 සඳහාම මිල ගණන් ඉදිරිපත් කර තිබූ බැවින් එම ආයතනය වෙතින් රු.79,980/- මුදලකට අදාල අයිතම 21 මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදි.

9) **<u>බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමේ - අදියර I ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම</u>**

සභා අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීම - අදියර I ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම සඳහා අංගාගොඩ සමෘද්ධි සමිතිය, අංගාගොඩ පිටාරඹ ජ්‍යෙෂ්ට පුරවැසි සමිතිය, යාත්‍රාමුල්ල ස්වශක්ති ප්‍රජා මණ්ඩලය විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපි, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/ වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍ර හා බැංකු ගිණුම්හි ඡායා පිටපත් ඉදිරි කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව යාත්‍රාමුල්ල ස්වශක්ති ප්‍රජා මණ්ඩලය මින් පෙර කර්මාන්ත සිදු කර නොමැති බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමේ - අදියර I ව්‍යාපෘතිය සඳහා අංගාගොඩ සමෘද්ධි සමිතිය (ඇස්තමේන්තුගත මුදල - රු.2,000,000.00) සමඟ ගිවිසුම්ගත වීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

10) **<u>ඔබඩවත්ත මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට අනුර වීරසිංහ මහතාගේ නිවස අසල සිට තුන්මන් හන්දියෙන් වමට හැරී සිංහරුපාගම කම්මල දක්වා ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම</u>**

සභා අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ඔබඩවත්ත සීක්‍රට් හාබර් රෙස්ටොරන්ට් ඉදිරිපිට ඇති ඔබඩවත්ත මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට අනුර වීරසිංහ මහතාගේ නිවස අසල සිට තුන්මන් හන්දියෙන් වමට හැරී සිංහරුපාගම කම්මල දක්වා ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම සඳහා සිංහරුපාගම ශක්ති වැඩිහිටි සමිතිය, සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය හා යාත්‍රාමුල්ල ස්වශක්ති ප්‍රජා මණ්ඩලය විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපි, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/ වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍ර හා බැංකු ගිණුම්හි ඡායා පිටපත් ඉදිරි කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව සමෘද්ධි ප්‍රජා මූල සමිතිය හා යාත්‍රාමුල්ල ස්වශක්ති ප්‍රජා මණ්ඩලය මින් පෙර කර්මාන්ත කර නොමැති අතර සිංහරුපාගම ශක්ති වැඩිහිටි සමිතිය මින් පෙර කර්මාන්ත සිදු කර ඇත.

සිංහරූපාගම ශක්ති වැඩිහිටි සමිතිය මේ වන විට රු.935,000.00ක් වන කර්මාන්තයක් සිදු කරන නමුත් උක්ත මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා වැය වන Civil Cost අගය වන රු.1,001,271.95ක මුදල සමඟ සමිතිය අතැති මුදල රු.2,000,000.00 ඉක්මවා නොයන බැවින් ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා සිංහරූපාගම ශක්ති වැඩිහිටි සමිතියට ලබා දීම සුදුසු බවට හා Civil Cost අගය වන රු.1,001,271.95ක මුදලට ගිවිසුම් ගතවීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**11)** **<u>බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමේ - අදියර II ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම</u>**

සභා අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීම - අදියර II ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම සඳහා අංගාගොඩ සමෘද්ධි සමිතිය, අංගාගොඩ පිටාරඹ ජ්‍යෙෂ්ට පුරවැසි සමිතිය, යාත්‍රාමුල්ල ස්වශක්ති ප්‍රජා මණ්ඩලය විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපි, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/ වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍ර හා බැංකු ගිණුම්හි ඡායා පිටපත් ඉදිරි කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව යාත්‍රාමුල්ල ස්වශක්ති ප්‍රජා මණ්ඩලය මින් පෙර කර්මාන්ත සිදු කර නොමැති බැවින් හා බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමේ - අදියර I ව්‍යාපෘතිය සඳහා අංගාගොඩ සමෘද්ධි සමිතිය තෝරා ගෙන ඇති බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමේ - අදියර II ව්‍යාපෘතිය සඳහා අංගාගොඩ පිටාරඹ ජ්‍යෙෂ්ට පුරවැසි සමිතිය සමඟ ගිවිසුම්ගත වීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. කේ.ඩී.මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.11.10 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.3. 2025.11.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව.

## 2025/11/11 දින ප.ව. 2.30ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපතිතුමා
2. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ලෙනිකා දූශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
4. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
5. කේ.ඩී.මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

**01. බෙන්තොට ප්‍රාදේශීය සභා, බෙන්තොට පොදු වෙළඳපොල සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර දිර්ඝ කාලීනව බදු දීම**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/10/21 – 2025/11/10
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

බෙන්තොට ප්‍රාදේශීය සභා, බෙන්තොට පොදු වෙළඳපොල සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර අංක 01,03,04 හා 05 දිර්ඝ කාලීනව බදු දීම සඳහා 2025.10.27 දින සිට 2025.11.10 දින ප.ව.03.00 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කළ අතර, 2025.11.11 දින ප.ව. 02.30 දක්වා භාරගත් ටෙන්ඩර් ප.ව. 02.30 වන විට විවෘත කිරීමෙන් පසු ප්‍රසම්පාදන මණ්ඩලය විසින් අත්සන් තබන ලදි. ඒ අනුව මුද්‍රා තබන ලද අයදුම්පත් 19ක් තිබුනි. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාව සඳහා ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් 06ක් සහභාගි විය.

| කඩ කාමර අංකය | ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුව | ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන ලියවිලි ගාස්තුව |
|---|---|---|
| 01,03,04 හ 05 | රු. 5,000/- | රු. 1,000/- |

**ඉදිරිපත් කර තිබූ අයදුම්පත් වලට අදාල විස්තර -**

| ටෙන්ඩර් කරන ලද කඩ කාමර අංක (වර්ග අඩි 216) | ටෙන්ඩර්කරුගේ නම සහ ජා.හැ.අංකය | ටෙන්ඩර්කරුගේ ලිපිනය හා දූරකතන අංකය | ලබාදෙන ලද එක්වන් මුදල(රු) |
|---|---|---|---|
| අංක 01 | ආර්.එම්.එස්.එන් බණ්ඩාර 199006203542 | 7/A අඹගහවත්ත,දෝපේ,බෙන්තොට 0710984232 | 1,830,000/- |
| | අයි.ඩී.කේ. ක්‍රිෂාන්ත 760620408V | ද අල්විස් මාවත,දෝපේ,බෙන්තොට 0776117935 | 1,250,000/- |
| | ඩබ්.එම්.සී.ආර්.එල්. දිසානායක 1994722902170 | 558/D අතුරුවැල්ල,ඉඳුරුව 0716345566 | 1,210,000/- |
| අංක 03 | අයි.කේ. සුරේකා නානායක්කාර 197768701567 | බෝධිනාගොඩ,දෝපේ 0768675922 | 1,855,000/- |

| | | | |
|---|---|---|---|
| | ආර්.එම්.එස්.එන් බණ්ඩාර 199006203542 | 7/A අඹගහවත්ත,දෝපේ,බෙන්තොට 0710984232 | 1,830,000/- |
| | වළාකුළුගේ දෝන ජීවන්ති අබේවික්‍රම 837016180V | නො 166A, සෙව්වන්දි,දෝපේ,බෙන්තොට | 1,555,000/- |
| | ඉන්දික අනුරාධ සේනාධීර පතිරණ 773302782v | පැලවත්ත පාර,දෝපේ.බෙන්තොට 0773350080 | 1,355,000/- |
| | වළාකුළුගේ දෝන තනුජා දුලාරි අබේවික්‍රම 197161401390 | 258/A බෝගහහන්දිය,දෝපේ බෙන්තොට 0775094807 | 1,300,000/- |
| | කේ.හර්ෂිකා උදේනි සිල්වා 848203548V | පරණ ගාලුපාර, අංගාගොඩ, බෙන්තොට 0772039860 | 1,260,600/- |
| අංක 04 | අයි.කේ. සුරේකා නානායක්කාර 197768701567 | බෝධිනාගොඩ,දෝපේ 0768675922 | 2,055,000/- |
| | පත්තිනි දේව නන්දන ජයලත් 762403226V | බෝධිමළුව,බෙන්තොට 0778117756 | 1,875,000/- |
| | ඩබ්.එම්.සී.ඊ.එල්. දිසානායක 1994722902170 | 558/D අතුරුවැල්ල,ඉඳුරුව 0716345566 | 18,300/- |
| | වළාකුළුගේ දෝන ජීවන්ති අබේවික්‍රම 837016180V | නො 166A, සෙව්වන්දි,දෝපේ,බෙන්තොට | 1,655,000/- |
| | ඉන්දික අනුරාධ සේනාධීර පතිරණ 773302782v | පැලවත්ත පාර,දෝපේ.බෙන්තොට 0773350080 | 1,455,000/- |
| | අයි.ඩී.කේ. ක්‍රිෂාන්ත 760620408V | ද අල්විස් මාවත,දෝපේ,බෙන්තොට 0776117935 | 1,350,000/- |
| | කේ.එම්. මධුරි චන්දිමාලා 198780401569 | සිංහරූපාගම,බෙන්තොට 0777903278 | 1,301,000/- |
| අංක 05 | අයි.කේ. සුරේකා නානායක්කාර 197768701567 | බෝධිනාගොඩ,දෝපේ 0768675922 | 2,055,000/- |
| | ඉන්දික අනුරාධ සේනාධීර පතිරණ 773302782v | පැලවත්ත පාර,දෝපේ.බෙන්තොට 0773350080 | 1,455,000/- |
| | වළාකුළුගේ දෝන ජීවන්ති අබේවික්‍රම 837016180V | නො 166A, සෙව්වන්දි,දෝපේ,බෙන්තොට | 1,201,000/- |

ටෙන්ඩර් කරන ලද කඩ කාමර සඳහා ඉල්ලුම්පත් 19ක් ඉදිරිපත් කර තිබුනි. ඒ අනුව, අංක 01 කඩ කාමරය සඳහා මිල ගණන් 03ක් ද, කඩ කාමර අංක 03 සඳහා මිල ගණන් 06ක් ද, කඩ කාමර අංක 04 සඳහා මිල ගණන් 07ක් ද, කඩ කාමර අංක 5 සඳහා මිල ගණන් 3ක් ද ඉදිරිපත් වී තිබුනි. ඒ අනුව,

**අංක 01 කඩ කාමරය** සඳහා වැඩිම එක්වන් මුදලක් ඉදිරිපත් කර තිබූ බෙන්තොට දෝපේ අඹගහවත්ත, නො. 07ඒ ලිපිනයේ පදිංචි ආර්.එම්.එස්.එන් බණ්ඩාර මහතා වෙත එම කඩ කමරය බදු දීමටත්, ඔහු විසින් එම කඩ කාමරය මිලදී ගැනීමට ඉදිරිපත් නොවන්නේ නම් නැවත එම කඩ කාමරය ටෙන්ඩර් කිරීමටත්, (පළමු ලංසු කරු ඉදිරිපත් කරන ලද ලංසු මුදලට සාපේක්ෂව දෙවන ලංසුකරු ඉදිරිපත් කර තිබූ ලංසු මුදල අවම අගයක් පැවතීම නිසා දෙවන ලංසුකරු වෙත කඩ කාමරය ලබාදීම සිදුකළ හොත් ඒ තුලින් රජයට මුල්‍යාමය වශයෙන් පාඩු සිදුවන බැවින්)

**අංක 03 කඩ කාමරය** සඳහා වැඩිම එක්වන් මුදලක් ඉදිරිපත් කර තිබූ බෙන්තොට දෝපේ, බෝධිනාගොඩ ලිපිනයේ පදිංචි අයි.කේ. සුරේකා නානායක්කාර මිය වෙතටත්, ඇය විසින් එම කඩ කාමරය මිලිදි ගැනීමට ඉදිරිපත් නොවන්නේ නම් දෙවනියට වැඩිම එක් වන මුදල ඉදිරිපත් කර තිබූ බෙන්තොට දෝපේ, අඹගහවත්ත, නො. 07ඒ ලිපිනයේ පදිංචි ආර්.එස්.එම්.එන් බණ්ඩාර යන අයත වෙත ලබාදීමටත්,

**අංක 04 කඩ කාමරය** සඳහා වැඩිම එක්වන ලංසු මුදල ඉදිරිපත් කර තිබූ බෙන්තොට දෝප්, බෝධිනාගොඩ ලිපිනයේ පදිංචි අයි.කේ. සුරේකා නානායක්කාර මිය වෙතටත්, ඇය විසින් එම කඩ කාමරය මිලදි ගැනීමට ඉදිරිපත් නොවන්නේ නම් දෙවනියට වැඩිමු එක්වන මුදල ඉදිරිපත් කර තිබූ බෙන්තොට බෝධිමළුව, පත්තිනිදේව නන්දන ජයලත් අයන අය වෙත ලබා දිමටත්,

**අංක 05 කඩ කාමරය** සඳහා වැඩිම එක්වන් මුදල ඉදිරිපත් කර තිබූ බෙන්තොට, දෝප්, බෝධිනාගොඩ ලිපිනයේ පදිංචි අයි.කේ. සුරේකා නානායක්කාර මිය වෙතටත්, ඇය විසින් එම කඩ කාමරය මිලදි ගැනීමට ඉදිරිපත් නොවන්නේ නම් නැවත එම කඩ කාමරය ටෙන්ඩර් කිරීමටත් (පළමු ලංසු කරු ඉදිරිපත් කරන ලද ලංසු මුදලට සාපේක්ෂව දෙවන ලංසුකරු ඉදිරිපත් කර තිබූ ලංසු මුදල අවම අගයක් පැවතීම නිසා දෙවන ලංසුකරු වෙත කඩ කාමරය ලබාදීම සිදුකළ හොත් ඒ තුලින් රජයට මුල්‍යාමය වශයෙන් පාඩු සිදුවන බැවින්) ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපතිතුමා
2. උඩේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
4. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
5. කේ.ඩී.මිගාර තේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.11.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයන් ඒකමතිකව සහා සම්මත විය.

6.4. 2025.11.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව.

## 2025.11.24 දින පෙ.ව.9.00ට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි.

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
4. ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

**ගෙවීම් නිර්දේශ කිරීම.**

පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 117 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | ස්ථිර වැටුප් ගෙවීම. 2025 නොවැම්බර් | 1,014,118.67 |
| 02 | 118 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | ස්ථිර වැටුප් ගෙවීම. 2025 නොවැම්බර් | 5,274,650.27 |
| 03 | | ලංකා විදුලිබල මණ්ඩලය | පියවර පෙර පාසලේ,කඩකාමර කොරිඩෝවේ විදුලි බිල්පත පියවීම. 2025.10.03-2025.11.03, 2025.09.29-2025.10.29 | 3,256.41 |
| 04 | | බෙන්තොට ප්‍රාදේශීය සභාව | ස්ථාවර තැන්පත් ගිණුම් ආරම්භ කිරීමට පොදු ගිණුමෙන් මුදල් මාරු කිරීම. | 15,000,000.00 |
| 05 | 130 | කාල් දමිත් වාද්දුවගේ | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තොම්බර් | 4,095.00 |
| 06 | | ජාතික සංවර්ධන බැංකුවේ කේ.ජී.එස්.කුමාරි ගි.අ. 106001488751 | ගෝනගල පොදු වෙළඳ සංකීර්ණයේ අංක 08 කඩකාමරය සඳහා තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් නිදහස් කිරීම. | 20,000.00 |
| 07 | 136 | මුදල් භාරකරු එම්.ඩී.එම්.දුලංජල | 2026 වර්ෂයේ තක්සේරු නිවේදන පත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය නිල මුද්‍රාවක් සකස්කර ගැනීම වෙනුවෙන් වියදම් වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 2,100.00 |
| 08 | 119 | ටී.ජී.සී.උදයංගනී | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 සැප්තැම්බර් | 500.52 |
| 09 | 132 | පී.ඩී.දීපා ප්‍රියංගනී කුමාරි | පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 සැප්තැම්බර් | 8,000.00 |
| 10 | 120 | ඩී.ප්‍රේමකුමාර විජේවර්ධන | ගමන් විමදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර්,නොවැම්බර් | 5,000.00 |

<table>
<tr><td>11</td><td>131</td><td>පී.ඩී.දීපා ප්‍රියංගනී කුමාරි</td><td>පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 අගෝස්තු</td><td>8,000.00</td></tr>
<tr><td>12</td><td></td><td>එච්.ඩී.මෙත්තානන්ද</td><td>හබුරුගල මහජන පුස්තකාලයට හා තුන්දූව කියවීම් ශාලාවට පුවත්පත් සැපයීම වෙනුවෙන් ගෙවීම. 2025 ඔක්තෝම්බර්</td><td>15,710.00</td></tr>
<tr><td>13</td><td></td><td>ලංකා විදුලිබල මණ්ඩලය</td><td>අංගාගොඩ පෙර පාසලේ විදුලි බිල පියවීම. 2025.10.07-2025.11.07</td><td>1,435.90</td></tr>
<tr><td>14</td><td></td><td>ලංකා විදුලිබල මණ්ඩලය</td><td>ප්‍රධාන කාර්යාලයේ,කාර්යාල පරිශ්‍රයේ විදුලි බිල පියවීම.<br>2025.09.30-2025.10.29,<br>2025.09.30-2025.10.30</td><td>15,493.34</td></tr>
<tr><td>15</td><td></td><td>ලංකා විදුලිබල මණ්ඩලය</td><td>වැඩ ඒකකයේ,බෙන්තොට මහජන පුස්තකාලයේ,දෝපේ පෙර පාසලේ විදුලි බිල පියවීම. 2025.09.30-2025.10.30,<br>2025.09.29-2025.10.29,2025.10.07-2025.11.04</td><td>2,589.75</td></tr>
<tr><td>16</td><td>137</td><td>මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව</td><td>කොම්පෝස්ට් අංගනය සෑදීම ව්‍යාපෘතියේ ලංසු ඇගයීම් කමිටුවේ සාමාජිකයින් සඳහා ගෙවීම් සිදුකිරීම.</td><td>17,000.00</td></tr>
<tr><td>17</td><td></td><td>ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී</td><td>ඉඳුරුව උපකාර්යාලයේ දුරකතන බිල පියවීම.2025.10.01-2025.10.31</td><td>2,833.32</td></tr>
<tr><td>18</td><td>121</td><td>එම්.කේ.වසන්තා ප්‍රියදර්ශනී</td><td>ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර්</td><td>2,352.00</td></tr>
<tr><td>19</td><td></td><td>ලංකා විදුලිබල මණ්ඩලය</td><td>ගෝනගල මහජන පුස්තකාලයේ විදුලි බිල පියවීම. 2025.09.14-2025.10.14</td><td>769.23</td></tr>
<tr><td>20</td><td>149</td><td>Hansagiri Petroleum (PVT) LTD</td><td>ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.09.24-2025.11.10
<table>
<tr><th>වාහන අංකය</th><th>මුදල රු.</th></tr>
<tr><td>JR 7724</td><td>21,203.00</td></tr>
<tr><td>252-6569</td><td>31,855.00</td></tr>
<tr><td>LD 8614</td><td>13,850.00</td></tr>
<tr><td>LL 7293</td><td>91,516.00</td></tr>
<tr><td>තණකොළ කපන මැෂිම</td><td>43,860.00</td></tr>
</table></td><td>224,341.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | | | ධූමායන යන්ත්‍ර(MOH) 7,334.00<br>QL 7145(MOH) 5,028.00<br>PB 0307 6,925.00<br>ජෙනරේටරය 2,770.00<br>**එකතුව** **224,341.00** | |
| 21 | 115 | මොබිටෙල් පුද්ගලික සමාගම | 071-7913428 දරණ දුරකතනයේ WIFI බිල්පත හා 071-4920312 දුරකතනයේ SMS බිල්පත පියවීම. 2025.09.25-2025.10.24 | 5,141.11 |
| 22 | | සතර පොත්හල | ගෝනගල මහජන පුස්තකාලයේ පුවත්පත් බිල පියවීම. 2025 ඔක්තෝම්බර් | 7,590.00 |
| 23 | 122 | ටී.ජී.ගීතිකා ලක්මාලි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 මැයි | 1,220.60 |
| 24 | 135 | ආර්.සී.ජයනාත් | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 7,110.83 |
| 25 | | Devram Construction | බලිවල කසල අංගනයේ ගොඩගැසී ඇති කසල, අංගනයේ කෙළවරට ගොස් තුනීකිරීම සඳහා කුලී පදනම මත JCB යන්ත්‍රයක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම. | 82,500.00 |
| 26 | 129 | එම්.ඩබ්.අජිත් කුමාර | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 440.00 |
| 27 | 124 | සුදර්මා ජයවර්ධන | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 අගෝස්තු, සැප්තැම්බර් | 3,492.00 |
| 28 | 125 | සුදර්මා ජයවර්ධන | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 4,500.00 |
| 29 | 128 | කේ.අජිත් ජයරත්න | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 4,000.00 |
| 30 | 150 | ජයසේකරගේ කරුණාදාස | බෙන්තොට මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5kg ගෑස් සිලින්ඩර 05 ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම. | 82,960.00 |
| 31 | | H.S.K. BUILDERS | කොම්පෝස්ට් අංගනය සෑදීම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගතව ඇති H.S.K. BUILDERS ආයතනය අප ආයතනයේ තබා ඇති ලංසු සුරක්ෂණය නිදහස් කිරීම. | 60,000.00 |

<table>
<tr><td>32</td><td></td><td>ලංකා විදුලිබල මණ්ඩලය</td><td>කනහින්තොට බිලුමවුන්ටන් ජලපොම්පාගාරයේ විදුලි බිල ගෙවීම. 2025.10.07-2025.11.07</td><td>743.59</td></tr>
<tr><td>33</td><td></td><td>සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,බේරුවල</td><td>ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.10.28-2025.10.31<br><table><tr><th>වාහන අංකය</th><th>මුදල රු.</th></tr><tr><td>PF 7388</td><td>15,235.00</td></tr><tr><td>252-6569</td><td>17,174.00</td></tr><tr><td>RD 4484</td><td>9,695.00</td></tr><tr><td>RD 6208</td><td>13,850.00</td></tr><tr><td>RE 9232</td><td>18,005.00</td></tr><tr><td>තණකොළ කපන මැෂිම</td><td>4,273.00</td></tr><tr><td>එකතුව</td><td>78,232.00</td></tr></table></td><td>78,232.00</td></tr>
<tr><td>34</td><td></td><td>එච්.ඩී.මෙත්තානන්ද</td><td>බෙන්තොට මහජන පුස්තකාලයේ පුවත්පත් බිල පියවීම. 2025 ඔක්තෝම්බර්</td><td>14,600.00</td></tr>
<tr><td>35</td><td></td><td>ලංකා බැංකුවේ බී.ඩී.කේ.මධුසංක ගි.අ. 4930277</td><td>JR 7724 ත්‍රීරෝද රථයේ සිදුකල වාර සේවාවේ බිල්පත ගෙවීම.</td><td>10,500.00</td></tr>
<tr><td>36</td><td></td><td>ලංකා බැංකුවේ සම්පත් සිදත් ශ්‍රී කණහැරආරච්චි ගි.අ. 87743598</td><td>LD 8614 දරණ කැබ් රථයේ තිරිංග පද්ධතිය අළුත්වැඩියාවේ බිල්පත පියවීම.</td><td>85,800.00</td></tr>
<tr><td>37</td><td>138</td><td>මුදල් භාරකරු<br>එම්.ඩබ්.අජිත්</td><td>ක්‍රීඩා සතියට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2025.08.19 දින පවත්වන ලද රාජ්‍ය නිලධාරීන්ගේ වොලිබෝල් තරඟාවලිය සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් අත්පිට මුදලින් වියදම් දරා කිරි පැකට් 100 ක් මිලදීගැනීම වෙනුවෙන් වියදම් ප්‍රතිපූර්ණය කිරීම.</td><td>8,750.00</td></tr>
<tr><td>38</td><td></td><td>Government Printer</td><td>ගබඩාව සඳහා පොදු 268 අ,35 අ හා පොදු 177 ආකෘති පත්‍ර මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.</td><td>26,697.50</td></tr>
<tr><td>39</td><td></td><td>ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී</td><td>034-2275419 දුරකතනයේ මාසික බිල්පත හා 034-2290646 දුරකතනයේ ෆැක්ස් බිල්පත ගෙවීම.<br>2025.10.01-2025.10.31</td><td>15,353.07</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 40 | | පෝස්ට් මාස්ටර් ජනරාල් 013-1001-99027346 | තැපැල් මුද්‍රා යන්ත්‍රයට මුද්දර පහසුකම් ඇතුළත් කිරීම. | 20,000.00 |
| 41 | | ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී | හබුරුගල උපකාර්යාලයේ දුරකතන බිල පියවීම. 2025.10.01-2025.10.31 | 2,769.31 |
| 42 | 151 | ජයසේකරගේ කරුණාදාස | බෙන්තොට මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5kg ගෑස් සිලින්ඩර 05 ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම. | 82,960.00 |
| 43 | 134 | ආර්.ජේ.එස්. මාදුවාගොඩ | පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 9,000.00 |
| 44 | | Local Loans and Development Fund | බෙන්තොට පොදු වෙළඳපළ සහිත දෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීම් ණය මුදලෙහි 2025 නොවැම්බර් මස වාරිකය හා පොළිය ස්ථාවර නියෝගයකින් ගෙවීම. | 229,408.36 |
| 45 | | මුදල් භාරකරු<br>සී.අයි.ඩී.ඒ.වීරසේකර | 2025.11.18 දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් 2025.11.17 දින වවුචර් අංක 89 න් ලබාගත් අත්තිකාරම පියවීම. | (15,000.00) |
| 46 | | මුදල් භාරකරු<br>සී.අයි.ඩී.ඒ.වීරසේකර | 2025 දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත මාසික මහ සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් ලබාගැනීම. | 15,000.00 |
| 47 | | Induwara Tyre House (PVT) LTD | LD 8614 දරණ කැබ් රථයේ දකුණු පස රෝදය පදම්කර පැච් එක දැමීමට අදාළ බිල්පත ගෙවීම. | 4,000.00 |
| 48 | 116 | Sri Vijaya Printers | මුද්‍රණය කරන ලද තක්සේරු නිවේදන 7000 සඳහා ගෙවීම් කිරීම. | 24,150.00 |
| 49 | | Local Loans and Development Fund | ගෝනගල පොදු වෙළඳපළ සහිත දෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීම් ණය මුදලෙහි 2025 නොවැම්බර් මස වාරිකය හා පොළිය ස්ථාවර නියෝගයකින් ගෙවීම. | 425,515.29 |
| 50 | 133 | පී.ඩී.දීපා ප්‍රියංගනී | පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 8,000.00 |
| 51 | 126 | ඒ.කේ.ටෙක්ලා නිරුෂානි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 448.00 |
| 52 | 127 | ඒ.කේ.ටෙක්ලා නිරුෂානි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 562.00 |
| 53 | 147 | නිව් ජයමාල් හාඩ්වෙයාර් | අංගාගොඩ පෙර පාසල සඳහා තීන්ත මිලදීගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 38,850.00 |

| | | | | |
|---|---|---|---|---|
| 54 | 123 | ඒ.පී.ජේ.සී.අබේසූරිය | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,116.00 |
| 55 | 139 | මුදල් භාරකරු<br>ආර්.එන්.ජී.ආරච්චි | දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ (එම්. ඒ. බන්දුල හරිස්චන්ද්‍ර) අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ප්‍රදර්ශනය කිරීමට මුද්‍රණය කළ 6*3 ප්‍රමාණයේ බැනරය නිර්මාණය කිරීමට අතින් වියදම් වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 2,260.00 |
| 56 | | හැටන් නැෂනල් බැංකුවේ ජී.ඩබ්.ආර්.ඒ. විතාන ගි.අ. 109010002031 | ගෝනගලපුර පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර අංක 02 බදු දීමේදී තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් ගාස්තු නිදහස් කිරීම. | 20,000.00 |
| 57 | | Suncom Networks (PVT) LTD | Toshiba Original Toner 03 සඳහා ගෙවීම් කිරීම. | 43,500.00 |
| 58 | | Infotec Office Automation | HP Toner 151 A ටෝනර් 05 සඳහා ගෙවීම් කිරීම. | 80,000.00 |
| 59 | 140 | මුදල් භාරකරු<br>ආර්.එස්.ගාල්ලෙආරච්චි | 2025.11.21 දින පැවැත්වූ III වන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටුවට සංග්‍රහ කිරීම සඳහා වැයවූ මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 5,050.00 |
| 60 | 146 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | සැලසුම් කමිටුවට සහභාගි වීම වෙනුවෙන් දීමනා ගෙවීම. 2025.10.30,2025.11.07,2025.11.14 | 56,250.00 |
| 61 | 141 | මුදල් භාරකරු<br>ඩී.ඩී.ආර්.එස්. වික්‍රමරත්න | RX 2064 ට්‍රැක්ටර් රථයේ ආදායම් බලපත්‍රය අළුත්කිරීමට දරණ ලද මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 2,100.00 |
| 62 | 142 | මුදල් භාරකරු<br>කාර්යභාර නිලධාරි,හබුරුගල | හබුරුගල උපකාර්යාලයේ ලිපි තැපැල් කිරීම සඳහා වියදම් වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 5,980.00 |
| 63 | | Keson | කාර්යාලය වෙත මිලදීගත් ලියන මේස,ලාච්චු කොටස,ඇදි සහිත කැරකෙන පුටුව හා කාර්යාල කබඩ් එකක් මිලදීගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 67,875.00 |
| 64 | 145 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | නුපුහුණු සේවකයින් සඳහා දෛනික වැටුප් ලබාදීම. | 58,000.00 |
| 65 | 144 | මුදල් භාරකරු<br>එම්.එම්.ජගත් | දේවාල පාර,හොරවල,හබුරුගල ලිපිනයේ පිහිටි අනතුරුදායක මහෝගනී ගස කපා බිම හෙළීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 25,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 66 | 143 | මුදල් භාරකරු<br>සී.අයි.ඩබ්.සිරිමාන්න | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව පරිගණක හැකියාව විමසන කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කරන නිලධාරීන්ට පුහුණු දීමනා ප්‍රතිපූර්ණය කිරීම. | 7,000.00 |
| 67 | 148 | නිව් ජයමාල් හාඩ්වෙයාර් | පෙන්ටෝච් බැටරි 20 ක් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 2,000.00 |
| 68 | | Keson | අත් සේදුම් ද්‍රාවණ 30 L මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 10,125.00 |
| 69 | | මුදල් භාරකරු<br>ඩබ්.එල්. නිශ්ශංක ද අල්විස් | වැඩිපුර අයවී ඇති ණය වාරික ආපසු ගෙවීම. | 8,600.00 |
| 70 | | සතර පොත්හල | ඉඳුරුව මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 14,530.00 |
| 71 | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ආදාහනාගාරයේ,දෝපේ පෙර පාසලේ ජල බිල පියවීම.<br>2025.10.01-2025.10.31<br>2025.10.11-2025.11.09 | 1,359.86 |

01. පිටු අංක 107 සිට 112 දක්වා වූ අංක 01 සිට 71 දක්වා වන වවුචර් පරීක්ෂා කොට අනුමැතිය සඳහා නිර්දේශ කරමු.

02. 2025.11.24 දිනැතිව ගි/07 විෂයභාර නිලධාරි විසින් ගබඩාව සඳහා පහත ද්‍රව්‍ය ලබාදෙන ලෙස කර ඇති ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

- කොමඩ් බ්‍රෂ් (ප්ලාස්ටික් කෙඳි සහිත) - 15
- විම් සබන් කැට - 10
- ප්ලාස්ටික් කොසු - 20
- මොප් - 10
- වයිපර් - 12
- කොහු සහිත කොසු - 12
- රබර් අත්වැසුම් යුගල - 150
- ගම් බූට් - 15
- ලයිසෝල් - 15
- හාපික් - 12

03. 2025.11.24 දිනැතිව ගි/07 විෂයභාර නිලධාරි විසින් ගබඩාව සඳහා පහත ද්‍රව්‍ය ලබාදෙන ලෙස කර ඇති ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

- ප්‍රා.ස 01 රිසිට් පත් (ආදායම් අංශය සඳහා) - 5000
- පොදු 232 පත්‍රිකා - 1000
- පොදු 185 පත්‍රිකා - 1000

- පොදු 278 පත්‍රිකා - 100
- පොදු 160 පත්‍රිකා - 100
- පොදු 53A පත්‍රිකා - 500
- පොදු 161 පත්‍රිකා - 500

04. 2025.11.21 දිනැතිව "RE 9232 ට්‍රැක්ටර් රථය සඳහා ටයර් හා රිම් මිලදී ගැනීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව RE 9232 ට්‍රැක්ටර් රථයේ ඉදිරිපස ටයර් යොදා පැය 1500 කට ආසන්න ප්‍රමාණයක් ධාවනය කර ඇති බැවින් අලුත් ටයර් ලබාදීමට හා දැනට ඇති රිම් දිරුම් සහිත තත්ත්වයට පත්ව ඇති බැවින් නව රිම් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව RE 9232 ට්‍රැක්ටර් රථය සඳහා ඉදිරිපස ටයර් හා රිම් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

05. 2025.11.21 දිනැතිව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව BPS/SO/HAB/02 Core is වර්ගයේ Desktop පරිගණකය අලුත්වැඩියා කිරීම සඳහා බෙන්තොට,දෝපේ,බෝගහවත්ත පිහිටි ISK's Digital ආයතනය වෙත යොමු කරන ලද අතර එම පරිගණකයේ සිදුකළ යුතු අලුත්වැඩියාවන් සඳහා රු.31,000.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර අදාළ ඇස්තමේනිතුව අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව උක්ත සඳහන් පරිගණකය රු.31,000.00 ක ඇස්තමේන්තුව යටතේ ISK's Digital ආයතනයෙන් අලුත්වැඩියා කරගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

06. 2025.11.21 දිනැතිව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව BPS/ACC/PC/05 Core is වර්ගයේ Desktop පරිගණකය අලුත්වැඩියා කිරීම සඳහා බෙන්තොට,දෝපේ,බෝගහවත්ත පිහිටි ISK's Digital ආයතනය වෙත යොමු කරන ලද අතර එම පරිගණකයේ සිදුකළ යුතු අලුත්වැඩියාවන් සඳහා රු.31,000.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර අදාළ ඇස්තමේනිතුව අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව උක්ත සඳහන් පරිගණකය රු.31,000.00 ක ඇස්තමේන්තුව යටතේ ISK's Digital ආයතනයෙන් අලුත්වැඩියා කරගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

07. 2025.11.21 දිනැතිව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව BPS/ACC/PC/03 Core is වර්ගයේ Desktop පරිගණකය අලුත්වැඩියා කිරීම සඳහා බෙන්තොට,දෝපේ,බෝගහවත්ත පිහිටි ISK's Digital ආයතනය වෙත යොමු කරන ලද අතර එම පරිගණකයේ සිදුකළ යුතු අලුත්වැඩියාවන් සඳහා රු.94,750.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර අදාළ ඇස්තමේනිතුව අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව උක්ත සඳහන් පරිගණකය මීට පෙර අවස්ථාවලදී ද අලුත්වැඩියා කර ඇති බැවින් හා පරණ පරිගණකයක් රු.94,750.00 ක ඇස්තමේන්තු මුදලකට අලුත්වැඩියා කිරීම සුදුසු කටයුත්තක් නොවන බැවින් නව පරිගණකයක් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

08. 2025.11.12 දිනැතිව "යාලෙගම මිරිස්වත්ත ප්‍රධාන මාර්ගයේ ගලගමට හැරෙන මාර්ගයේ සපත්තු කාණුවක් සකස් කිරීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව බෙන්තොට තාක්ෂණික නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උක්ත කාරණාව සඳහා පහත සඳහන් උපකරණ කුලී පදනම මත ලබාගැනීමට අවශ්‍ය බවත් ඒ සඳහා පහත සඳහන් කර ඇති මිල ගණන් අවශ්‍ය බවටත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව පහත සඳහන් උපකරණ කුලී පදනම මත ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

- ගයින්ඩර් 1*1 day *400.00 = 400.00
- කොන්ක්‍රීට් කපන යන්ත්‍රය තලය සමඟ 3 day*2,500.00 = 7,500.00
- හිල්ටි යන්ත්‍රයක් 1*3 day *3,000.00 = 9,000.00

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
4. ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.11.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබද වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-**

**7.1. 2025 නොවැම්බර් මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2025 නොවැම්බර් මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| 2025 නොවැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | 8,280,713.61 |
| එකතු කලා මූලධන ලැබීම් :- | 2,766,370.24 |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **11,047,083.85** |
| බලපත්‍ර බදු | 16,775.00 |
| සේවක ණය | 229,979.68 |
| තැන්පත් | 236,793.79 |
| දේපළ ණය පොළී | 14,528.31 |
| සාමාන්‍ය අත්තිකාරම් | 221,017.20 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | 3,075.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | 150,040.00 |
| 101 ට බැර | 101,936.59 |
| 201 ට බැර | 30,965.26 |
| 301 ට බැර | 34,640.78 |
| එකතුව | **12,086,835.46** |
| 2025 නොවැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | 10,654,386.62 |
| එකතු කලා -ප්‍රාග්ධන වියදම් | 512,698.64 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **11,167,085.26** |
| දේපළ ණය පොලී | 11,183,79 |

| | |
|---|---|
| තැන්පත් | 171,570.12 |
| ගඩඩා අත්තිකාරම් | 253,849.50 |
| සාමාන්‍ය අත්තිකාරම් | 24,447.20 |
| සේවක ණය | 353,240.00 |
| ස්ථාවර තැන්පත් | 15,000,000.00 |
| එකතුව | **26,981,375.87** |

2025 නොවැම්බර් මස ලැබීම් හා ගෙවීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>7.2. 2025. 11.30 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.11.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරණ පොදු ජංගම ගිණුම, අංක 81618288 දරණ සේවක ණය ගිණුම, අංක 2759057 දරණ කර්මාන්ත ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම බැංකු සැසඳුම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතකව සභා සම්මත විය.

**<u>7.3. 2025.11.30 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.11.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| `ආදායම් ශීර්ෂය | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | රු. 15,347,912.92 |
| 2. අක්කර බදු | රු. 190,449.00 |
| 3. 1 % බදු | රු. 1,000.00 |
| 4. කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. (500.00) |
| 5. වෙළඳ ස්ථාන කුළී | රු. 87,770.00 |
| එකතුව | රු. 15,626,631.92 |

2025 නොවැම්බර් මස බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා වසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**7.4. ගෙවීම් වවුචර් අනුමත කිරීම.**

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | | කුඩා උඍරගහ සමූපකාර ග්‍රාමීය බැංකුවේ ධර්ම විජය ග්‍රාම සංවර්ධන සමිති ගිණුම - 25352 | මහ උඍරගහ මාතෘ සායන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම (බිල්පතේ මුළු වටිනාකම රු. 506,105/- ක් වන අතර ගිවිසුම් ගත මුදල ලක්ෂ 500,000/- ක් පමණි) | 500,000.00 |
| 02 | | බෙන්තොට දිවි නැඟුම ප්‍රජා මූල බැංකුවේ ගි.අ. 02130059 | බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීම - අදියර I ව්‍යාපෘතියේ මෙතෙක් කරන ලද වැඩ කොස් සඳහා පළමු බිල්පත් මුදල ගෙවීම | 1,640,818.87 |
| 03 | | බෙන්තොට ලංකා බැංකුවේ ගි. අ. 72576318 | බෙන්තොට ප්‍රා දේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීම - අදියර II ව්‍යාපෘතියේ මෙතෙක් සිදු කර ඇති වැඩ කොටස් සඳහා පළමු බිල්පත් මුදල ගෙවීම | 1,556,627.62 |
| 04 | | බෙන්තොට සමූපකාර ග්‍රාමීය බැංකුවේ ගි.අ. 1025395-7 | ගල්බඩ ගම්මැද්ද මාර්ගය කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ ගිවිසුම්ගත කොන්ත්‍රාත් සමිතියට බිල්පත් ගෙවීම | 622,444.27 |
| 05 | | රංතොටුවිල ප්‍රජා මූල බැංකුවේ ගි.අ. 2257154 | රංතොටුවිල ඇවරියවත්ත වටරවුම් මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ ගෙවීම් සිදු කිරීම | 900,000.00 |
| 06 | | ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ගි.අ. 215011500002 | කයිකාවල, බණ්ඩාරිගොඩ හබක්කල මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ගෙවීම් සිදු කිරීම | 1,243,925.97 |

ඉහත ගෙවීම් වවුචර් ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය

**8. වෙනත් කරුණු**

**8.1. ටෙන්ඩර් හා මිල ගණන් :-** නැත

**8.2. <u>ඇස්තමේන්තු හා ගිවිසුම් සභාගත කිරීම</u> :-**

<u>ඇස්තමේන්තු අංක 01 :-</u>

ව්‍යාපෘතියේ නම :- දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය - නව වැඩ යටතේ නොදිරන අපද්‍රව්‍ය රැස් කිරීම හා කළමනාකරණය සිදු කරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන් කිරීම

මුදල :- රු. 1,132,086.01

<u>ඇස්තමේන්තු අංක 02 :-</u>

ව්‍යාපෘතියේ නම :- දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - සංශෝධන, කනහෙන්තොට ගම්සභා පාර පවත්නා ජල ටැංකියේ සිට ගම්වාසීන්ට ජලය ලබා දීම සඳහා නළ එළීම

මුදල :- රු. 800,000.00

<u>ඇස්තමේන්තු අංක 03 :-</u>

ව්‍යාපෘතියේ නම :- අතුරුවැල්ල පන්සල අසල හරස් පාර කොන්ක්‍රීට් කිරීම

මුදල :- රු. 311,182.94

<u>ඇස්තමේන්තු අංක 04 :-</u>

ව්‍යාපෘතියේ නම :- වියන්දූව පාර තාර දැමීම

මුදල :- රු. 350,000.00

<u>ඇස්තමේන්තු අංක 05 :-</u>

ව්‍යාපෘතියේ නම :- බෙන්තොට බලිවල ක්‍රීඩාංගනයට විදුලිය ලබා ගැනීමට අදාළව එම විදුලි පද්ධතිය ලබා ගැනීම සඳහා ස්ථානයක් සකස් කිරීම.

මුදල :- රු. 30,000.00

<u>ඇස්තමේන්තු අංක 06 :-</u>

ව්‍යාපෘතියේ නම :- ඉඳුරුව යාලේගම ප්‍රධාන මාර්ගයේ සිට පුංචිවේල්ල දක්වා තාර දැමීම

මුදල :- රු. 1,559,447.58

<u>ඇස්තමේන්තු අංක 07 :-</u>

ව්‍යාපෘතියේ නම :- කොම්පෝස්ට් අංගනය සෑදීම ( ගොඩනැගිල්ල/ ගේබියන් බැම්ම/ ආරක්ෂිත වැට) ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තුව

මුදල :- රු. 6,663,145.19

<u>ඇස්තමේන්තු අංක 08 :-</u>

ව්‍යාපෘතියේ නම :- කෝම්මල ඉඳිගහගොඩැල්ල පාර කොන්ක්‍රීට් කිරීම

මුදල :- රු. 558,622.80

<u>ඇස්තමේන්තු අංක 09 :-</u>
ව්‍යාපෘතියේ නම :- කනටිය වත්ත අතුරු පාර (කෝම්මල ප්‍රජා ශාලා මාවත) කොන්ක්‍රීට් කිරීම
මුදල :- රු. 150,632.81

<u>ඇස්තමේන්තු අංක 10 :-</u>
ව්‍යාපෘතියේ නම :- බෝධිමළුව පොල්වත්ත පාර කොන්ක්‍රීට් කිරීම
මුදල :- රු. 223,471.82

ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## 8.3. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම

<u>**ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය**</u>
අපි පහුගිය දවස්වල බෙන්තර සහ ගම්පොළ ආපදා කළමනාකරණ වැඩකටයුතු වෙනුවෙන් සහභාගී වුණා. අපි සියලු දෙනාටම දැවැන්ත සවියක් ලබා දුන්නා බෙන්තර ප්‍රාදේශීය සභාවේ සේවක මහතුන්. ඔවුන් තමන්ගේ ස්ව කැමැත්තෙන් කැපවීම් සිදු කරා. අපි අවසාන දවසේ ගම්පොළට සහභාගී වෙච්ච වෙලාවේ අපි දැක්කා ඒ ගම්පොළ ප්‍රදේශයට ඇතුල් වෙන්න බෑ. ඒ තරම් දුගඳ හමනවා. එහෙම වකවානුවක දවස් 5 ක් තිස්සේ ඔවුන් විසින් දැඩි වෙහෙස මහන්සියෙන් උදේ පාන්දර වැඩ පටන් ගත්තම මම නම් දැක්කෙ නෑ දැන් අපිට කෑම කන වෙලාව හරි දැන් 10ට තේක ඕනේ කියලා කොයිම වෙලාවකවත් කියනවා. යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කරන්න ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වුණු අපේ තාරක මහත්මයාගේ හිතවතුන් සහ විශේෂයෙන් අපේ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සියලුම සහෝදර අපේ සේවක මහතුන් සියලු දෙනාම සභාපතිතුමා කෑ ගහලා කන්න යං කියනකන් ඔවුන්ගේ රාජකාරියේ යෙදී සිටියා තමන්ගේ දෙයක් හැටියට සලකලා. ඒ වගේම බෙන්තර ප්‍රදේශයේ ආපදා තත්ත්වයත් එක්ක ගස් කඩන් වැටුණම ඒවා ඉවත් කරන කටයුතු අතරෙදි අපේ සේවක මහත්තුරු සෑහෙන්න දෝෂාරෝපණයකට ලක් වෙනවා සභාපතිතුමාගෙන් ඒ වැඩ කරනකොට. ඒ වගේම වර්ෂාවේ තෙමීගෙන ආහාර පාන ගැන හිතන්නේ නැතිව ඔවුන් වැඩ කරනවා. පුළුං ගහ වැටිච්ච වෙලාවේ ගහ කපලා ඉවත් කරලා ඒ පාරත් හේදුවා. ඉතිං එවැනි දැවැන්ත මෙහෙයුමක් සිදු කරන්න සහයෝගය ලබා දුන් බෙන්තර සභාවට අද ලංකාවෙම ප්‍රශංසාව ලැබෙනවා. ඒ සඳහා බෙන්තර ප්‍රාදේශීය සභාවේ සියලුම අපේ සේවක මහත්වරු සහ තාරක මන්ත්‍රීතුමාගේ ඉල්ලීම මත යන්ත්‍ර සූත්‍ර ආදියට ශ්‍රම දායකත්වය ලබා දීලා ප්‍රදේශයේ තරුණ ප්‍රජාව සහයෝගය දැක්වූවා. ඒ සියලු දෙනාටම බෙන්තර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමියක් හැටියට ප්‍රශංසාව සහ ස්තූතිය මේ අවස්ථාවේ පුද කරනවා.

<u>**ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා**</u>
මුලින්ම මම මේ අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කරනවා ආපදාවෙන් මියගිය අයට සහ මේ වෙලාවේ පීඩාවට පත්වෙලා ඉන්න සියලුම ජනතාව වෙනුවෙන්. ඒ කාලගුණ වාර්තාව අනුව කටයුතු කරපු නිසා අපේ ආපදාවන් අඩු වුණා. නමුත් අපේ ප්‍රදේශයෙත් යම් ප්‍රමාණයක ගස් කඩා වැටීම් තිබුණා. අපේ සභාපතිතුමා මැදිහත් වෙලා ඒ අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළා ඉන් අනතුරුව තමයි ඔවුන් තාරක මන්ත්‍රීතුමාගේ යන්ත්‍ර උපකරණ හා මිත්‍රයින්ගේ යන්ත්‍ර උකරණ අරගෙන ගිහිල්ලා ගම්පොළ ප්‍රදේශය සුද්ධ පවිත්‍ර කළේ. මං ඇත්තටම ඒකට ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම අද දින තමයි මේ අවුරුද්දේ අවසාන

සභාව. ඒ නිසා ඉදිරි 2026 වර්ෂය සියලු දෙනාට සුහම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

අපි පත්වෙලා ගෙවී ගිය මාස 06 ක කාලය අවසන් වන මේ වෙලාවේ ප්‍රදේශයේ මහ ජනතාව වෙනුවෙන් සේවයක් ඉටු කරන්නට ඒ වගේම මහ සභා රැස්වීමට පමණක් නොව අදාළ සියලුම කමිටුවලට සහභාගී වෙලා සහයෝගය ලබා දීලා, අපි සියලු දෙනාම මොන දේශපාලන පක්ෂයකින් ඡන්දය ඉල්ලුවත් ප්‍රදේශයේ මහ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කරන්නට ගෙවී ගිය මාස 06 ක කාලය තුළ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය ලබා දුන් සහයෝගයට මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. ලබන අවුරුද්දේ අයවැය සම්මත වෙච්ච වෙලාවේ ලබන අවුරුද්ද අවසානය වන විට මේ අයවැයට එහා ගිය සංවර්ධනයක් ඒ වගේම අපි බලාපොරොත්තු නොවූ ආදායමක් ලබා ගෙන ප්‍ර දේශයේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා ඔබතුමාලාගේ සහයෝගය ලබාගත හැකි බවට මම විශ්වාස කරනවා.

ලේකම්තුමිය, ගම්පොළ කටයුතු සඳහා යන්ත්‍ර උපකරණ ලබා දී සහයෝගය ලබා දුන් සියලු දෙනාටම මන්ත්‍රීවරුන්ගේ සහ බෙන්තර ප්‍රාදේශීය සභාවේ ස්තූතිය පළ කරලා ලිපියක් ඒ අයට යොමු කරන්න. අවශ්‍ය තොරතුරු තාරක මන්ත්‍රීතුමාගෙන් ලබා ගන්න.

ඒ වගේම අපි කණ්ඩායම් 02 ක් විදියට ගියා වුණත් අපි දැක්කා තමුන්නාන්සෙලාත් අවස්ථා දෙකක දී බෙන්තර ප්‍රාදේශීය සභාව විදියට නුවර ප්‍රදේශයේ විවිධ තැන්වල අදාළ සුද්ධ පවිත්‍ර කිරීම් කළා. ඒ කටයුතු සිදු කරලා බෙන්තර ප්‍රාදේශීය සභාවට ගෞරවයක් ගේන්න කටයුතු සිදු කිරීම වෙනුවෙන් ඔබතුමාලාට ස්තූතිවන්ත වෙනවා. සභාවක් විදියට ලබන වසරේ ජනවාරි පළමු වෙනිදායින් පටන් ගන්න අවුරුද්ද තුළ අපි සභාවේ කටයුතු එකමුතුව කරමුයි කියන කාරණාව නැවත මතක් කරනවා. මේ අවුරුද්දේ අවසාන මහ සභා රැස්වීමට සහභාගී වුණ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 22 දෙනාටම ස්තූතිවන්ත වෙමින් ලබන්නා වූ නව වසර දේශපාලනික වශයෙන් නෙවෙයි ඔබතුමාලාට පෞද්ගලික මට්ටමිනුත් ඔබේ දූවා දරුවන්ගේ ඇතුළු දරු පවුලේ සියලු දෙනාටම වාසනාවන්ත සුභදායී වසරක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරන ගමන් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත්, සමස්ථ බෙන්තොට බල ප්‍රදේශයේ සියලු දෙනාටත් සුභ නව වසරක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

## 8.4. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් අද දින සභාවට නොපැමිණි පහත මන්ත්‍රීවරුන් ඉදිරිපත් කර ඇති නිවාඩු ඉල්ලීම් ලිපි ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

01. ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය

ඉහත මන්ත්‍රීතුමාගේ අසනීප නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී සමිත පුංචිහේවා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-</u>**
"ගරු මන්ත්‍රීවරුනි, අද දිනට සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා, සහයෝගය ලබා දුන් ඔබ සැමට ස්තුතියි."

ප.ව. 12.46 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

.........................
ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව

**<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025 දෙසැම්බර් මස මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>**

**<u>සංශෝධන අංක 01 - ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන</u>**

පසුගිය සභා වාරයේ මා විසින් කල් නොදුන් යෝජනා යටතේ ඉදිරිපත් කළ 5.2.16 යෝජනාවේ සඳහන් "ඉදිරි උත්සව සමය සමඟ දෛනික වැඩ අවශ්‍යතා සඳහා" යන්න "ඉදිරි සංචාරක සමයේ කසල කළමනාකරණ කටයුතු හා දෛනික වැඩ අවශ්‍යතා සඳහා" ලෙස සංශෝධනය විය යුතුය.

.........................
ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව